# බුද්ධෝත්පාද දේශනාවල වටිනාකම

"මහණෙනි, මම පෙර නොඇසූ විරූ දහමක් දේශනා කරමි, " යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇතත් වර්තමාන සමාජයේ දේශනාවන්නේ එම පෙර නොඇසූ විරූ දහම නොව, සිදුහත් උපතට පෙර පවා තිබූ කර්මඵල වාදය, සිල් රැකීම්, සමථ භාවනා හා සමාධි. ආමිස පූජා මූලික කරගත්ත දහමකි. මෙලෙස පටිච්චසමුප්පාද දහම හා විදර්ශනා ධූරය වැළලී ගිය යුගයක වසර 2500කට පසු බෞද්ධ සමාජයට ගිලිහී ගිය ඒ සත්‍යය බුද්ධ දර්ශනය අති ගාම්භීරව නිර්මලව බුද්ධෝත්පාද දේශනා හරහා නැවත ලොවට දායාද වී ඇත.

උතුම් කල්‍යාණ මිත්‍ර බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ මේ දේශනා මගින් හෙළි කරන්නේ වසර 30ක භාවනා අත්දැකීම්, ප්‍රත්‍යක්ෂතාව හා අභිඥා ඥාන හරහා අවබෝධ කරගත් නිර්මල ප්‍රායෝගික නිවන් මගයි. එය මුළුමනින්ම මිත්‍යාදෘෂ්ඨියෙන් තොරයි. සිත සකස් වන ආකාරය දැක, එහි සත්‍ය දැක, ඉන් මිදෙන ආකාරය දැනගැනීමට හා අත්දැකීමට මේ දේශනා ඒකාන්තයෙන්ම උපකාරී වෙනවා.

කර්මය කර්ම ඵලය විශ්වාස කරමින් නිවන් දැකීමට පින් දහම් කළ යුතු පාරමිතා පිරිය යුතු බවත් මේ ජීවිතයේ නිවන් දැකිය නොහැකි බවත් යන දෘෂ්ටි වර්තමාන සමාජය වෙලාගෙන තියෙනවා. එවැනි දෘෂ්ටි බිඳ හෙළමින් මේ මොහොතේ නිවන අත්දකින ආකාරය බුද්ධෝත්පාද දේශනා පෙන්වා දෙනවා. ශ්‍රාවක ශ්‍රාවිකාවන් මේ දහම කොතරම් දුරට ප්‍රායෝගිකව අත්දකිනවාද යන්න Zoom සාකච්ඡාවල සම්බන්ධ වී සවන් දීමෙන් අවබෝධ කරගත හැකියි.

ඔබ සැබෑ බෞද්ධයකු වන්නේ කෙසේද, නිවැරදි තෙරුවන් සරණ යන ආකාරය, පින, කුසලය, අටමහා කුසල්, ශ්‍රද්ධාව, ප්‍රඥාව, සැබෑම භික්ෂුව කවුද යන කරුණු වල නිවැරදි විග්‍රහය වගේම තුන් කාලයකට දමා ඇති පටිච්චසමුප්පාද දහම, ත්‍රිවිද්‍යාව, තිස් එක් ලෝක ධාතුව හා සත්තිස් බෝධි පාක්ෂික ධර්ම මේ අරමුණ තුළම අත්දකින ආකාරය මේ අකාලික දහම තුළ ඉතා නිර්මලව මේ දේශනාවලින් පෙන්වා දෙනවා.

ප්‍රභාෂ්වර සිතක් ඇති තොටිල්ලේ සිටින දරුවෙකුට පවතින්නේ ඇසීම්, පෙනීම්, දැනීම් සමුදායක් පමණයි. ඒ දරුවා මොන්ටිසෝරි අවධියට පත්වන විට ඇසට පෙනුන වර්ණ හැඩතලයට, ශබ්ද ගන්ධ, රස, පහස එනම් දිට්ඨ සුත මුත එකතු වී මේ සිතුවිලි සම්මුති ලෝකය සෑදෙන ආකාරය හා එම අත්දැකීම ලබන්නේ "මමය" යන "දෘෂ්ටිය" සකස්වෙන ආකාරය මනාව පැහැදිලි කරන්නේ මේ දේශනා හරහා පමණි. ඔබ අනුසෝතයෙන් පටිසෝතයට ඒමට මේ සිතුවිලි ලෝකය මායාවක් බවත් මේ මොහොතේ මේ සිතත් සත්‍ය නොවන බවත් මෙතන ක්‍රියාවලියක් මිස සත්ව පුද්ගල ආත්මයක් නොමැති බවත් මේ දහම තුළ අවබෝධ කළ යුතු වෙනවා.

ඔබ සිතේ සත්‍යය දකින විට සිතේ දෙයක් නැති බව දැනෙන විට, කෙනෙක් නැති බව දැනෙන විට, අකාලික අනාත්ම දහම ඔබට ප්‍රත්‍යක්ෂවේ. සිතේ සත්‍ය දකින ආකාරය දේශනා හරහා හොඳින් පැහැදිලි වෙනවා. ග්‍රන්ථ ධූරය තුල ඇති අසූහාරදහසක ධර්මස්කන්ධය විදර්ශනා ධූරය තුළ එක් ක්ෂණයක එක අරමුණක දැකිය හැකි බව ලෝකයට විවර වන්නේ මේ දේශනා හරහා පමණි.

බුද්ධ දර්ශනය සම්බන්ධ ගැටලු විසඳා ගැනීම, ප්‍රායෝගික ප්‍රතිපාදාව සම්බන්ධ ගැටළු විසඳා ගැනීම, සූත්‍ර දේශනා සාකච්ඡා, ඉංග්‍රීසි Zoom සාකච්ඡා, ආන්දෝලනාත්මක ධර්ම සාකච්ඡා ආදී අරමුණු ඇතිව ගිහි පැවිදි දෙපාර්ශ්වයම උදෙසා ඉතා වටිනා Zoom සාකච්ඡා 8ක් දිනපතා පැවැත්වෙන අතර ඒවාට සම්බන්ධ වී ධර්ම ගැටලු විසඳා ගැනීමට සියලු දෙනාට අවස්ථාව ලැබී තියෙනවා. එමෙන්ම ධර්ම ග්‍රන්ථ, සඟරා හරහා මෙන්ම කර්ම TV හරහාත් Facebook, Youtube වැනි සමාජ මාධ්‍ය හරහාත් මේ දහම් පණිවිඩය ලොවට දායාද වෙනවා.

ආර්යයන් වහන්සේ විසින්ම සකස් කළ දින 07ක ප්‍රායෝගික ප්‍රතිපදා පුහුණුව නිවසේ සිට මෙන්ම මෙත්මල් ආරාමවලට පැමිණ පුහුණු විය හැකිය. සිතින් මිදෙන මග පහසු කටයුත්තක් නොවන නිසා එය පහසු කිරීමේ අරමුණින් ඉතා ක්‍රමානුකූලව මෙම නිවන් දකින වැඩපිළිවෙළ ප්‍රතිපදාව සකසා තිබෙනවා.

සියවස් ගණනකට පසුව නැවතත් මේ ඇරඹී තිබෙන්නේ බුද්ධෝත්පාද කාලයයි. ඔබට සසර දුකට නොවැටී සිටීමට ඇති එකම මග මෙයයි. බුද්ධෝත්පාද දේශනා හරහා ඔබට සවන් වැකෙන්නේ සාංදිට්ඨික, අකාලික, ඒහිපස්සික, ඕපනයික, පච්චුප්පන්න දහමයි.

අඳුරු වළාකුළු අතරින් රිදී රේඛාවක් සේ මේ සත්‍ය ධර්මය ඉස්මතු වූ යුගයේ බුද්ධෝත්පාදෝ නම් වූ සුවඳ පියුම ලොව පුරා විහිදුවන්නේ ඒ උතුම් බුදු සුවඳමයි. ඒ සදහම් අමා වැස්සට තෙමී සසර දුක් නිවාලා මේ ආත්ම භවයේදීම නිවන් අවබෝධ කරගැනීමට ආරාධනා කරමු. බුද්ධෝත්පාද කාලය තුළ ලද දුර්ලභ මනුෂ්‍ය ජීවිතයක් අර්ථවත් කරගනිමු.

තෙරුවන් සරණයි!

වින්ධ්‍යා කරුණාතිලක

# බුද්ධ දර්ශනය සත්‍යය-විද්‍යාව

මීට අවුරුදු 2500 කට පමණ පෙරදී ඇදහිලි, ප්‍රාර්ථනා, යාතිකා හා සමථ භාවනා මුල්බැහැගත් සමාජයක සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව විද්‍යාමාන විය. මෙතෙක් පහල වූ ශ්‍රේෂ්ඨතම විද්‍යාඥයා වූ උන්වහන්සේ මෙලොව පමණක් නොව එලොව ද ඇතැඹුල සේ දැක දෙලොවම ජය ගත් සේක. බුදුරජාණන් වහන්සේ සියළු සත්ත්වයෝ කෙරෙහි අනුකම්පාවෙන් බුද්ධ ස්වභාවයට පත්වන ආකාරය දේශනා කලෙහිය. එම ස්වභාවය අවුරුදු පන්දහසක කාලය තුල විද්‍යාමාන වන බව අප අසා තිබේ. ශ්‍රී ලංකාව බුදු දහම නිරතුරුව ඇසෙන රටකි. අප කලක් ඇසුවේ නිවන මරණින් පසු ලබන යමක් බවය.

බුදුරජානන් වහන්සේගේ දේශනා කල ධර්මය ඔබ සවනට වැකුනාද? ඔබට පටිච්චසමුප්පාද ධර්මය වැටහුනාද? ඔබට මොහොතකට හෝ නිවන දැනුනාද? ඔබ බුද්ධ ශ්‍රාවකයෙක් ද? යාතිකා කිරීමෙන්, නිවන ප්‍රාර්ථනා කිරීමෙන් ආමිස පූජා කල පමණින්ම නිවන හමු වූයේ ද? ලියා සටහන් කල ඇති ධර්මය කටපාඩම් කල පමණින්, දේශනා කල පමණින් නිවනට පත් විය හැකි ද? දහසක් පැන මැද ඔබ අතරමං වූවාද?

කල්‍යාණ මිත්‍රයාගේ සත්‍ය ධර්මය අසා දැනගත් ඔබ නිවන් මගට අනුගත වූවා යැයි පරීක්ෂා කළ හැක්කේ කෙනෙකුගේ රාග, ද්වේශ, මෝහ අඩුවන ආකාරයට පමණි. බුදු දහම පවසන සත්‍යය චතුරාර්‍ය සත්‍යය ලෙස අප අසා ඇත. ඔබට දැනුනා ද? දුකට හේතුව ඔබට වැටහුනා ද? නිරෝධය ඔබට ප්‍රත්‍යක්ෂ ද? දුක්ඛ නිරෝධ ගාමිනි මාර්ගය ඔබ විනිවිද දැක්කා ද?

ධර්මය දකින්නා බුදුන් දකී. පටිච්ච සමුප්පාදය විමර්ශනය, නිරීක්ෂනය හා විදගෙන යන නුවණින් කල්‍යාණ මිත්‍රයාගෙන් අසා දැනගත් සත්‍ය ධර්මය දකින්නා නිවන මොහොතකට අත් දකී. ප්‍රතිපදාව තුල ධර්මය දකින්නා නිවනට පත්වේ.

සත්‍යය නොදන්නා සසර නැමැති සැඩ පහරට හසුව අතරමං වී යයි. සත්‍යය ඇසෙන කාලයක මෙලොව විද්‍යාමාන වන සිතකට ලැබෙන ප්‍රබලතම භාග්‍යය මේ සත්‍යය ධර්මය අවබෝධ කිරීමයි.

බාහිරින් ගෙන යමක් කඩා බිඳ වැටෙන ස්වභාවය දැක ඒ පිළිබඳව කලකිරෙන්නා හට විඤ්ඤාන මායාව වටහාගැනීම අසීරු වේ. නිවන නොදන්නා සසර ද නොදනී. නිවන දන්නා සසරද දනී.

බුදුරජාණන් වහන්සේගේ ධර්මය සත්‍යයක් වන්නේ මිනිස් සිතකට පමණක් නොවේ. තිස් එක් ලෝක තලයේ ඇති සියළුම සිත් වලට මෙම ධර්මය සාධාරණ වේ. නමුත් මිනිස් සිතකට ඇත්තේ පුදුමාකාර හැකියාවකි. මිනිස් සිතකට මේ තිස් එක් ලෝක තලයටම සුසර වීමේ හැකියාව ඇත. විවෘත මනසකින් මේ දෙස බැලීමටත් ධර්මය වටහා ගැනීමටත් ඉවහල් වන්නේද ඉතා කලාතුරකින් ලැබෙන මේ මිනිස් සිතයි. ඔබ මේ කලාතුරකින් ලැබෙන මිනිස් සිතක් ඇත්තෙකි. මූලික ආයතන පහකින් මේ සිත් හට ගන්නා අතර එක් ක්ෂණයකදී පවතින්නේ එක් සිතක් පමණි. මේ යම් පද්ධතියක හටගන්නා සිත අවිද්‍යාව නිසා (සත්‍යය නොදන්නා නිසා) දෙයක් වීම නිසා කෙලෙස් හට ගනී. කෙලෙස් යනු රාග, ද්වේෂ මෝහ වේ.

කෙලෙස් යනු ස්කන්ධ උපාදාන ස්කන්ධයයි. ස්කන්ධය තුල කෙලෙස් නැත. සියලු සිතිවිලි අකුසල් වේ. කෙලෙස් වලට අකුසලයට හේතු වූ මනස හටගත්තේ කෙලෙසද කියා නොදන්නා බව අවිද්‍යාවයි.

කලලයකට ජීවය විද්‍යාමාන වීමට නම් යම් කම්පනයක් අනුනාද විය යුතුය. මේ කම්පනයක් අනුනාද නොවූ කලලයක් මව් කුස තුළට අජීවී ලෙස විද්‍යාමාන වේ. මේ අනුනාදය තුලින් බලගැන්වෙන කලලය තුල ඇස, කන, නාසය, දිව, ශරීරය මන යන ආයතන බල ගැන්වේ. මෙම අනුනාද වීමට හොඳම උදාහරණය යම් පරිපථයක් තුල කම්පනයට සිරස, දෙරණ, හිරු වැනි රූපවාහිනී නාලිකා සුසර වීම තුලින් එම පරිපථය තුලත් මේ නාලිකා පන ගැන්වීමයි. මිනිස් කලලයක කම්පනයද එවැනි පරිපථයක් ලෙස ක්‍රියා කරන අතර එහි කම්පනයට අනුනාද වන යම් කම්පනයක් තුලින් එම කලලයේ බල ගැන්වීම සිදු වේ. මෙම මිනිස් සිතක ආරම්භය ඉතා විරල බව බුදුරජාණන් වහන්සේ මැනවින් දේශනා කර ඇත. කලලයේ වර්ධනය සිදුවීමට බලපාන කරුණු බොහෝ ඇත. පෝෂණය, ජාන ස්වභාවය හා කලලයේ පැවැත්ම රැකීම නිසා කුඩා බිළිදෙකු ලොවට විද්‍යාමාන වේ. මිනිස් බිළිඳා තුළ යම් කාලයක් යනතුරු ආයතන පහ තවත් වර්ධනය වීම සිදුවේ. මෙම බිළිඳා හට ඇස, කන, නාසය, දිව, ශරීරය යන ආයතන විද්‍යාමාන වන්නේ දැනෙන ස්වභාවයකින් පමණි.

නමුත් අවිද්‍යාව මුසු වූ මෙම කම්පනය නිසා ආයතනවල ඇලෙන ස්වභාවය විද්‍යාමාන වේ. බිළිඳා උණුසුම තුළ සැනසෙන අතර සීතල අපහසුතාවයක් ලෙස දැනේ. මව්කිරි ලැබීම තුළින් සිරුරට ලැබෙන සිසිලස සුවපහසු බවක් ගෙන දේ. තොටිල්ල උඩින් එල්ලන ලද විචිත්‍රවත් වර්ණ වලින් හෙබි කැරකෙන දෙය දැක බලා බිළිඳා ගේ මුවගට සිනහ නැගේ. මව් සුවඳ පවා බිළිඳා සනහන බව ඔබ දැක ඇත.

ඔබේ ජංගම දුරකථනයේ ඇති ස්වභාවයට ඇලෙන බිලිදා එය නැවත ගැනීමට යද්දී හඬා වැටේ. ඒ දැනෙන ස්වභාවය ඇත්තේ නමුදු බිලිදාගේ ආයතන ගැට ගැසීම තවම සිදුවී නැත. ආයතන ගැට ගැසීම සිදු වන්නේ එසේත් නැත්නම් මේ ඇලෙන ස්වභාවය ඇති ආයතන පටිච්ච වීමෙන් මනස හෙවත් සිතුවිලි හටගනී.

රූප සටහනක් හට ගන්නේ ඇසේ ඉතා වේගයෙන් සිදුවන රුප්පනය තුළිනි. ශබ්දයක් හටගන්නේ කනේ ඉතා වේගයෙන් සිදුවන රුප්පණයක් තුළිනි. සමේ දැනෙන ඝන ස්වභාවය වැනි මහාභූත හට ගන්නේ ද සමේ සිදුවෙන රුප්පනය තුළිනි. ඉතා වේගයෙන් සිදුවන රුප්පනය නිසා දෙයක් සේ දැකීම තුළින් මෙම ඇලෙන ස්වභාවය හට ගනී. මේ ඇස් කම්පනය හා කන කම්පනය එකට සිදුවන විට, මේ නිසා සිදුවන කම්පන සංකලනය නිසා චිත්ත කම්පනයක් බිහිවේ. මෙම ධර්මතාවය නිසා බිළිදාහට අම්මා බිහි වේ. මෙහි මේ ආයතන පහේම කම්පන අම්මා තුළ ඇති බව ඔබට වැටහුනාද? අම්මාගේ රූපයේ ශබ්දය, සුවඳ, රස මෙන්ම උණුසුම මෙම චිත්තය තුළ ගැබ්ව ඇත මෙම චිත්තය නැවත නැවත ඇසුරු කිරීම තුළ එය අභිසංකරණයට හෙවත් වර්ධනයකට පත් වී අම්මා පිළිබඳ සුන්දර කතාවක් කුඩා දරුවාගේ මනසේ ගොඩනැගේ.

ඇසක කම්පනයක් සිදුවුණොත් පමණක් දරුවාට ආලෝකය අනුනාද වෙයි. කණට කම්පනයක් සිදුවන පරාසයටම පමණක් ශබ්දය අනුනාද වනු ඇත. ජාති අන්ධ දරුවෙකුට ආලෝකය ගැන කිසිම හැඟීමක් නැත. එයින්ම හටගන්නා ධර්මතාවයක් බව මොනවට වැටහේ.

එලෙසම සත්ව ලෝකයේ ඇති විවිධ පරාස මිනිස් ආයතනයකට අසු නොවනු ඇත. ගවයාට ගවයා සියල්ල රතු ආලෝකය තුළින් දකිද්දී යම් සත්වයන්ට පෙනෙන්නේ රාත්‍රී කාලයේදී පමණි. මෙවැනි උදාහරණ තුළින් ඔබට පැහැදිලි වන්නේ ඇසීම දැකීම දැනීම ආයතන කෘත්‍යයක් පමණක් බවයි. මෙය බාහිරයට ප්‍රක්ෂේපණ කොට ගැනීම හේතුව නොදන්නාකමකි.

මෙවැනි ඉතා දුර්ලභ වූ දුර්වල වූ අත්තිවාරමක් උඩ මනස යන ගෙය නිපද වේ.

අපි අන්නාසි උදාහරණය ලෙස ගනිමු. සිංහල භාෂාව ඇසෙන පරිසරයක වැඩෙන දූ දරුවන්ට මෙයට රූපයක් ඇත. ඉංග්‍රීසි බස හසුරුවන්නෙකුට අන්නාසි ගැන හැඟීමක්වත් නැත. යම් සිතක හටගත් අන්නාසි යන සිතිවිල්ලේ රසය, සුවඳ, තද බව, මුදු මොළොක් බව, ශබ්දය හා රූපය මුසුව ඇත. මේ චිත්තය තුළ කිසිම කෙලෙසක් නොතිබුණු පෘථග්ජන පුද්ගලයෙකුට කෙලෙසක් හටගත්තේ කෙලෙසද?

මේ සිතිවිල්ල දෙයක් වීම තුල දරුවා තුළ විඳින්නා බිහිවේ. මෙම සිතුවිල්ල අභිසංකරණය වීම තුළ අන්නාසි වලට කැමති හෝ අකමැති කෙනා බිහිවේ. මින් වැටහී යන්නේ මනස සියල්ලටම මූලික වන බවයි. දැන් අන්නාසි රස විඳින්නා, අන්නාසි මතකයට නගා ගන්නා, අන්නාසි මිලදී ගන්නා, අන්නාසි කුණු වූ විට දුක් වන්නා මනස තුළින්ම බිහිවේ.

අන්නාසි යන සංඥාව/ චිත්ත රූපය දෙයක් වී හමාරය. දෙයක් වූ සැණින් පෙර පසු නොවී විඳින්නා බිහිවේ. මෙම සංඥා අභිසංකරණය ජීවත්වීම ලෙස හැඳින්වේ.

අවිද්‍යාව නොහොත් ඇත්ත නොදන්නා මෙම සිතිවිලි මායාව, මායාවක් ලෙස නොපෙනේ. එහි ඇලී ගැලී එතුලම දිවි ගෙවන සත්ත්වයා මායාව තුළ බිහිවන විඳින්නා බලගන්වයි. මෙලෙස ආයතන හරහා බිහිවන මනස දෙයක් කරගත් සත්ත්වයා හට තමන් ඉන්නා බව හැඟවේ. මෙම චිත්ත රූපය තව තවත් වර්ධනය වීම නිසා දෘෂ්ටියක් බවට පත්වේ.

මෙය අරමුණක් ඔස්සේම සිදුවන දෙයකි. අන්නාසි දෙයක් වූ විට එය බිහි වූ මමද බිහිවන්නේ නිතැතින්මය මෙම ක්‍රියාවලිය අරමුණක් තුළ හඳුනා ගැනීම ධර්මය දැකීමක් වෙයි.

# මේ බුද්ධෝත්පාද කාලයයි

## නිවන් දකින්නට කාලයයි
## දෑස් අරින්නට කාලයයි

බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ



පටිච්චසමුප්පාදය යනු මෙම මම මගේ මගේ ආත්මය යන සත්ව පුද්ගල දෘෂ්ටිය බිහි වූ ආකාරය බුදුරජාණන් වහන්සේ දේශනා කළ ආකාරයයි. අන්නාසි දෙයක් වීම නොහොත් අන්නාසි භව නිසා ඔබ විද්‍යාමාන වූ ආකාරය දකින්නට උත්සුක වන්න. ආයතන නිතැතින්ම ගැට ගැසීම තුළින් දෙයක් වීමට මේ තණ්හාවට හේතුවයි. දෙයක් වීමට තණ්හාවට හේතුව මේ ආයතන කෘත්‍ය හරහා හරි හැටි නොදන්නාකමයි. ආයතන කෘත්‍යයක් සිදුවූවා මිස මෙහි සත්වයෙක් පුද්ගලයක් නැත. ඇත්තේ එම අරමුණ පමණි. ඇත්තේ ස්කන්ධය රූප වේදනා, සංඥා, සංඛාර විඤ්ඤාණ පමණි. උපාදාන වන්නේ තණ්හා වන්නේ පදනම නොදත් බැවිනි.

තණ්හාව උපාදානය නිසා ඇතිවන මෙම ආත්ම කම්පනය ආත්ම සංඥාව දක්වා බලවත් වෙයි. අභිසංකරණය නිසා මෙම සංඥාව ආත්ම දෘෂ්ටිය දක්වා බලගැන්වෙයි. මෙහිදී දැනගත යුතු වැදගත්ම කරුණ වන්නේ මේ සිදුවන්නේ "අන්නාසි" තුළින්ම බවයි. අන්නාසි දෙයක් නොවන සිතකට ආත්ම කම්පනය හට නොගනී.

සත්‍ය කන වැකෙන්නා මෙම සත්‍යය තුළ කිමිදී බලයි. ශබ්ද, වර්ණ දැනෙන ස්වභාව තුළින් නොයෙක් ආයතන පටිච්ච වීම තුළින් හටගත් සිතිවිල්ල දෙයක් වීම බරක් වීම කෙමෙන් අඩුවේ. අප මහා බලයක් යොදා පරිහරණය කරන අන්නාසි, පුටුව, ඉර, හඳ, අම්මා, පුතා, ශ්‍රී ලංකාව, ලෝකය මේ මනසේම නිෂ්පාදනයක් බව වැටහෙන ඔබට එය දෙයක් නොවී යයි. බාහිරට ප්‍රක්ෂේපණය කලද මෙම සියල්ල මිනිස් සිතක චිත්ත නිෂ්පාදනයක් බව වැටහේ. පාරවල් සයක් මැද සිට විජ්ජාවක් පෙන්වන මැජික්කාරයා මනසයි. කාලය මනසේම තවත් නිෂ්පාදනයකි. මතකය කියා දෙයක් ගබඩා කාමරයක් සේ ඇති බව හැඟුණද එය අවිද්‍යාවේ තවත් එක අංගයකි.

මතකය ලෙස ගබඩාවක් නොමැත්තේ නම් සිදුවන්නේ කුමක්ද? අපි සිතමු ඔබේ ගෙදර කෙනෙකු "අන්නාසි" කපන බව ඔබ ගෙදරට ගොඩවන විට ඔබට ආවේ සුවඳ පමණි. සුවදේ අන්නාසි හමුවුණේ කෙසේද? එසේ වන්නේ එම සුවඳ තුළින් අනු නාද විය හැකි සියල්ලටම අනුණාද වීම සිදුවේ. මෙහිදී අනුණාද වන කම්පනය සමාන බැවින් පෙර මතකය ලෙස වෙන් කළ නොහැක. කම්පනයක පෙර පසු කියා දෙයක් ඇත්තේ නැත. අවුරුදු තිහකට පෙර දැනගත් දෙය දැන් දැනුනාද වීම තුළ අන්තරයක් නොමැත. මෙය කල්ප ගණනකට පෙර සිදුවූවකටද සාධාරණය. මෙලෙස සමාන කම්පන වීම නිරතුරුවම සිදුවන දෙයකි.

මේ සත්‍ය නොදන්නා මම, මගේ, මගේ ආත්මය යන දෘෂ්ටිය තුළ බැසගෙන සිටි. මෙම පද්ධතිය ඉන්නවා තියෙනවා බව දැනීම "දුක" ලෙස හඳුනා නොගනියි. අරමුණ ඔස්සේ ඇතිවන මෙම "දුක" නිරෝධ කළ හැකි දෙයක් බව නොදනී. දුක හට ගත්තේ මෙම ඉත්ථ කම්පනය ආත්ම කම්පනය නිසා බව නොදත් මෙය අවිද්‍යාවේම දිගුවක් බව නොදනී. දුක නැති කිරීමට මාර්ගයක් ඇති බව නොදනී.

සත්‍යය එනම් මේ සිත හැදෙන ආකාරය අසා දැනගන්නා මේ ගැන මනසිකාරය කරයි. කෙලෙස් යනු දුක යනු ඉන්න බව දැනීම යනු සියල්ල එකම සංසිද්ධියක් බව වටහා ගනියි. අරමුණ දෙයක් වීම තුළින් කෙලෙස් උපදින බව ප්‍රත්‍යක්ෂ වේ. බාහිර ඇති සියල්ල මනසේම ප්‍රක්ෂේපණ බව වැටහේ. මනසද කම්පන ගොඩක් තුළින් විද්‍යාමාන වන මායාවකි. ඇත්තටම "අන්නාසි" කියා දෙයක් නොමැත. එය මිනිස් සිතක හටගත් අරමුණක් පමණි. එලෙසම ආලෝකය, ශබ්දය, සීතල, උණුසුම, තද ගතිය, වැගිරෙන ගතිය, ගලන ගතිය, රස, සුවඳ වැනි මූලික ආයතන කෘත්‍යයද ආයතන පවතින තාක් පවතින රූප්පණ පමණි.

වේගය මත මෙම රූප්පණය දෙයක් සේ දැකීම විඤ්ඤාණයයි. මෙලෙස හඳුනාගත් සිතකට එක අරමුණක් ඔස්සේ අරමුණ දෙයක් නොවන අවස්ථාවක් අත්දැකීමට ලැබෙයි. මෙම අවස්ථාව නිසා මම නැති, ඉන්නවා වගේ නොදැනෙන අත්දැකීමක් ලැබේ. මේ අනිත්‍ය සංඥාවක් බිහි කරයි. මෙම අත්දැකීම තුළින් මෙම පද්ධතියට ආත්ම දෘෂ්ටිය බිඳ වැටේ. ධර්මය ගැන සැක සංකා අතහැරේ. මම යැයි පරාමර්ෂණය නවතී. මෙය දර්ශන අවබෝධය තුළින් ලැබෙන අත්දැකීම නිසා ලබන අතුරුඵලයයි.

මතු සම්බන්ධයි.
මීළඟ කළාපයෙන් බලාපොරොත්තු වන්න.



# නිර්මල බුද්ධෝත්පාද දේශනා

## හෙට උපදින දරුවාටද එලෙසම දායාද විය යුතුයි.

අප දීර්ඝ කාලයක් තිස්සේ දහම සොයමින් ආ ගමනක, පොත්පත් සඟරා ලිපි තුළින් දිව්‍ය ලෝකය ගැන විවිධ කතා අසන්නට දකින්නට ලැබුණා. එහෙත් ඒ දේවල් එකිනෙකාගේ අදහස් මතවාද පමණක් වූවා. ඒ ලිපි අතරින් දිව්‍ය ලෝකය සංකල්පයක්ද යනුවෙන් පළ වූ ලිපි කෙරෙහි විශේෂ අවධානයක් නිරායාශයෙන් යොමු වූයේ යම් විමර්ශන බුද්ධියක් ඇතිව ඒ දේවල් විමසන කෙනෙකුටයි. ඒ ලිපි තුළත් පැහැදිලි විග්‍රහයක් දකින්නට නොලැබුණේ ඒවා අදහස් මතවාද දෘෂ්ටි පමණක්ම වූ නිසයි. ඒවා ගැන ප්‍රත්‍යක්ෂ අවබෝධයක් නැති පාඨකයාද තව තව දෘෂ්ටි වලම එල්බ ගන්නවා. ඇත්තෙන්ම තමන්ට ප්‍රත්‍යක්ෂ අත්දැකීමක් නොවන කරුණක්, හැම විටම දෘෂ්ටියක් පමණක් වෙනවා. එය මිථ්‍යා දෘෂ්ටියක් වන්නේ ඒ නිසයි.

එහෙත් විශ්මයජනක ලෙස දහම සොයන විමර්ශනයක් ඇති කෙනෙකුට අහම්බෙන් ඇසෙන බුද්ධෝත්පාද දේශනා තුළින් අත්දකින්නට ලැබෙන ධර්මය, ඒ සියලු දෘෂ්ටි ගැට ලිහා දමමින් විශුද්ධියට පත් කරන බව ටිකින් ටික ශ්‍රාවකයාට දැනෙන්නට වීම හෙමින් හෙමින් සිදුවුවත් එය පුදුමාකාර ආශ්චර්යයක්.



අපටද අහම්බෙන් ඇසෙන බුද්ධෝත්පාද දේශනාවක වචන කීපයක් ශ්‍රවණය වීමෙන්ම ඒ ධර්මය ප්‍රත්‍යක්ෂ ධර්මය බව දකින්නට හැකි වීමද ආශ්චර්යයක් වුණා.

දහම සොයමින්, විමසමින්, ගලපමින් දශක ගණනක් සත්‍ය සොයමින් ආ මගෙහි නිමාවද එලෙස සනිටුහන් වුණා.ඒ දහම අත් දකින්නේද ශ්‍රාවකයාගේ අභ්‍යන්තර පරිවර්තනයේ ප්‍රමාණයටයි.

අවංකවම වීර්යවන්තව සත්‍යම ගවේෂණය කළ පුද්ගල සරණ නොගිය අතලොස්සක් දෙනාට කල් නොයවාම දහම ප්‍රත්‍යක්ෂ වූවා. මේ වනවිට තවත් බොහෝ දෙනෙකුට ඒ දහම සත්‍යම බුද්ධ වචනය බව අත්දැකීමක් බවට පත්වෙමින් තිබෙනවා.

මේ දහම අසන්නට යැයි කිසිම දවසක බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ කිසිවෙකුට ආරාධනා කොට තිබුණේ නැහැ. උන්වහන්සේ දේශනා කළා පමණයි. ඒ දහම දැනෙන කෙනෙක් නිරායාශයෙන් ඒ දහම හා එක් වූවා පමණයි.

අප දිව්‍ය ලෝකය සංකල්පයක්දැයි, යථාර්ථයක් දැයි දකින්නට පෙර, මේ මොහොතේ අප ජීවත්වන මනුෂ්‍ය ලෝකය පිළිබඳ සත්‍යය අවබෝධ කළ යුතු වෙනවා. ඒ සඳහා සලායතන ලෝකය අවබෝධ කළ යුතු වෙනවා.

එහෙත් එය සිදුවන්නේ අප තුළින්ම ධර්මය අවදි වී අභ්‍යන්තර පරිවර්තනයක් සිදුවීමෙන්ම පමණයි.

අපද දශක තුනකට අධික කාලයක් සමථ සමාධි අත්දැකීම් ලැබුවා.ඒ තුළින් නිරෝධ සමාපත්තිය නිවන යැයි අනුමාන කළා මිස ප්‍රත්‍යක්ෂ නොවූ ආකාරයත් අත්දුටුවා. ප්‍රත්‍යක්ෂ භාවයක් නැති නිසාම එතන නතර නොවී, දෘෂ්ටිගත නොවී, පුද්ගල සරණ නොයා පොත්පත් පීරමින් ප්‍රත්‍යක්ෂය සොයමින්, හැම ස්වාමීන් වහන්සේ නමකගේම ධර්ම දේශනා අධ්‍යයනය කරමින් ගලපමින් සටහන් තබමින් නැවත විමසමින් පටිච්චසමුප්පාද විග්‍රහය, ස්කන්ධ විග්‍රහය වැනි ගැඹුරු ධර්ම කාරණා, බුද්ධ වචනයට අනුවම මහත් වූ වීර්යයෙන්, කැප වීමෙන් කිසිදු උපදෙසක් ගන්නට සුදුසු කෙනෙක් නොලැබීමෙන් තනිව ගලපෙමින් ආ ගමනක අපට ලැබුණු, සම්මානයක් නොවන සම්මානයයි බුද්ධෝත්පාදෝ.

අපට එදා නැසුණු ඒ දහම අද දහම සොයන අයට නිරායාසයෙන් ලැබුණත් එය පහසුවෙන් අවබෝධ නොවන්නේ තමා තුළ තිබිය යුතු සත්‍ය දැකීමේ වීර්යය කැපවීම අවංක භාවය නිහතමානී බව මඳ බව නිසාවෙනි.

මේ සත්‍යය අත්දැකීම තුළ මනුෂ්‍ය ලෝකය සංකල්පයක් බවද ප්‍රත්‍යක්ෂ අත්දැකීමක් වෙනවා. එවිට දිව්‍ය ලෝකය සංකල්පයක් බවට කවර කතාද? බාහිර සත්‍ය නොවන බව, සියල්ල වේගයට ආයතන වල මැවෙන මායාවක් බව අත්දකින තරමටම සිතද සත්‍යයක් නොවන බව සමස්ත අවබෝධයක්.

ඒ තුළින් මනුෂ්‍ය ලෝකය සංකල්පයක් වන විට, දිව්‍ය ලෝකය පමණක් නොව තිස් එක් ලෝක තලයම සංකල්පයක් බවට පත්වෙමින්, එක් ක්ෂණික සිතක අත්දැකීමක් බවට පත් වෙමින් දුකින් මිදෙන්නේ ඒ ක්ෂණයේමයි.

අසූ හාරදහසක් ධර්මස්කන්ධය එක් ක්ෂණික සිතක අවබෝධයක් වෙමින්, සිතින් මිදීම හරිම ආශ්චර්යයක්.

අප අසා තිබූ බුද්ධ වචනය අද අපට ප්‍රත්‍යක්ෂයක් සාන්දෘෂ්ටික දහමක්. බුදුන් වහන්සේට පමණක් දෙවැනි වන ගෞරවයක් බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේට හිමි විය යුත්තේ මෙය බුද්ධ ආඥාව නිසයි.

දශක තුනකට අධික ධර්මය සෙවූ කාලය තුළ මේ තරම් පිරිසිදු සත්‍ය ධර්මයක් අපට කිසිම දේශකයන් වහන්සේ කෙනෙකුගෙන් අසන්නට ලැබුනේ නෑ. කිසිදු පොතක අප දුටුවේ නෑ. දශක ගණන් වැඩූ භාවනාවෙන්ද ඒ දහම ප්‍රත්‍යක්ෂ වූයේ නෑ.

එහෙත් එක් එක් කාරණා එක් එක් දේශකයාණන් වහන්සේලාගේ දේශනා තුළ හමුවුණා. ඒ බාහිර සියල්ල තම සිතම බවයි. අප දහම ගලපමින් ආ ගමනේ සුන්දර සන්ධිස්ථානයක් ඒ තුළ සනිටුහන් වුණා. ඒ වන විට යම් පමණකට දැනෙන දහමක් දේශනා කරන දේශකයාණන් වහන්සේලා හමු වුණත්, ඒ තැන්වල දැනෙන ප්‍රත්‍යක්ෂ ධර්මයක් දකින්නට ලැබුණේ නැහැ. සමහර ස්වමීන්වහන්සේලාගේ දේශනා අධ්‍යයනය කරන්නට අපිට සිදුවුණේ උන්වහන්සේගේම ධර්මය දේශනා වන Youtube නාලිකාවකින් පමණයි. බාහිර සියල්ල සිතම බව දේශනා කරමින් සිටි උන්වහන්සේගේ ධර්මය ඇත්තෙන්ම අපට ප්‍රත්‍යක්ෂ ධර්මයක් වූවා. එම දේශනා එක්තරා කඩඉමක් බවට පත් වෙද්දී අහඹු ලෙස බුද්ධෝත්පාද දේශනා ශ්‍රවණය වූයේ මෙතෙක් ගලපාගෙන ආ ගමන් මගේ නිට්ටාව සනිටුහන් වෙමින්. එහි තුළ තිබුණේ මහා දහම් අභිඥාවක්. එය දෙවෙනි වන්නේ සම්මාසම්බුද්ධ ඥානයට පමණක් බවට අපට අත්දකින්නට ලැබුණා.

අද සමහර ස්වාමීන් වහන්සේලා දේශනා කරන්නේ බුද්ධෝත්පාද දේශනාවයි. අපේ දශක ගණන් දහම සොයා ආ මගෙහි උන්වහන්සේලා ඒ දහම දේශනා කරනවා මෙතෙක් අප දුටුවේ නෑ. අද උන්වහන්සේලා දේශනා කරන්නේ බුද්ධෝත්පාද දේශනාවලින් ගත් ධර්මයයි. එය ඉතාම සතුටට කරුණක් වුවත් එතන ඇත්තේ අපට නොපෙනෙන මානයෙන් අවදානමක්. මේ දහම් මග ඉතාම ඍජුයි ඉතාම පිරිසිදුයි ඉතාම අවංකයි. අප දහම ගලපා ගැනීමේදී යම් පිහිටක් ලැබුවා නම් ඒ සෑම ස්වාමීන් වහන්සේ නමකටම ඒ ගෞරවය හිමියි. ඒ නිහතමානී ගුණය නැති තැන, ඒ දේශකයන් වහන්සේලා තුළ අභ්‍යන්තර පාරිශුද්ධතාවය පිළිබඳව ගැටලුවක් පවතිනවා.ඒ තුළ මේ නිර්මල බුද්ධෝත්පාද දේශනාවන්ට මතු යම් දිනයක විවිධ දෘෂ්ටි එකතු වීමේ අවදානමක් පවතිනවා. ඉන් අසරණ වන්නේ වෙන කිසිවෙක් නොව මේ දහම දකින්නට සුදුසුකම් ලබා සිටින අසරණ මිනිසුන්මයි.

අභ්‍යන්තර මහා අවංක භාවයක්, පාරිශුද්ධතාවයක් සමඟ පවතින ඒකායන මාර්ගයක්. එය නැති තැන මේ දහම දේශනා කරන දේශකයාණන් වහන්සේ තුළ ගැටළුවක් පවතිනවා.ඒ උන්වහන්සේ දේශනා කරන්නේ තමන්ට ප්‍රත්‍යක්ෂ ධර්මයක් නොවීමයි. නිර්මල බුද්ධෝත්පාද දේශනා තුල ඇත්තේ පිරිසිදු බුද්ධ වචනයයි. එය කිසිඳු පුද්ගලයෙකුට අයිති දෙයක් නොවේ. එය ධර්මයම පමණයි. ඒ ධර්මය හෙට උපදින දරුවා වෙනුවෙන් පිරිසිදුව රැකගැනීම බුද්ධෝත්පාද ශ්‍රාවකයන්ගේ වගකීම සහ යුතුකම වෙනවා. ඒ වෙනුවෙන් ඍජුව ඉදිරිපත්වීමට, සත්‍ය කතා කිරීමට, සත්‍ය පෙන්වාදීමට හැමවිටම ඔවුන් දිවි හිමියෙන් කටයුතු කරනු ඇති.

තෙරුවන් සරණයි!
සුජීවා



# දෙයක් නෑ කියලා සරලව දකින්න එපා.

චිත්තේන නීයති ලෝකෝ, සළායතන ලෝකෝ කියා බුදුන්වහන්සේ දේශනා කළද අපට පෙනෙන, ඇහෙන, දැනෙන සියල්ල බාහිර ලෝකයක ඇතිබවට ගැනීම පෘතග්ජන ස්වභාවයයි.

එහෙත් බුද්ධෝත්පාදෝ දේශනා අසන අපට සිත සකස් වන ආකාරය, දේවල් ඇතිවන ආකාරය, ඒවට වටිනාකමක් ඇතිවන ආකාරය මනාව විග්‍රහ කරයි. ''දෙයක් නැතිනම් කෙනෙක් නැත'' සිතුවිලි ලෝකයක අපි ජීවත් වේ. සිතුවිලි වලින් හට ගන්නා දේවල් බාහිර නැති බව බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ අපට පැහැදිලි කරන අයුරු ඉතා ගම්භීරයි. බුද්ධෝත්පාදෝ දේශනා අසන ධර්ම මාර්ගයේ ගමන් කරන අය ''දෙයක් නෑ'' ''දෙයක් කරගත්තා'' කියනකොට ඒ අවස්ථාවේ බාහිර ලෝකය සමඟ සම්බන්ධයක් ඇති වන්නේ නැහැ. ඒක තමාගේ අභ්‍යන්තරයේ දැනෙන ස්වභාවයක් එතන සරලව දකින්න බැහැ. ඒ දැනෙන ස්වභාවය තුළ දෙයක් නැති බව දැක්කොත් පමණයි මේ මුළු දහමම දකින්න පුළුවන් වන්නේ. බුද්ධෝත්පාද ශ්‍රී සද්ධර්මය අසන්න පටන් ගන්න සෑම කෙනෙක්ම ''දෙයක් නෑ'' කියන තැනට විශේෂ අවධානය යොමු කළ යුතුයි.

බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ දේශනා කරන මේ බුද්ධ දර්ශනය මහා ආශ්වර්යයක් වෙන කිසිම කෙනෙකුගෙන් අසන්නට නොලැබෙන ප්‍රත්‍යක්ෂයෙන් දේශනා කරන දේශනා මාලාවක් තමයි දැන් අපි ශ්‍රවණය කරන්නේ.

බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේගේ ධර්මය අසන පළමු දවස මට මතක් වීමම සුන්දර අවස්ථාවක්. මොකද අන්න දෙයක් කරගත්තා කියා ආර්යයන් වහන්සේ දේශනා කරනකොට මට ඒක අභ්‍යන්තරයට වන දෙයක් කියලා හොඳින් ප්‍රත්‍යක්ෂ වුණා. ඒ දවසේ සිට නොනවත්වාම දේශනා අහන්න පටන් ගත්තා. (2022/10) මම වෙන ස්වාමීන් වහන්සේලාගේ දේශනා අසා තිබුණේ නෑ. ඒත් 2004 වර්ෂයේදී ධර්මය හොයාගෙන ලෝකේ නොයෙක් රටවල යන ඇමරිකන් ජාතිකයන් දෙදෙනෙක් ලංකාවට ආවා. ඒ අය අපට කිව්වා නිවන් අවබෝධ කරන්න නම් ''මම බලවත් වීම'' නැති වෙන්න ඕනෑ කියලා. එතකොට මට වයස අවුරුදු හතළිහයි. ඒ අය ලංකාවේ කටුකුරුන්දේ ස්වාමීන් වහන්සේ නා උයන අරියධම්ම ස්වාමීන් වහන්සේලා ළඟ යම් දුරකට ධර්මය තියෙන බව පැවසුවා. ඒ නිසා ''මම බලවත් වීම'' මා තුළින් යම්කිසි දුරකට දකින්න උත්සාහ කළා.

පුංචි කාලේ අවුරුදු (අවු.7 දී) මට මාන්නය ඇති කළ අවස්ථාවක් දිගින් දිගටම පේන්න ගත්තා. පසු කාලයේ මේ හිත වැඩ කරන හැටි හොයන්න උනන්දු ඇති වුණා.

2022 ඔක්තෝබර් මාසයේ මුලින්ම බුද්ධෝත්පාද දේශනා මට අසන්න ලැබුණා. බුද්ධෝත්පාද දේශනා අනුව ශබ්ද, වර්ණ එකතු වීමෙන් සෑදෙන සිතුවිලි සියල්ල කම්පන ස්වභාවයක් පමණක් බව පැහැදිලි වේ. මේ කම්පන ස්වභාවය නිසා අපට ඇතිවන ආරෝපණ බලය අපේ සසර ඕගය තීරණය කරන ආකාරය ඉතාමත් අනර්ඝ ලෙස ආර්යයන් වහන්සේ දේශනා කරනවා.

මේ අරමුණක් (සිතුවිල්ල) නිසා අපේ අභ්‍යන්තරයේ හටගන්නා ආරෝපණ බලය "දෙයක් නැති ස්වභාවය" දකින්න ඕනෑ. එතන සැබවින්ම දෙයක් නෑ. එතන ආත්මය නැතිවීමයි සිදුවී ඇත්තේ. එතන තමයි අපි සත්‍ය දැකීම තුළින් නිවීම අත්දකින ස්වභාවයට පත්වන්නේ. ''චිත්තේන නීයතී ලෝකෝ'' කියන බුද්ධ වචනය අවබෝධ කළ යුතුයි. තමාගේ අභ්‍යන්තරය තමාටම පේන්න ඕනෑ.

බුද්ධෝත්පාද දේශනා අසනකොට ඒ සත්‍යය දැකීම තුළින් අපිට අපේ අභ්‍යන්තරයේ හැමදේම හටගන්නා ස්වභාවය දකින්නත් පුළුවන්. එතකොට මේ බාහිර එක්ක හදන සිතුවිලි වල කිසි වටිනාකමක් නෑ. අගයක් නෑ. හැම මොහොතෙම ක්‍රියාවලියක් සිදුවුණාට ඒවා ආයතනවලින් (ඇස, කන, දිව, නාසය, කය මන) සිදු වෙනවා පමණක් බව තමන්ටම දැනෙනවා. අපි අරමුණේ සත්‍යය දකිනකොට ඒ තුළ ඇති ඒ ආරෝපණ බලය ක්ෂය වීම තමාටම සිහියට හසුවෙනවා. හැබැවින්ම ඒ දෙයක් නොවන ස්වභාවය අත්දැකිය හැකි වේ. මේ අපට අභිසංස්කරණය තුළ සකස් වූ ආරෝපණ බලය අවශ්‍ය ද? එතනයි බුද්ධෝත්පාද දේශනා තුළ දර්ශනය ඥානය ඇතිවූ විට සත්‍ය දැකීම තුළින් "දෙයක් නොවන" තැනට එන්න පුළුවන් වන්නේ.

ඇසේ සකස්වීම, කනේ සකස්වීම තුළ අපට ආලෝකය ශබ්දය පවා දෙයක් වගේ දැනෙන නිසා අපි හැම දෙයක්ම ඉන්නවා, තියෙනවා කියා බාර අරගෙන සසර ගමන් කිරීම සිද්ධ වෙනවා. මේ ඉන්නවා කියන ඉත්ථ කම්පනය නිසා ආත්ම කම්පනය ඇතිවෙලා සාශ්‍රව ස්වභාවය එක්ක සසර මාර්ගයේම ගමන් කිරීම සිදුවෙනවා.

උදාහරණ වශයෙන්,

බුද්ධෝත්පාද දේශනා ඇසීමට පෙර මගේ නංගිගේ දරුවන්ට සුළු අසනීපයක් වුණත් දවසම ඒ ගැන අවධානයෙන් අනෙක් සියළු කටයුතු අතහැර ඒ දරුවා උපාදානය කරගෙන අභ්‍යන්තරයෙන් ගින්නක් හදාගෙන එතැන දෙයක් කරගෙන දවස ගෙව්වා මතකයි.

# මේ බුද්ධෝත්පාද කාලයයි මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.

වසර 2500 කට පමණ පෙර අපගේ සම්මා සම්බුදු පියාණන් වහන්සේ සර්වඥතා නුවණින් විද්‍යාත්මක පර්යේෂණය තුළින් ගැඹුරු ධර්මතාවයක් අවබෝධ වී මේ සියලුම දුක් නිවාස සනසන නිර්වාණ මාර්ගයක් අවබෝධ කරගත් සේක. සසර දුක් විඳින සත්වයාට නිවන් අවබෝධ වීම පිණිස ඒ චතුරාර්ය සත්‍ය ධර්මය දේශනා කරන ලදී.

මේ පරම සත්‍ය කාලයේ වැලිතලාවට යට වී ගිය මොහොතක අපගේ කල්‍යාණමිත්‍ර බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ නැවතත් මේ සත්‍ය ධර්මය ත්‍රිපිටකය ඇසුරු කර ගනිමින් ප්‍රායෝගික අත්දැකීම් තුළින් අවධි කරගත් සත්‍ය ධර්මයක් සියලු ලෝක සත්වයාට මේ භවයේදීම තමන්ගේ සිතේ ගිනි නිවාගෙන සැනසිල්ලේ ජීවත්වීමට හැකි දහම් දීපයක් බවට පත් කරමින් පටිච්චසමුප්පාද ධර්මයක් දේශනා කරනවා. උන්වහන්සේ සත්‍ය ඥානය, දර්ශනය පිළිබඳ දේශනා දහස් ගණනක් දේශනා කර තිබෙනවා. ඒ පටිච්ච සමුප්පාදන ධර්මයයි. හේතු තියෙන කොට තියෙනවා. හේතු නැතිවෙන කොට නැතිවෙනවා. තමන් කරනවාම නෙමෙයි කවුරුවත් කරනවා නෙමෙයි. චිත්තේන නියති ලෝකෝ මෙය සිත තුළ මැවෙන සිතුවිලි ලෝකයක්. මෙය ධර්මතාවයක්.

අපගේ කය තුළ වේගයක් වැනි සිතුවිල්ලක් හට ගැනීම තුළ එය සිතුවිල්ල දෙයක් කර ගනිමින් අවිද්‍යාවෙන් අපි සියලුදෙනාම ජීවත් වෙනවා. බුද්ධෝත්පාද දේශනා අසන සෑම කෙනෙක්ම අනුසෝතයෙන් පටිසෝතයට පැමිණෙනවා. කිසිම කෙනෙක් කර්ම භූමියේ සිටින්නට විදියක් නැහැ. මේ ධර්මය අනාත්ම ධර්මයයි. විදර්ශනා දූරයයි. මිත්‍යා දෘෂ්ටියෙන් සම්මා දිට්ඨියට පත්වෙනවා කියන්නේම ආර්ය අෂ්ටාංගික මාර්ගයට පැමිණිලා යහපත් ආකාරයෙන් එදිනෙදා කටයුතු කරමින් සිත, කය, වචනය යන තුන්දොරින්ම තමන් කරනවා නෙමෙයි ඉබේම නිවැරදිව එදිනෙදා ජීවත්විම සිදු වෙන ධර්මතාවයක්.

අපට ආයතන හයක් තියෙනවා. ඇසට වර්ණ, කනට ශබ්ද, දිවට රස, නාසයට ගඳ සුවඳ, කයට උණුසම, සීතල, තද ගතිය, මනසට සිතුවිලි. සළායතන ලෝකෝ ලෝකෝ ආයතන පහට මැවෙන ලෝකයක්. පංචඋපාදානස්කන්ධය හරහා මැවෙන ලෝකයක්. අපි මේ සිතුවිලි වලට රැවටී බාහිර ලෝකයක් තියෙනවා කියලා අරගෙන මම, මගේ, මගේ ආත්මය වශයෙන් ගෙන බාහිරින් දකින පුටුවට රැවටී ඉත්ථභාවය ආත්මභාවය වී ඇලීම් ගැටීම් තුළින් භවයක් සාදා ගන්නවා. මේ සිත (අරමුණ) සකස් වෙන්නේ මේ මොහොතේමයි. එක්

නමුත් දැන් බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේගේ ධර්මය ඇසීම තුළින් ඒ අරමුණේ සත්‍යය දැකීම නිසා ඒ ඇතිවන ආරෝපණ බලය ක්ෂය වීම අත්දැකිය හැකිය. ඒ බාහිර දරුවා කියන සිතුවිල්ලට දී තිබුණු වටිනාකම බුද්ධෝත්පාද දේශනා ඇසීම තුළින්ම බාහිර සත්‍යයක් නොවන බවට සිත තුල අවබෝධයෙන් මිදීමක් සිදුවී ඇත. දරුවා ගොඩනැගුණු ආකාරය ඉන්පසු මේ දිගින් දිගට අභිසංකරණය තුළ ඇතිවුණ ආරෝපණ බලය හඳුනා ගැනීම නිසා එතන සත්‍යයක් නැති බව දකින්න පුළුවන්. ඒ ආරෝපණ බලය ක්ෂයවීම තුළ දරුවා කියන සංඥාව අභ්‍යන්තරයේ ගිලිහී යාම තුළ එතන "දෙයක් නොවන" ස්වභාවය දැනෙන්න ගන්නේ.

අපිට අරමුණේ සත්‍ය දැකීමේදී අපි මුලින් මෙනෙහි කිරීම සිදුවෙනවා. ඒ තුළ බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ දේශනා කළ දර්ශනය මහා සංයමයකින් පෙළ ගැස්වී අවසානයේ දෙයක් නොවන සත්‍යය තුළ මුකුත් නැති ස්වභාවයක් තමයි අත්දකින්නේ මේ අවස්ථා තමාටම සාන්දිට්ඨිකයි කියන්න පුළුවන්. ඒ තුළ මහා සැනසිල්ල නිරන්තරයෙන් අත්දැකිය හැකියි. මේ අන්ත දෙකේම මිදීම තුළ ඇතිවන සතුට නිරන්තරයෙන් පවතින සැනසීමක් මම දකින්නේ. එහි ප්‍රතිලාභ අපට අත්දකින්න පුළුවන්. ඒ සතුට පැවතීම තුළම තමා තමාටම අවංක වීම ඍජු ස්වභාවයක් ඇතිව කටයුතු කිරීම බය කියන සංකල්ප අභ්‍යන්තරය සකස් නොවීම අත්දැකිය හැකියි. යහපත් ලෙස අභ්‍යන්තරයෙන්ම පිරිසිදු චරිතයක් තමාටම දකින්න පුළුවන්.

මේ සියල්ලටම හේතුව අපගේ බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ නිවැරදිව තමා අවබෝධ කළ ඒ සත්‍ය දහම ලෝක සත්ත්වයාගේ යහපත පිණිස බුදුරජාණන් වහන්සේ දේශනා කළ ආකාරයට දේශනා කිරීමයි. ඒ තුළින් අප සැමගේ නිවීම පිණිස මේ කරන මහඟු කැපවීමට අපගේ ගෞරවය නමස්කාරය වේවා ! ඔබ වහන්සේට නිරෝගී සම්පත්තිය ලැබේවා ! සැමට නිවනින් සැනසීම ලැබීමට බුද්ධෝත්පාද දේශනා මහඟු ප්‍රාතිහාර්යකි.

තෙරුවන් සරණයි !



ක්ෂණික සිතක උදයවැය දැකීමමයි. අරමුණේ සත්‍ය දකිනවා කියන්නේ. ශබ්දය තුළ වර්ණය මැවෙන විට සිතේ හටගන්නා සිතුවිල්ල (පුටුව) බාහිර තියෙනවා කියලා ගැනීමමයි. (නාම රූප එකකුවීම) බාහිර තියෙනවා කියලා ගැනීමෙන් මෙතන මම ඉන්නවා. රූප්පනය පුටුවමයි. පුටුවමයි ආත්මය. පුටුව හොඳයි එහෙම නැත්නම් පුටුව කැඩිලා කියලා අල්ලා ගැනීමෙන් සුඛ දුක්ඛං දුක දුක්ඛං දෙකම දුකයි. මේ මොහොතේමයි අපි භවයක් සාදාගෙන ජාති ජරා මරණ ආදී සසරකට යන්නේ.

මේ මායාව හඳුනා ගැනීමෙන් සිත ගැන අවබෝධවී අනුසෝතයෙන් පටි සෝතයට එනවා. සත්‍ය ඥානය, දර්ශනය හඳුනා ගැනීමෙන් බාහිර දෙයක් නොව සිතේම හට ගන්නා සිතුවිල්ලක් බව හඳුනා ගැනීම තුළින් තමන්ට තමන්ගේ මමයා, මාන්නය තමන්ට හසුවීමට පටන් ගන්නවා. එය සිහියක් අවධිවීමයි. ඒ තුළ තමන්ගේ කෙලෙස් තමන්ටම දැන ගන්නට ලැබෙනවා. මේ පළමු අවස්ථා සවිතක්ක අවස්ථාවයි. එය මෙනෙහි වීම තුළින් සිත තමන්ටම පේන්න ගන්නවා.

මේ ශබ්දය, වර්ණය, වේගය තුළ මැවෙන රූප්පනය කුමක්ද කියා විදර්ශනය වීමෙන් ඒ තුළින්ම සමථය වැඩීම තමන්ගේ සිතේ හටගන්නා අරමුණ පැහැදිලිව පෙනෙන්නට ගන්නවා. එයයි අවධිමත් ස්වභාවය. මේ තුළින් විපස්සනා ඛනික සමාධිය හට ගෙන ඥානයක් අවධි වීම තුළින් අරමුණේ බැස ගැනීමක් නොමැතිව ඥානයට හසුවීම තුළින් තමන්ට අරමුණේ ගිනිගන්න ස්වභාවය නොදැනී යනවා. මෙයයි බුද්ධෝත්පාද දේශනා තුළින් අප හඳුනාගෙන තියෙන නිවන් මාර්ගය. තමන්ගේ කෙලෙස් තමන්ට හසුවීම තුළින් සම්මා සතිය තුළින් සම්මා සමාධියට පත්වී බාහිර ආයතන පහට මැවෙන සියලුම අරමුණු ගිනි ගන්නා ස්වභාවයකින් තොරව පැවතීමම අපි ලබන ලොකුම සැනසීම.

පළමුවෙන්ම සත්‍ය ඥානය දර්ශනය තුළින් සිතේ මායාව මනාව හඳුනා ගැනීම දෙවනුව කෘත්‍ය ඥානය යන මේ ආයතන වලින් ගන්නා අරමුණ ප්‍රායෝගිකව ප්‍රතිපදාවක් ලෙස ආයතන හයක් ක්‍රියාත්මක වී කරන බවත් කෙනෙක් පුද්ගලයෙක් බාහිරත් සිත තුළත් නොමැති බවත් අවබෝධ වීමෙන් කෘතක් ඥානය වශයෙන් තමන්ගේ සිතට දැනෙන සැනසීම තුළින් නිවනට ටිකෙන් ටික ලං වන බව ඥානයකට හසුවෙනවා. බුද්ධෝත්පාද දේශනා අසන තුරු අපට කිසිම දේශකයන් වහන්සේ කෙනෙක්ගෙන් මේ සත්‍ය ධර්මය අසන්නට ලැබුනේ නැහැ. අපි සිතුවේම පිං කිරීම තුළින්, දාන දීම තුළින්, චෛත්‍ය වන්දනා, අටපිරිකර පූජා කිරීම තුළින් අපට නිවන් දකින්න පුළුවන් බවයි. නමුත් තමන්ගේ සිතේ ඇති වන කෙලෙස් ලෝභ, ද්වේශ, මෝහ කෙලෙස් දියවීම තුලින් ලැබෙන පින සිත පිරිසිදු වීම තුළින් මේ නිවන අත්දකින බව බුද්ධෝත්පාද දේශනා තුළින් මනාව අපට පැහැදිලි වෙනවා. අපි අත්දකිමින් සිටිනවා. අපට තව කෙලෙස් තිබෙනව බව පැහැදිලිව පෙනෙනවා. අවසාන වශයෙන් මාන, උද්ද්ච්ච, අවිද්‍යා, ප්‍රහානය වීම තුළින් උතුම් රහත් බවට පත්වන බව බුද්ධෝත්පාද දේශනා තුළින් මනාව දේශනා කරනවා. බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ අපට දෙවන බුදුන් හා සමානයි. මේ සිතේ දුක්ගිනි නිවාලන ධර්මයක් දේශනා කිරීමට හැකි වන්නේම අනුත්තර ස්වභාවයක් ඇති මුනිවරයන් වහන්සේ නමකටමයි.

තෙරුවන් සරණයි !
නීලා රංජනි



# 1 "නිවනට මඟ සංසදය" නිස්සරණ මගට අත්වැලක් වනු පිණිස

## සිතින් මිදෙන මඟ - දුකින් මිදෙන මඟ නිවන් දකින මඟ - එයයි නිස්සරණ මඟ

විදර්ශනා ධුරය යටපත්ව කර්ම ඵලය බොදු සමාජයම වසාගෙන සිටින යුගයක, බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ ශ්‍රී සද්ධර්මය නැවත ලොවට විවර කරමින් හේතුඵල දහම දේශනා කිරීම ආරම්භ කළේ 2020 වසරේ දීය. 2023 වසර වන විට බුද්ධෝත්පාද දේශනා වලට සවන් දෙන ගිහි පැවිදි ශ්‍රාවක ශ්‍රාවිකාවන් පිරිස ක්‍රමයෙන් වැඩිවිය. ප්‍රායෝගික ධර්ම මාර්ගයේ ගමන් කරන ඔවුනට විවිධ ගැටළු ඇතිවීමත් සමගම, ඔවුන්ගේ කටයුතු සම්බන්ධීකරණය කරමින් වඩාත් කාර්යාක්ෂම ලෙස බුද්ධෝත්පාද දේශනා සමඟ යාවජීව කරනු පිණිස 2024 දුරුතු මාසයේදී නිවනට මඟ සංවිධානය බිහි කරන ලදී. එතැන් පටන් අද දක්වාම පියවරෙන් පියවර ඉදිරියට යමින් බුද්ධෝත්පාද ශ්‍රාවක පිරිස ධර්ම මාර්ගය තුළ ප්‍රායෝගික කරමින් ඉතා විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

ඒවා අතරින් කිහිපයක් සටහන් කරනු කැමැත්තෙමි.

- බුද්ධෝත්පාද දේශනා ශ්‍රවනය කරණ ගිහි පැවිදි දෙපක්ෂයම ප්‍රායෝගික පුහුණුව සඳහා මෙත් මල් ආරාම වෙත යොමු කරමින් අදාළ කටයුතු සොයා බලමින් ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට පහසුකම් සැලසීම. එහිදී අවමය සතියක හෝ ඊට වැඩි කාල පරිච්ඡේදයක් තුළ ආහාර පාන සහ නවාතැන් ආදී සියළු පහසුකම් නොමිලේ සපයා දෙනු ලැබේ. පුහුණුව අවසානයේ යෝගීන්ගේ අත්දැකීම් පිළිබඳ ඇගයීමක් සිදුවේ. එසේම ඔවුන්ගේ යෝජනා සහ අදහස් ලබාගෙන එම වැඩසටහන වඩාත් ඵලදායි ලෙස කරගෙන යාමට පියවර ගනු ලබයි.
- අන්තර්ජාල පහසුකම් නොමැති ශ්‍රාවක පිරිස අරමුණු කරගෙන කර්ම TV නාලිකාව (Peo TV - 113) ඔස්සේ දින පතා රාත්‍රී 8.00 සිට 9.00 දක්වා බුධෝත්පාද දේශනා විකාශනය කරේ. එය සම්බන්ධීකරණය කරමින් බුද්ධෝත්පාද රූපවාහිනී ශ්‍රාවක පිරිස වෙත අඛණ්ඩව දේශනා ගෙන ඒමට කටයුතු කරයි.
- බුද්ධෝත්පාද දේශනා වලට සම්බන්ධ ස්වාමීන් වහන්සේ නමක් හෝ මෙහෙණින් වහන්සේ නමක් විසින් ධර්ම දේශනාවක් සිදු කර ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය කර දීම.
- බුද්ධෝත්පාද ශ්‍රාවක පිරිස වෙනුවෙන් දිනපතා සූම් සාකච්ඡා වාර 8 ක් පැවැත්වෙන අතර එම කටයුත්ත නිසිපරිදි සම්බනිධිකරණය කිරීම මෙම සංවිධානය මගින් සිදුවේ.
- අඩු පහසුකම් සහිත ආරාම වලට යටිතල පහසුකම් ලබාදීම අවශ්‍ය පරිදි ඉඩ පහසුකම් වැඩි දියුණු කර දීම.
- ඉල්ලීම් අනුව අඩු පහසුකම් සහිත මෙත් මල් ආරාම වල ජල හා විදුලි බිල්පත් ගෙවීමට කටයුතු කිරීම.
- බුද්ධෝත්පාද දේශනා වලට සම්බන්ධ මෙහෙණින් වහන්සේලාගේ වෛද්‍ය පහසුකම් හා ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
- බුද්ධෝත්පාද දේශනා ශ්‍රවණය කරන ගිහි දායක පිරිසගේ ස්වකැමැත්තෙන් ප්‍රදානය කරන මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර, අවශ්‍යතාවය අනුව මෙත් මල් ආරාම වෙත බෙදා හැරීම.
- ආර්ථික අපහසුතා ඇති ශ්‍රාවක පිරිස වෙනුවෙන් අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබාදීම.

ඉහත සියලු කටයුතු ඉතා විනිවිද භාවයකින් යුතුව බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේගේ ඍජු අධීක්ෂණය හා උපදෙස් මත ක්‍රියාත්මක වේ. එසේම මෙම නිවනට මඟ සංවිධානය වර්තමානයේදී "මෙත්මල් පදනම" යටතේ ක්‍රියාත්මක වන සංවිධානයක් ලෙස පවත්වාගෙන යනු ලැබේ.

වර්තමානයේ විවිධ සමාජීය හා මානසික ගැටළු වලින් තෙරපී සිටින ලංකාවාසී සැම දෙනාටම මෙත් මුදිතා පෙරදැරිව හැකි සැම මොහොතකම කරුණාබරිතව පිහිට වීම මෙම සංගමය මගින් නිබඳවම සිදුවේ.

| | |
|---|---|
| දුක් ගිනි | නිවා |
| සදහම් | අසා |
| ලෝතුරු සැප | ලබා |
| නිවනට මඟ | නිසා |

සෙව්වන්දි වික්‍රමසිංහ



# 2 මෙත් මුදිතා සංවිධානය

අශ්‍රැතවත් පෘථග්ජනයාට ඉපදීම දුකකි. ලෙඩවීම දුකකි. මහලු වීම දුකකි. මරණය ද දුකකි. මේ ලෙසින් බලන කල පෘථග්ජනයාගේ මුළු ජීවිතයම දුක් ගොඩකි.

දුකෙන් මිදීමට නම්, සිතෙන් මිදිය යුතුය. සිතිවිල්ලක සත්‍යය දැකගත යුතුය. මීට වසර 2500 කට පමණ පෙර මේ සඳහා මග කියාදුන් තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය කාලයේ වැලි තලාවෙන් වැසී ගොස් සැඟව තිබුණි.

මෙවන් කාලයක ශ්‍රී සද්ධර්මය නැවත පුබුදුවාලමින් තම ජීවිතයම කැප කොට සත්‍යය ධර්මය අවබෝධ කරගනිමින් සහ එම ධර්මය ලෝ සත වෙත කරුණාවෙන් යුතුව දේශනා කරමින් සියලු සත්වයින් දුකින් මුදවා ගැනීම පිණිස බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ ගන්නා ලද උත්සාහය මෙතකැයි කියා නිම කළ නොහැක.

''බුදුන් වහන්සේ ජීවමානව සිටියදී ශ්‍රී සද්ධර්මය අවබෝධ කොට බුදුන් වහන්සේ දැක ගැනීමටය අප්‍රමාදීව වීර්යයෙන් කටයුතු කළ යුතුය'' යනුවෙන් බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ සෑම අවස්ථාවකදී ම දේශනා කරති.

ඕනෑම පුද්ගලයෙකුට උතුම් වූ ශ්‍රී සද්ධර්මය අවබෝධ කොට ගෙන ජීවමාන බුදුන් වහන්සේ දැකීමට අවශ්‍ය පසුබිම සැකසීම සඳහා ආර්යයන්වහන්සේ කටයුතු රාශියක් සංවිධානය කර ක්‍රියාත්මක කරමින් පවතී. බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය, බුද්ධෝත්පාද සමාජ සේවා පදනම, නිවනට මඟ වැනි සංවිධාන මගින් මේ වන විට විශාල සමාජ මෙහෙවරක් සිදු කරමින් සිටී.

එම කටයුතු වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණින් සහ ඉතාමත් කෙටි කාලයක් තුළ ධර්ම පණිවුඩය සමාජය තුළ ධර්ම පණිවුඩය සමාජය තුළ ව්‍යාප්ත කිරීම සඳහාත්, අසරණ වූ ප්‍රජාව ඉන් මුදවා ගැනීම සඳහාත්, නව සංවිධානයක්, ආර්යයන් වහන්සේගේ මඟ පෙන්වීමෙන් සහ අනුශාසකත්වයෙන් ආරම්භ කිරීමට කටයුතු සකස් කර ඇත.

මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණ ගුණයෙන් ඉස්මතු වන අයුරින් මෙත් මුදිතා සංවිධානය ලෙස මෙය නම් කර තිබේ.

බුද්ධෝත්පාද ශ්‍රාවකයින් ඒකරාශි කරගනිමින් දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් ගොඩ නැගීමට බලාපොරොත්තු වන මෙම සංවිධානය මගින් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරමු.

මෙහි ප්‍රධාන අරමුණ ආර්ථික, සමාජීය යහපැවැත්ම සඳහා කටයුතු කිරීමය. එම අරමුණ ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කිරීමට අපේක්ෂිතය.

- අඩු ආදායම්ලාභි පවුල් නගා සිටුවීම සඳහා විවිධ අයුරින් දායක වීම.
- අනුග්‍රහය ලැබිය යුතු පවුල් වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පොත්පත් ඇතුළු වෙනත් අවශ්‍යතා ලබාදීම.
- ප්‍රදේශයේ දුෂ්කරතා ඇති පන්සල්, ආරාම, වෙහෙර විහාර වැනි ආගමික ස්ථානවලට අවශ්‍ය ආධාර උපකාර කිරීම.
- ප්‍රදේශයේ දුෂ්කරතා ඇති පාසල්, දහම්පාසල් සහ එම ස්ථානයන්හි අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ආධාර කිරීම.
- විවිධ අභියෝග නිසා කඩා වැටෙමින් පවතින පවුල්වල මානසික මට්ටම නගා සිටුවීම සඳහා කටයුතු කිරීම.
- සමාජ සත්කාරයන් වෙනුවෙන් සමාජය දැනුවත් කිරීම සඳහා ප්‍රචාරණ කටයුතු සිදු කිරීම.
- ඉහත සඳහන් කාර්යයන් සියල්ලම සිදුකර ගැනීමට පින්වත් අප සැමගේ කාරුණික අනුග්‍රහයත්, සහයෝගයත් අත්‍යාවශ්‍යය.

ආදරය, කරුණාව, මෛත්‍රිය මිනිස් දහමේ මූලික ගුණාංගයෝ වෙති. එම ගුණාංග ශ්‍රී ලංකික අප සැමගේ සිත් සතන් තුළ අඩු වැඩි වශයෙන් පවතින ඉතා දුර්ලභ ලක්ෂණ වි.

මෙම ගුණාංග මිනිස් සිත් තුළින් ක්ෂය වී යන කාලයක මෙත් මුදිතා සංවිධානය බිහි කිරීම තුළින් යහපත් සමාජයක් ගොඩ නැගීමට දායක වීම අපගේ පරමාර්ථයයි.

මේ සිතුවිලිවලින් ගොඩනගාගත් සිර කුඩුවෙන් මිදී චේතෝ විමුක්තිය ලැබීමටත්, උතුම් මනුශ්‍යභාවය අර්ථවත් කර ගැනීමටත්, ගුණ දම් පිරි සමාජයක් ගොඩ නැගීමටත් අවශ්‍ය ශක්තිය ධෛර්‍යය ලැබේවා.

# 3 මෙත්මල් පදනම

කාලයේ වැලි තලාවට සැඟව ගිය සත්‍ය ශ්‍රී සත් ධර්මය නැවතත් අවදි කල බුද්දෝත්පාද ආර්යයන් වහන්සේ බුද්දෝත්පාද දේශනා තුලින් දුකින් පිරුණු පීඩිත ජනතාවට නිවැරදි ධර්ම මාර්ගය කියා දෙමින් ඔවුනගේ ජීවිත වලට මහත් අස්වැසිල්ලක් ගෙන ඒමට සමත් වනවා. මෙතෙක් කාලයක් මිත්‍යා දෘෂ්ඨී තුලින් පීඩිතව ධර්මයෙන් ඈත්ව පරිහානියක් කරා යමින් තිබූ සමාජය නැවතත් නිවැරදි මාර්ගයකට ඔසවා තැබීමට බුද්දෝත්පාද දේශනා හරහා බුද්දෝත්පාද ආර්යයන් වහන්සේ අපරිමිත උත්සාහයක යෙදෙනවා. සත්‍ය ධර්මය ලොවට හෙලිදරව් කරමින් ලෝක සත්වයා චිත්ත පීඩාවන්ගෙන් මුදවාලන්නට කටයුතු කරන උන්වහන්සේ ඊට සමගාමීව දරිද්‍රතාවයෙන් පෙලෙමින් අසරණභාවයට පත් මිනිසුන් නගාසිටුවීමට යමක් කල යුතු බව සිතනවා. බුද්දෝත්පාද ආර්යයන් වහන්සේගේ මහා කරුණාගුණය ලොවට විදහා දැක්වෙන තවත් එක් අවස්ථාවක් ලෙස මෙත්මල් සමාජ සේවා පදනම, බුද්දෝත්පාද ග්‍රන්ථ සංසදය මෙන්ම නිවනට මග සංසදය ද නිර්මාණය කිරීම පෙන්වාදිය හැකිය.  බුද්දෝත්පාද ග්‍රන්ථ සංසදය පිහිටුවමින් සත්‍ය ධර්මය ඈත ගම්මානවල සිටින තාක්ෂණික දැනුමක් නොමැති දරිද්‍රතාවයෙන් පෙලෙන ජනතාව අතරට ගෙනයාමට පොත් මුද්‍රණය කර බෙදා හැරීමට තුලින් උන්වහන්සේ කටයුතු කරනවා. එමෙන්ම අඩු ආදායම්ලාභී හිසට සෙවනක් නොමැති අසරණයින්ට නිවාස සාදා දීමේ උතුම් කටයුත්තට මෙන්ම දුප්පත් දරුවන්ට පාසල් උපකරණ බෙදා දීම, ගංවතුරෙන් පීඩාවට පත් ජනතාවට වියලි ආහාර ලබාදීම වැනි සමාජ සේවා කටයුතු ධර්ම ප්‍රචාරක කටයුතුවලට සමගාමීව සිදු කිරීමට බුද්දෝත්පාද ආර්යයන් වහන්සේගේ උපදේශකත්වයෙන් සංවිධාන ක්‍රියාත්මක වෙනවා. එමෙන්ම ධර්මය ප්‍රායෝගික පුහුණුවීමේ කටයුතු  ආරම්භවීමත් සමග ඒ සඳහා යෝග්‍ය ස්ථාන ගොඩනැගීම අවශ්‍ය වෙනවා. ඒ අනුව දැනට පවතින පන්සල් , ආරාම වැනි ස්ථාන අලුත්වැඩියා කිරීම, නව ස්ථාන සකස් කිරීම, වැඩි දියුණු කිරීමේ කටයුතු ආර්යයන් වහන්සේගේ උපදෙස් මත සිදු වෙනවා.

මේ ආකාරයෙන් බුද්දෝත්පාද ධර්ම දේශනා කටයුතු මෙන්ම සමාජ සේවා කටයුතු සහ පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමේ කටයුතු පුළුල්ව මේ සියලු කටයුතු එක් නෛතික රාමුවකට ගෙන ඒමේ අවශ්‍යතාව මතු වීමත් සමග බුද්දෝත්පාද ආර්යයන් වහන්සේගේ සංකල්පයකට අනුව සියලු සංවිධාන සහ ආයතන ඒකාබද්ධ කරමින් මෙත්මල් පදනම පිහිටුවීම සිදුවෙනවා. ඒ අනුව වර්ෂ 2024 අගෝස්තු 23 වන දින 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරමින් මෙත්මල් පදනම ආරම්භ වෙනවා.
වඩාත් පුළුල් සහ සුවිශේෂී අරමුණු සහිතව පිහිටුවන මෙත්මල් පදනම බුද්දෝත්පාද ආර්යයන්වහන්සේගේ උපදේශකත්වය යටතේ අධ්‍යක්ෂ මංඩලයක් මගින් කටයුතු සිදුකරනවා. මානව වර්ගයා තුල විවෘත මනසකින් යුත් අධ්‍යාත්මික සංවර්ධනයක් ඇතිකිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත ජනසන්නිවේදන මාධ්‍ය භාවිතා කිරීම, එම අධ්‍යාත්මික පුනර්ජීවනය ඇති කිරීම උදෙසා පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගීම, මානවයාගේ ජීවන සංතෘෂ්ඨිය ගොඩනැගීමට අදාල සුභසාධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මෙත්මල් පදනමේ සුවිශේෂී අරමුණු වෙනවා. මීට සමගාමීව හිසට සෙවනක් අහිමි අසරණ මිනිසුන් වෙනුවෙන් නිවාස ඉදිකිරීම, කුසට අහරක් අහිමි මිනිසුන්ට ආහාර ද්‍රව්‍ය ලබාදීම, ස්වභාවික ආපදාවන්ගෙ න් පීඩිත ජනතාවට සහන සැලසීම, අධ්‍යාපනික. සුරක්ෂිතතාව ඇතිකිරීම වැනි පුලුල් කාලීන අරමුණු රැසක් එකතුකරමින් බුද්දෝත්පාද ආර්යයන්වහන්සේගේ සංකල්පයකට අනුව පිහිට වූ මෙත්මල් පදනම හරහා අදවන විට මේ සියලු කටයුතු සිදුවෙනවා.

එමෙන්ම බුද්ධෝත්පාද දේශනා විකාශය වන Youtube නාලිකා විශාල ප්‍රමාණයක්ද, විස්ඩම් ඔෆ් ඒෂියා සහ බුද්ධෝත්පාද ධම්ම ඩොට් කොම් වැනි වෙබ් පිටුද මෙත්මල් පදනම යටතේ ක්‍රියාත්මක වන අතර බුද්ධෝත්පාද යුගයක අසිරිය ලොවට කියාපාන මහඟු මෙහෙවරක පුරෝගාමී ආයතනය බවට මෙත්මල් පදනම ගොඩනැගෙමින් පවතිනවා.

තෙරුවන් සරණයි.



# 4 බුද්ධොත්පාදෝ ධර්ම ග්‍රන්ථ සංසදයේ ආරම්භය සහ එයින් කරනු ලබන කාර්‍යයන් පිළිබඳ සංක්ෂිප්තයකි.

- බුද්ධෝත්පාදෝ ආර්යයන්වහන්සේ ප්‍රත්‍යක්ෂ ඥාණයෙන් දේශනා කරණු ලබන සත්‍ය ධර්මය ලොවට දායාද කිරීමේ උතුම් චේතනාව පෙරදැරිව 2022-10-02 දින මෙම ධර්ම සංසදය පිහිටුවන ලදි.

- එහි මූලික කර්තව්‍ය වනුයේ ආර්යයන්වහන්සේ විසින් සමාජ මාධ්‍යයන් ඔස්සේ දේශනා කරණු ලබන ධර්ම දේශනා සහ ධර්ම සාකච්ඡා බුද්ධෝත්පාද ශ්‍රාවක ශ්‍රාවිකාවන් විසින් එවනා ලද පසුව යතුරු ලියනය කොට මුද්‍රණය සඳහා යොමු කරනු ලබයි. මෙම කාර්යයන් සඳහා විශාල පිරිසක් ශ්‍රම දායකත්වය ලබාදෙයි.

- එම මුද්‍රණය කරන ලද ධර්ම ග්‍රන්ථ ලොව පුරා බෙදා හැරීම, විහාරස්ථාන සඳහා පුස්ථකාල සඳහා බෙදා හැරීම මෙම ධර්ම සංසදයේ උතුම් සත්කාරයකි. එම කාර්‍යයද ශ්‍රම දායකත්වය උපරිම ආකාරයෙන් ලබාදෙන සැදැවතුන් පිරිසකගේ උතුම් සත්කාරයකි.

- තවද මෙම සිංහලෙන් මුද්‍රණය කරණ ලද ග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට ලොව නොයෙක් රටවල් වල පිහිටුවා ඇති 'මෙත් මල්ආරාම' වලට බෙදා හැරීම ධර්ම සංසදයේ තවත් උතුම් කාර්යයකි.

- Peo TV කර්ම නාලිකාවෙහි (113) ඔස්සේ බුද්ධොත්පාදෝ දේශනා ප්‍රචාරය කිරීම වසර දෙකකට ආසන්න කාලයක සිට සිදු කරනු ලබයි.

- බුද්ධෝත්පාද දේශනා වල සංෂිප්ත ඇතුලත් අත් පත්‍රිකා සහ වෙසක් සුභ පැතුම් පත් මුද්‍රණය කර බෙදා හරිනු ලබයි.

- බුද්ධෝත්පාද ධර්ම දේශනා ඇතුලත් Pen drive, DVD තැටි පටිගත කොට බෙදා හරිනු ලබයි.

- මෙම සියලුම කාර්යයන් සිදු කෙරෙනුයේ අවිදු අන්ධකාරයෙන් දුක් විඳින ලෝ සතන් සත්‍ය ධර්මයට අවධි කර ඔවුන්ගේ දුක් ගින්දර නිමා කිරීම පිණිස වේ.

# බුදු හඬ - පාඨක දෝතට

## පොත් 35 කින්

- මාධ්‍යකරණය විවිධාංගීකරණයට හසුව ඇති මෙම පාඨක දහම් පවස සංසිඳවාලනු වස්, වසර 5ක් වැනි කෙටි කාලයක් තුළ නිර්මල සත්‍ය ධර්මයේ පණිවුඩය රැගත් පොත් 35ක් එළිදැක් වී ඇත. ඒ බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය 2022.10.02 දින පටන් කරන ලද මහගු මෙහෙයක ප්‍රතිඵල වශයෙනි. ඒ සමඟ ම බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේගේ දේශනා කර්ම TV නාලිකාවේ ප්‍රචාරය කිරීම, දිවයින පුරා පිහිටි පුස්තකාලවලට බෙදා හැරීම ද සිදුකර තිබේ. ලොව්තුරු බුදු වදන් හි මූලික හරය වූ දර්ශනය බෙහෙවින් ම සමාජයට සැඟව ගොස් තිබූ අඳුරු යුගය නිමා කිරීමට මෙසේ වන එළඹුම් බෙහෙවින් ම උපකාරීවනු ඇත. යූටියුබ් නාලිකාව ඔස්සේ දිගහැරුණු දහම් පණිවුඩ විවිධ කතුවරයන්ගේ උත්සාහයන් කරණ කොට මුද්‍රණද්වාරයෙන් පිට කෙරුණ ග්‍රන්ථ සමුදාය මෙසේ ය.

1. බුද්ධ දර්ශනය
2. සතිය කියන්නේ අපේ ගෙදර
3. මට මම නැතිවන හැටි
4. නිවැරදි නිවන් මග හමුවිය
5. මොහොතට අවදිය - (පොත් 2කි)
6. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍ය (පොත් 4කි)
7. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා
8. ආර්ය කමටහන්
9. ලොවම දෙදරයි
10. මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි
11. සූත්‍ර දේශනා (පොත් 3කි)
12. නොපෙනෙන සත්‍ය
13. සිතිවිල්ල මම නොවෙයි
14. සබ්බ සංඛාර සමථය
15. බුද්ධ ඥානය අචින්ත්‍යයි (පොත් 2කි)
16. සිතිවිල්ලක දෙයක් කොයින්ද
17. අති විශේෂ දේශනා
18. නිවනට යා යුතු මාවත ලිපිනය
19. ප්‍රතිපදාවේ ප්‍රායෝගික පුහුණුව තුළින් නිවන අත්දකිමු
20. ප්‍රායෝගික නිවන් මග
21. මේ ඔබ අත්දකින්නේ ඒ උතුම් නිර්වාණයයි.
22. The True Dhamma Has Awakend
23. The Little Monk

- මෙහිලා ඉතා වැදගත් මූලික දහම් කරුණු රැසකින් සමන්විත බුද්ධොත්පාදෝ ආර්යයන්වහන්සේ විසින් ම රචිත 'බුද්ධ දර්ශනය' පොත අති විශිෂ්ට කෘතියකි. ඔබ අප මෙතෙක් සොයමින් සිටි සෑම දහම් කරුණක් ම පාහේ සරලව සහ සංෂිප්තව මෙහි ඇතුළත්ව තිබේ. බස් වහර සරල ය. අවස්ථාවෝචිව ලිඛිත හා කතිත වහර යොදා ඇත. පිටු 264 කින් සමන්විත අතර සමාජය වරදවා වටහා ගෙන තිබූ දහම් කරුණු අවබෝධ ඥාණයේ මහා අවදිය විදහාලමින් නිවැරදිව ඉදිරිපත් කිරීමට සමත් ව ඇත.

- 'සතිය කියන්නේ අපේ ගෙදර' සිත නිවැරදිව මෙහෙයවීම පිළිබඳව මෙහිලා ඇතුළත් කොට තිබේ. විදසුන් නුවණ උපදවා ගනිමින් කටයුතු කිරීමේ දී හමුවන අත්දැකීම් ඇසුරින් දහම් මග ඉදිරිපත් කොට ඇත. බාහිර කෙනෙක් හමුනොවන අතර ඒ වෙනුවට තම සිත ම දැකීම හා සිහිය හා නුවණ පිහිටුවීම පිළිබඳ කියවෙන දේශනා අන්තර්ගත කොට ඇත. කෙළෙස් යුද්ධය ජය ගැනීමට මං පෙන්වයි.

- සක්කායදිට්ඨිය දුරුකරගනිමින් සම්මාදිට්ඨියට පත්වීම උදෙසා වන ප්‍රායෝගික පිළිවෙත හා ඉන් නිවැරදි අත්දැකීම් ඔස්සේ ධර්ම මාර්ගය විවරකර ගැනීමට මඟ පෙන්වා ඇති පොතකි, 'මට මම නැතිවන හැටි'. විවිධ පුද්ගලයින් සමඟ කරන ලද ධර්ම සාකච්ඡා මෙහි අන්තර්ගතය පුරවාලයි.

- ඒ ඒ තැන් හි අත්දැකීම් පැහැදිලි කරගනු වස් ගැටළු ඉදිරිපත් කොට ඇති සාකච්ඡා සමූහයකින් සමන්විත පොතකි 'නිවැරදි නිවන් මග හමුවිය,'. සමුදය හා අත්තගමය

- අරමුණක බැසගන්නා ස්වභාව හා ඉන් මිදීම පිළිබඳ කරුණු මෙන්ම මහා අනර්ඝ වූ ධර්ම පර්යායන් රැසක් මෙහි ඉදිරිපත් කර ඇත.

- 'මොහොතට අවදිය' පොත අවිද්‍යා අන්ධකාරය හා සම්මුතියෙහි බැඳීමෙන් වන සසර ගමන පිළිබඳ මනා තතු ඉදිරිපත් කර ඇති අපූරු දේශනා මාලාවකින් සමන්විත වූවකි. මූලිකව සත්‍ය ඥාණය ඇතිකර ගැනීමත් අනතුරුව නිවැරදි ප්‍රතිපදා මාලාව ඔස්සේ කටයුතු කිරීමත්, ක්ෂණ සම්පත්තිය ඇතිකර කරගැනීමත් මෙහි ධර්ම සාකච්ඡා මගින් ඉදිරිපත් කර ඇත. මෙය පොත් දෙකකින් සමන්විතය.

- 'අභිඥා ඥාණයට හසුවන පරම සත්‍ය' කොටස් හතරකින් සමන්විතය. සම්බුද්ධ දේශනයේ පරම ගාම්භීර බව විදහාලමින් කෙරෙන මහා ප්‍රාතිහාර්යාත්මක පැහැදිලි කිරීම් මාලාවකින් මේ පොත් සමන්විත වේ. සාකච්ඡා හා ඍජුව කෙරෙන ඉදිරිපත් කිරීම් ඇතුළත් ය.

- සසර බැම්ම දෙදරවාලන තවත් එක් අපූරු වෑයමකි, 'මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා,' පොත. නිවන් මග ප්‍රායෝගික වන ඔබට හමුවන එක් එක් අවස්ථා පිළිබඳ කෙරෙන පැහැදිලි ඉදිරිපත් කිරීමක් මෙහි ගැබ්ව ඇත. මේවා ලේයර්ස් දේශනා නමින් ද ඉදිරිපත් කර තිබේ.

- 'ආර්ය කමටහන්,' විසිරෙන මනස තැන්පත් කරගනිමින් සමාධියට අරමුණු කර ගනිමින් කටයුතු කිරීම හා ඒ පිළිබඳ කෙරෙන පැහැදිලි ඉදිරිපත් කිරීම්වලින් සමන්විතය. යෝගාවචර භූමියට සැබෑම මාර්ගෝපදේශනා රැසක එකතුවකි.

- 'ලොවම දෙදරයි', පොතින් ඉදිරිපත් කෙරෙනුයේ අවිද්‍යා ලෝකයේ දෙදරා යෑමයි. බුදුධෝත්පාද ආර්යයන්වහන්සේ විසින් කාලයේ වැලිතලාවට සැඟව ගිය අති නිර්මල ධර්ම මාර්ගය මතුකර ගැනීමෙන් අනතුරුව එය බිඳෙන් බිඳ සමාජය හමුවේ මුදාහරින්නට යෙදිණි. අසා සිටි ඇතැමෙක් විසින් නඟන ලද ප්‍රශ්න හා ඊට දෙන ලද පිළිතුරු ඇසුරින් සම්පාදිත මේ පොත කුඩා වුව ද බොහෝ දෙනෙකුගේ හිත සුව පිණිස ධර්ම පණිවුඩ රැසකගේ එකතුවකින් සම්පාදිතය.

- 'මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි', යන්න ආදර්ශ පාඨයක් සේ බොහෝමයක් බුදුධෝත්පාද ධර්ම ග්‍රන්ථයන්හී දක්වා ඇති අතර ඊට අමතරව එනමින්ම සුවිශේෂී වූ පොතක් ද එළිදක්වා තිබේ. 'නුවණැත්තෙක් වී සිතුවිලි මායාවෙන් මිදී මොහොතට අවදි වන්න' එහි එන එක් පරිච්ඡේදයක තේමාවයි.

- 'සූත්‍ර දේශනා', නමින් ඉදිරිපත් කර ඇති පොත් හතරකි. පිරුවාණා පොත් වහන්සේ ඇසුරින් ඔබ්බට ඇති සූත්‍ර බොහෝමයක් බුදුනුවනගේ පරිහරණයෙන් බැහැරව ඇත. එහෙත් සැඟවුණ ධර්ම පරියායන් රැසක් එසේ වන සූත්‍ර ඔස්සේ මතුකර ඉදිරිපත් කිරීම මේ වන විට සිදුව තිබේ.

- දැනුමෙන් නොව ප්‍රායෝගිකව කටයුතු කිරීමෙන් ඇතිවිය යුතු අවබෝධය හා ධර්ම මාර්ගය සකස්කර ගැනීම පිළිබඳ මනාව කෙරෙන පැහැදිලි කිරීම් රැසකින් සමන්විත දේශනා මාලාවක් 'නොපෙනෙන සත්‍ය', හි ඇතුළත් ය. "සක්මනට පැමිණෙනුයේ මා සමඟ ය. එහෙත් සක්මනෙන් පිටව යනුයේ මා අතහැර ය." බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේගේ




මහා ප්‍රාතිහාර්යාත්ත්මක ප්‍රකාශයේ ධ්වනිත අති ගාම්භීරාර්ථ සමුදාය කැටිකොට ඇති අවස්ථාවකි මේ.

- 'සිතිවිල්ල මම නොවෙයි', දක්වනුයේ 'උත්පාද වය ධම්මිනෝ' බුදු වදනෙන් පෙන්වා දෙන පරිදි නොපවතින නමුත් හටගන්නා ලොවක් ස්ථිරව තිබේ යැයි ගැනීමෙන් නිමක් නොවන සසර ඕඝයට සත්ත්වයා ඇද වැටෙන බවය.

- 'සබ්බ සංඛාර සමථය' පොතෙහි ප්‍රතිපදාව තුළ සියල්ලෙන් මිදෙන බව සැමට අත්දැකිය හැකි බව දක්වයි. එසේ ම භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිව්වනක් පිරිසට ම නිවන එක සේ අත්දැකිය හැකිය. දර්ශන ඥාණයෙන් ම සිදුවන අභ්‍යන්තර පරිවර්තනයට ප්‍රතිපදාව උපනිශ්‍රය වන බව ආර්යයන්වහන්සේගේ දේශනාවේ ගැබ්වේ.

- 'බුද්ධ ඥානය අචින්ත්‍යයි' පොත් දෙකකි. බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ අති විශිෂ්ට ලෙස පැහැදිලි කර දෙන නාම රූප විග්‍රය සාකච්ඡා මාර්ග යෙන් මෙහිලා ඉදිරිපත් කර ඇත.

- 'සිතිවිල්ලක දෙයක් කොයින්ද' තවත් සුවිශේෂී ඉදිරිපත් කිරීමකි. මනසිකාරය හෙවත් මෙනෙහි කිරීම සහ සිහිය පැවැත්වීම අතර වෙනස දැකීම ඉතා වැදගත් ය. ආර්යයන්වහන්සේ දක්වන පරිදි ලුණු රස සිතිවිල්ලක් නොවන අතර ලුණු කෑම සිතීම සිතිවිල්ලකි.

ප්‍රියංකා කුරුගල

මතු සම්බන්ධයි.
මීළග කළාපයෙන් බලාපොරොත්තු වන්න.



# මෙත්මල් අරණ සමාජ සේවා පදනම




බුද්ධොත්පාද ආර්යයන් වහන්සේගේ සිතේ පහළ වුණු කාරුණික සිතිවිල්ලක ප්‍රතිඵලයක් හේතු කොට ගෙන අප රටේ ජීවත් වන අසරණ මනුෂ්‍යයන් දුකින් මුදවා ගැනීමේ අධිෂ්ඨානය ඇතුව 2023.07.14 දින රජයේ ආයතනයක මෙම ආයතනය ලියාපදිංචි කරන ලදී.

මෙම ආයතනයේ කටයුතු සඳහා ආර්යයන්වහන්සේ කිසිදු විටක සහභාගි නොවන අතර එම කටයුතු උන්වහන්සේගේ මඟ පෙන්වීම හා අධීක්ෂණය යටතේ කාර්ය මණ්ඩලය විසින් හා මෙත්මල් අරණ මෙහෙණින් වහන්සේලාගේ සහභාගිත්වයෙන්, අපගේ දෙස්, විදෙස් ආධාරකරුවන් සමග එකට අත්වැල් බැඳ ගෙන, මූල්‍යම හා ද්‍රව්‍යයම දායකත්වයෙන් පවත්වාගෙන යන ආයතනයකි.

මෙත් මල් අරණ මධ්‍යස්ථාන අවට ජීවත් වන අඩු අදායම් ලාභි අසරණ පවුල් වලට උපකාරි කිරිම, දරුවන්ට අත්‍යවශ්‍ය පොත් පත් ඇතුළු අධ්‍යාපනයට අවශ්‍ය දේ සපයාදිම, අත්‍යවශ්‍ය ආහාර, ඇඳුම් පැළඳුම් ඇතුළු නඩත්තුවට අවශ්‍ය දේවල් සපයාදිම ආර්ථික ප්‍රශ්ණ නිරාකරණය කිරිමට හැකි පමණින් ආධාර සලසා දීම, එමගින් ඔවුන්ගේ ජීවිත වලට සුලු හෝ සහනයක් සලසා දෙමින්, ඒ පවුල් සංවර්ධනය කිරිම. එයට සමගාමිව ඒ අයට සෞඛ්‍ය සම්පන්න ජීවිතයක්, ආරක්ෂාව සැලසීම හා දිලිදුකම තුරන් කිරිම.

## අපගේ සේවාවන්




## අපගේ ව්‍යාපෘති

### කුසට අහරක් සිතට සැනසුමක් තේමාව යටතේ

**පළවන ව්‍යාපෘතිය නිකවැරටියේදී -**

නිකවැරටියේදී මෙත්මල් අරණ අවට අසරණ පවුල් සඳහා වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීම 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 16 වන දින සිදු කළ අතර ඒ සඳහා මූලිකත්වය දැරූ කොරියාවේ සිටින එම මහත්මා සහ පවුලේ සැම හා මුදල් ලබාදීමෙන්, අමුද්‍රව්‍ය සැපයීමෙන් සහ එම කටයුතු නිමකිරීම සඳහා ශ්‍රමයෙන් යන ආකාර වලින් සහයෝගය ලබාදුන් අන් සියලු දෙනාටත් අතිශයින් කෘතඥ වෙමු.

**මාතර දෙවන ව්‍යාපෘතිය ලෙස,**

මාතර මෙත්මල් අරණ අවට ගංවතුර උවදුර නිසා අවතැන්ව සිටින අසරණ අයට පිහිටවීමේ සමාජ සත්කාර වැඩසටහන ගංවතුර මධ්‍යයේ, වාහනයක්වත් ගමන් නොකරන අවස්ථාවක, ආර්යයන් වහන්සේගේ මූලිකත්වයෙන් අසරණ වි ඇති පවුල් වල විස්තර ග්‍රාම සේවක නිලධාරීතුමාගේ උදව් ඇතුව සොයා බලා ඒ පවුල්වලට වියලි ආහාර බඩු මල්ලක් ලබා දීමට කටයුතු කළ අයුරු ඔබට මේ පින්තූරවලින් දැකගත හැක.

**තුන්වන ව්‍යාපෘතිය**

තුන්වන ව්‍යාපෘතිය ලෙස හොරණ, පරගස්තොට, මිද්දෙණිය ප්‍රදේශයටද එම ආකාරයටම, අධික වර්ෂාව හේතුකොට ගෙන කළුතර දිස්ත්‍රික්කය තුළ ප්‍රදේශ කිහිපයක ගංවතුර උවදුරින් පීඩාවට පත් පවුල් කීපයක් එම ප්‍රදේශයේ මෙත්මල් අරණ මෙහෙණි ආරාමය සම්බන්ධ කොටගෙන, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී මහත්මියගේ අනුමැතිය අනුව, අසරණව සිටින පවුල් විස්සක් තෝරාගෙන, වියළි සලාක මල්ලක් සහනාධාර වශයෙන් ලබාදීමට කටයුතු කිරීම ඔක්තෝම්බර් මස 13 වන රැස්වී තීරණය කර අතර, මෙම කටයුත්ත සඳහා ඔක්තෝබර් මස පහළොස්වන ඉරුදින ගංවතුර ආධාර ලබා දෙන ලදී.

**4 වන ව්‍යාපෘතිය - මයියංගනය**

2023 වර්ෂයේ ඔක්තෝම්බර් මස 22 වන දින මයියංගනය මෙත්මල් අරණ අවට අසරණ ගොවි පවුල් සඳහා, වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීම මහියංගණය මෙත් මල් අරණ අවට සිටින්නේ හේන් ගොවිතැනේ නියැලී සිටින පවුල් වන අතර ඔවුන් යැපෙන්නේ හේන් වගා කිරීමෙන් වන අතර, වියලි කලාපයේ දී ඇතිවන දුෂ්කරතා නිසා ඔවුන් අසරණ භාවයට පත්වන එවන් අවස්ථාවක දී මෙවැනි ආධාර - වියළි සලාක ලබාදීම ඉතා අගය කොට සලකන බව පවසන ලදී.

**5 වෙනි ව්‍යාපෘතිය - රාජාංගනය**

2023 ඔක්තෝම්බර් මස 29 වන ඉරු දින මෙත් මල් අරණ මෙහෙණි ආරාමයේ මෙහෙණින් වහන්සේලා හා දායක පිරිස විසින් අවට අසරණ ගොවි පවුල් වලට වියලි ආහාර බඩු මල්ලක් ලබා දීම සිදු කරන ලදී.

## 6 වෙනි ව්‍යාපෘතිය - සූරියවැව

අසරණයින්ට පිහිට වෙමු යන තේමාව යටතේ මෙත් මල් සමාජසේවා පදනමෙහි හය වන වැඩසටහන පැවැත්වීමට 2023 නොවැම්බර් මස 05 වන ඉරු දින සූරියවැව මෙත්මල් අරණ අවට අසරණ ගොවි පවුල් වලට වියලි ආහාර බඩු මල්ලක් ලබා දීමට කටයුතු සිදු ලදී. මාතර ෆූඩ් සිටි ආයතනයෙන් ලබාගන්නා වියලි සලාක, සූරිය වැව මෙහෙණි ආරාමයට රැගෙන ගොස් බෙදා දීමේ කටයුතු කෙරෙනු අතර, එම ආධාර ඉතාමත් සතුටින් භාරගත් අතර, ඒවා බෙදා හැරීමට මූලිකත්වය දැරූ ආර්යන්වහන්සේට කෘතවේදය දැක්වූ අතර මෙත් මල් අරණ සමාජ සේවා පදනමට හා නන් අයුරින් උදව් උපකාර කළ සියලු දෙනාටම ස්තූතිය පුදකරන ලදී.

මෙත්මල් සමාජ සේවා පදනම, අසරණයින්ට පිහිටවීම සමාජ සේවය, කුසට ආහාරක්, සිතට සැනසුමක් යටතේ ආරම්භ කොට, ගංවතුරින් අසරණ වූ පවුල් සඳහා හා නියඟයෙන් විපතට පත් දුෂ්කර පළාත්වල සිටිනා පවුල් වලට වියළි සළාක ව්‍යාපෘති හයක් ලබාදි පළමු පියවර අවසන් කරන ලදී.

එම ව්‍යාපෘතී වලින් පවුල් 221 වියළි සලාක ලබා දුන් ආකාරය පහත වගුවෙන් ඔබට දැක බලා ගත හැක.

### කුසට අහරක් සිතට සැනසුමක්

| ව්‍යාපෘති අංකය | කුසට අහරක් සිතට සැනසුමක් | ප්‍රතිග්‍රාහික පවුල් සංඛ්‍යාව |
|---|---|---|
| අදියර 1 | නිකවැරටිය | 50 |
| අදියර 2 | මාතර | 20 |
| අදියර 3 | හොරණ | 20 |
| අදියර 4 | මහියංගනය | 47 |
| අදියර 5 | රාජාංගනය | 54 |
| අදියර 6 | සූරිය වැව | 30 |
| | ප්‍රතිග්‍රාහිකයන් එකතුව | 221 |




ඊලග සඟරාවට, මෙත්මල් අරණ සමාජ සේවා පදනමේ, දෙවැනි ව්‍යාපෘතිය වන ඉගෙනුමට රුකුලක් සිතට සැනසුමක් සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමු.

මෙම උතුම් කර්තව්‍යය සඳහා නන් අයුරින් උදව් උපකා කළ සියලු දෙනාටම මෙත්මල් සමාජ සේවා පදනම ස්තූතිය පුද කරමු.

මෙත්මල් අරණ සමාජ සේවා පදනම
පොසොන් සඟරාව 2025






















2025 වසරේ වෙසක් මස 27 වන අඟහරුවාදා වන අද මේ ලිපිය ලියන මොහොත වන විට අවසන් වී තිබුණේ උදේ 9.30 Zoom සාකච්ඡා මාලාවේ 898 වැන්නයි. එය දිනපතා නොකඩවා පැවැත්වුනු අතර මා එයට සම්බන්ධ වූයේ මාස 7 කට පමණ පෙර සිටයි. බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේගේ අපරිමිත කැපවීම, මඟ පෙන්වීම, නිරතුරුව කරන නිවැරදි කිරීම් හා උපදෙස් දීම සමගින් වැඩසටහන මෙහෙයවමින් මේ කාලය තුල පැමිණි මඟ දෙස ආපසු හැරි බැලීමක් කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම මෙම ලිපිය බුද්ධෝත්පාද මාසික සඟරාවේ පළමු කලාපයට ලිවීමට අවස්ථාවක් ලැබීමද මම භාග්‍යයක් කොට සලකමි.

Buddothpado Tamil https://youtube.com/@buddothpadotamil




## බුද්ධෝත්පාදෝ zoom සාකච්ඡා

සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් දිනපතා පැවැත්වෙන සියලුම බුද්ධෝත්පාදෝ zoom සාකච්ඡා සඳහා Zoom link https://zoom.us/j/91748075582?pwd=ZH1KQmwxOGNRUjJCVWtSSWkrNm50dz09

PEO TV - කර්ම වීවී නාලිකාවේ CH 113 දිනපතා රාත්‍රී 8ට මෙම දේශනා මාලාව මුල සිටම අසන (ආධුනික) කෙනෙකුට ඉතාමත්ම වැදගත් දේශනා මාලාවක් වෙයි. මෙම දේශනා පසුදින You Tube නාලිකාවේ විකාශනය වෙයි.

| 5:00 AM | 7:45 AM | 9:30 AM | 1:30 PM | 4:00 PM | 7:00 PM | 9:30 PM | 12:30 AM |
|---|---|---|---|---|---|---|---|
| උදෑසන | උදෑසන | උදෑසන | දහවල් | සවස | රාත්‍රී | රාත්‍රී | මධ්‍යම රාත්‍රී |
| Buddothpado Practical Experience | Buddothpado English | Buddothpado Zoom Discussion | Buddothpado Suthra Desana | Buddothpado Practical Experience | ආන්දෝලනාත්මක දේශනා | Buddothpado Zoom Discussion | Buddothpado Zoom Discussion |
| https://yhttps://youtube.com/@BuddothpadoDPE outube.com/@BuddothpadoDPE | https://youtube.com/@buddothpadoenglish | https://youtube.com/@Zoom-up2ik | https://youtube.com/@buddothpadosuththradesana | https://youtube.com/@BuddothpadoDPE | https://youtube.com/@buddothpadodharma | https://youtube.com/@Zoom-up2ik | https://youtube.com/@Zoom-up2ik |

වසර 2600 කට අධික කාලයකට පෙර ලෝසතන් එරී සිටි මිත්‍යාදෘෂ්ඨිය නමැති මඩ ගොහොරුවෙන් ගලවා ගැනීමට ලොව පහල වූ ඒ ශ්‍රේෂ්ඨ උත්තමයාණෝ දෙසූ සුපිරිසිදු ධර්මය කාලයේ ඇවෑමෙන් අත්‍යාවශ්‍ය හා ගැඹුරු ධර්ම කොටස් ගිලිහී, වෙනත් ආගම් වල ආභාෂය සමඟ සම්මිශ්‍රණය වී බොහෝ පරිහානියට පත්ව තිබෙන කාලයකි මේ, අවුරුදු ගනනාවක්ම අපි විවිධ දේශකයානන් වහන්සේලාගේ ඉගැන්වීමට අනුව දිව්‍ය ලෝක සැප සම්පත් ලැබ අවසාන මෛත්‍රී බුදුන් දැක නිවන් දැකීමට පෙරුම් පිරුවෙමු. වැඩි වැඩියෙන් ආමිස පූජා වලට නැඹුරු වී වැඩියෙන් පින් රැස්කර ගැනීමට උත්සුක වුනේ ඒ නිසාය. අපුඤ්ඤාභිසංඛාර නොහොත් අකුසල් නොකර සිටීමට වෙර දරණ මමෙක් හදා ගැනීමට වෙර දැරුවෙමු. කර්ම විපාක ගැන සිහිවන විට බියෙන් වෙවුලා ගියෙමු. බුදුරජාණන් වහන්සේ කර්මඵල වාදය ප්‍රතික්ෂේප කර හේතුඵල ධර්මය දේශනා කල බව ගැන අපිට පැහැදිලි අවබෝධයක් තිබුණේද නැත.

අනිත් පැත්තෙන් පැහැදිලි වුණ වැදගත්ම කාරණාව වූයේ බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේගේ දේශනාවල ඇති සරල එමෙන්ම ගැඹුරු බව හා අතිශයින්ම ප්‍රායෝගික ස්වභාවයයි.

ධර්මය සාන්දිට්ඨික බව බුදුරජාණන් වහන්සේ දේශනා කලේ මේ ප්‍රායෝගික පැතිකඩ තමන්ටම ගලපාගත් විට සිදුවන අභ්‍යන්තර පරිවර්තනය තමාටම නිරවුල්ව අවබෝධ කරගත හැකි නිසයි. මේ වන තෙක් අප ඇසූ දේශනාවල ප්‍රායෝගික පැතිකඩ වැඩිම බරක් දුන්නේ භාවනාවටයි. එයත් වැඩි වශයෙන් විවිධ ආකාරයේ සමථ භාවනා වූ අතර ඒ භාවනා බුදුන් වහන්සේගේ උපතටත් කලින් සත්‍ය සොයමින් දේශාටනය කල දහස් ගනන් අන්‍යාගමිකයන් පුරුදු පුහුණු කළ දේවල් විය.සතර ඉරියව්වේම අත්විඳින විදර්ශනා භාවනාව හා එයට සමානුපාතිකව සිදුවන කෙලෙස් දියවී යන ස්වභාවය ඉගැන්වූයේ බුදුරජාණන් වහන්සේ විසිනි.

ඒ සත්‍ය ධර්මය කාලයේ වැලිතලාවට වැසී යමින් තිබුනු අවදියක බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ වසර ගණනාවක ඉතා දීර්ඝ කාලයක සිදුකල ආර්යය පර්යේෂන,පොත පත පරිශීලනය,විදර්ශනා භාවනාවන් මගින් එය මතු කර ගැනීම ඇත්තෙන්ම බෞද්ධයන් වන අපිට අත්විඳින්නට ලැබුණු මිණිමුතු වැස්සක්මය. ඉන්පසු වසර 5 ක් තිස්සේ උන්වහන්සේ කල 5000 කට අධික දේශනා, සාකච්ඡා, ලියූ පොත් පත් මගින් මේ ඉගැන්වීම අනුගමනය කරන සියල්ලන්ම වෙරලේ සිට නොගැඹුරු මුහුදටත්, නොගැඹුරු මුහුදේ සිට ඉතා ගැඹුරු මුහුදටත් අනුක්‍රමිකව කැඳවාගෙන යන අයුරු ඇත්තෙන්ම කදිමය. ඉතාම වැදගත් කාරනය වන්නේ මේ මාර්ගය පිරිපහදු කර ගනිමින් අවබෝධය කරා යන විට තම තමන්ටම පැහැදිලිව දැනෙන කෙලෙස් දියවීම ,සැහැල්ලුව,සුමට වෙන ජීවන රටාවන් වෙනත් කෙනෙකුට අභියෝගයට ලක් කල නොහැකි වීමයි.

මාස 7 ක පමණ කාලයක් ආර්යයන් වහන්සේගේ අධීක්ෂණය යටතේ මෙම Zoom සාකච්ඡා මෙහෙය වීමෙන් මා ලද පන්නරය ගැනත් යමක් සඳහන් කල යුතු බව හඟිමි. වරින් වර ආර්යයන් වහන්සේ සමග සාකච්ඡා වලට සම්බන්ධ වී කෙටි කාලයකින් සාකච්ඡා මෙහෙයවීමට ඉදිරිපත් වන ලෙස කල දැනුම් දීම ඇත්තෙන්ම ඇති කලේ කම්පනයකි. නමුත් ඒ ඉදිරිපත් වීම තවත් සන්ධිස්ථානයක් වූවා සේම ඒ සාකච්ඡා වලින් ඉගෙනගත් කරුණු බොහෝ විය. ආර්යයන් වහන්සේ නිරතුරුවම මේ සියලු Zoom සාකච්ඡා වලට සම්බන්ධ වෙමින් ඒ ඒ තැනදි ක්ෂණිකව ඉදිරිපත් වෙමින් කරන නිවැරදි කිරීම්, උපදෙස් දීම්, සමහර අවස්ථා වල කරන වාග් ප්‍රහාරයන්, ඉදහිට කරන සුළු ප්‍රශංසාවන් යන සියල්ල අපේ මාන්නය බිඳ දැමීමටත්, අපව ක්‍රමයෙන් නිවැරදි දිශානතියකට තල්ලු කිරීමටත් උපකාරී වේ.තවත් අවස්ථාවකදී අප ගැටලුවකට ලබා දෙන පැහැදිලි කිරීමකට වඩා සම්පූර්ණයෙන් වෙනස් පිළිතුරක් උන්වහන්සේ ලබා දෙන්නේ අප දුර්මුඛ කරවමිනුයි.

සාකච්ඡා වලට සම්බන්ධ වන අප සියලු දෙනා මවුපියන්, සොයුරු සොයුරියන්, දරුවන් සිරවී සිටියේ මිත්‍යාදෘෂ්ඨිය නමැති ගොහොරුවේය. පන්සල් වල, දේවාල වල පැවතුන ආමිස පූජා, මහා පරිමානයේ පිංකම් වලින්ම සසරින් ගොඩ ඒමට උත්සහ දැරුවන් වෙමු. අටමහා කුසල්, පාරමිතා, තෙරුවන් ආදි කාරනා ගැන ලැබුණේ වෙනස්ම අර්ථකථනයන් වූ අතර ගාථා, සූත්‍ර, පිරිත්, ජාතක කතා ඇසුවේ ඒවායේ හරබර නිවැරදි තේරුම් කිසිත් නොදැනය. කර්මය ගැන තිබුනේ බියක්මය. බාහිර ලෝකයත්, එහි ජීවත් වී පින් පව් කර අවසානයේ මැරෙන්නට සිදුවන මමෙක් ගෙන් පිට කිසිවක් දැන සිටියේ නැත.

මෙවන් පසු බිමක මේ Zoom සාකච්ඡා දිනපතා උදේ 9.30 සිට පැය එක හමාරක් දෙකක් අතර කාලයක් පවත්වමින් තම තමාගේ ධර්ම ගැටලු විසදා ගැනීමටත්, දේශනා වල යම් නොපැහැදිලි කොටස් තේරුම් කර ගන්නටත්, එදිනෙදා මුහුණ දෙන අත්දැකීම් ධර්මයට ගලපා ගන්නා අයුරු දැනගන්නටත් ඉඩක් ලබා දීම තුලින් ධර්ම මාර්ගයේ කටු කොහොල් ඉවත් කරගෙන නිවැරදි කරගෙන යාමට ලැබෙන ඉඩ ප්‍රස්ථාව ඉතා වටිනාය.

අසන්නන්ගේ ගැටලු විවිධාකාරය. නමුත් ප්‍රායෝගිකය. හැමදෙනාටම පාහේ පොදු කාරනා බොහෝමය. නූතන යුගයේ පටාචාරාවන්, කිසාගෝතමියන්, රජ්ජුමාලාවන්, මෙන්ම දැනුමෙන් හා දෘෂ්ඨි වලින් සන්නද්ධ වූ උගතුන් දිග හරින ගැටලු, තර්ක, විවාද වල සාධාරන පැහැදිලි කිරීම් ලබා දීම පහසු නැත. ඒ හැමවිටම අපේ ගැලවුමට ශක්තිය සපයන්නේ එසැනින් ඉදිරිපත් වන ආර්යයන්වහන්සේයි.

ආර්යයන් වහන්සේ විසින් ගුවනට මුසු කළ පිවිතුරු සත්‍ය ධර්මය විද්‍යුත් මෙවලම්වලට සංරක්ෂණය කොට ඔබට නැවත සවන් දීම සඳහා අපගේ ශ්‍රාවක ශ්‍රාවිකාවන් මහත් කැපවීමෙන් පිළිසකර කොට ඇත. ඔබත් ධර්මය සොයනවා නම් පිවිසෙන්න .......... බුද්ධෝත්පාදෝ Zoom සාකච්ඡා, Youtube, Facebook, කර්ම TV රේඩියෝ නාලිකාවන්ට ..........

zoom

උදෑසන 9.30
රාත්‍රී 9.30
මධ්‍යම රාත්‍රී 12.30
බුද්ධෝත්පාදෝ zoom සාකච්ඡා

දිනකට තුන් වරක් පැවැත්වෙන මෙම Zoom සාකච්ඡාවට සහභාගී වී ඔබගේ දර්ශනය පිළිබඳ සියලුම ගැටලු සහ ඔබ නොදන්නා ධර්ම කරුණු ගැන විමසීමට අවස්ථාව ඇත. ලංකාවේ වේලාවෙන් මැදියම් රාත්‍රියේ පැවැත්වෙන සූම් සාකච්ඡාවට විවිධ රටවල් වලින් විශේෂයෙන් (බටහිර රටවල්) වල අයට පහසුව සඳහා එම වේලාවට යොමු කර ඇත. නමුත් සෑම කෙනෙකුටමදහම් ගැටලු ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

උදෑසන 5.00
සහ සවස 4.00
ප්‍රායෝගික ප්‍රතිපදාව

දිනකට දෙවරක් පැවැත්වෙන මෙම ප්‍රායෝගික Zoom සාකච්ඡා වලදී, ඔබ ප්‍රායෝගිකව ප්‍රතිපදාව පුහුණු වෙන අවස්ථාවලදී ඇතිවන ගැටළු සහ ප්‍රායෝගික පුහුණු ඉදිරිපත් කිරීමේදී දර්ශන අවබෝධයේ අඩුපාඩු ඇත්නම් ඒවා පිළිබඳව සාකච්ඡා කරයි.

උදෑසන 5.00 ගිහි අය වෙනුවෙන්, උදේ පාන්දර 5ට ප්‍රායෝගික ඉදිරිපත් කිරීමට හා ප්‍රායෝගික වන විට දී ඇතිවන ගැටලු නිරාකරණය කර ගැනීමට මේ වෙලාව වෙන් කර ඇත.

සවස 4.00 ප්‍රායෝගික ප්‍රතිපදා zoom සාකච්ඡාව, විශේෂයෙන්ම ආරාමවාසී, ස්වාමීන් වහන්සේලාට සහ මෙහෙණින් වහන්සේලාට වෙන් කොට ඇති අතර ගිහි අයටද සහභාගි විය හැක.

zoom

දහවල් 1.30
- සූත්‍ර දේශනාව

ප්‍රතිපදාව තුල ප්‍රායෝගිකව අත්දකින ධර්මය, බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ සූත්‍ර පිටකය තුලින් විග්‍රහ කිරීම. මෙම සදහම් කතිකාවත බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ, ස්වාමීන් වහන්සේලා සහ මෙහෙණින් වහන්සේලා සමඟ පැවැත්වෙයි. එලෙසම ඔබටත් සූත්‍ර පිළිබඳ ඇති ගැටලු මෙම Zoom සාකච්ඡාවේ දී ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙනවා ඇත.

රාත්‍රී 7.00
ආන්දෝල නාත්මක දේශනා

මෙම සදහම් කතිකාවතේදී ප්‍රධාන වශයෙන් සිදුවන්නේ මිථ්‍යාදෘෂ්ටියේ සිට සම්මා දිට්ඨියට පැමිණෙන්නට පසුබිම සකස් කිරීමයි.
සමාජයේ ඇති දෘෂ්ටීන් හඳුනාගැනීමට ඔබට අවස්ථාව ලැබේ. යොමු කරන ප්‍රශ්න වලට අනුකූලව පිළිතුරු ලබාදීමෙන් තම තමාගේ නිවන් මඟ ඇති දෘෂ්ටි හඳුනා ගැනීමට අවස්ථාව ලැබෙනවා ඇත.
ඉතාමත්ම වැදගත් සාකච්ඡාවක් වන මෙම සදහම් කතිකාවත බුද්ධෝත්පාද දේශනා අසා දර්ශනය පිළිබඳව වැටහීමක් ඇති අයට වඩාත් සුදුසු වෙයි.

උදෑසන 7.45
Buddothpado English Zoom

ඉංග්‍රීසි භාෂාවෙන් පැවැත්වෙන මෙම සාකච්ඡාවේදී ඉතාමත් සරලව මේ බුද්ධ දර්ශනය විද්‍යානුකූලව ගලපාගන්නා ආකාරය ඉංග්‍රීසි බසින් සාකච්ඡාවේ. ඉතාමත් දුලර්භ දහම් කරුණු මෙහිදී ඉස්මතු වේ. සියලු දෙනාටම සහභාගි වීමේ අවස්ථාව ඇත.

ඒ ඒ කාරනා වලට අදාල පැහැදිලි කිරීම කල යුත්තේ ඒ පුද්ගලයාගේ වයස, පවුල් පසුබිම, අධ්‍යාපනික මට්ටම, ධර්ම දැනුම, මානසික මට්ටම, කොතරම් පැටලිලි වලට හසුවී තිබෙනවාද ආදි සියලු කරුණු අධ්‍යනය කිරීමෙන් පසුවය. මෙහෙයවන අප ඒ ඒ අයගේ සපත්තුවට බැස ඒ කෝනයෙන්ම ගැටලුව දෙස බැලිය යුතුය. මේ කාරනා නිසා ඇත්තෙන්ම සාකච්ඡා මෙහෙයවන කණ්ඩායම ඉතා සංවේදී ලෙසින්, සූක්ෂම ලෙසින් ක්‍රමාන්විතව කතා බහට එක්වීම අත්‍යාවශ්‍යය. මෙය කිසි සේත්ම ප්‍රශ්න-උත්තර වැඩසටහනක් නොවන බව ආර්යයන්වහන්සේ නිතරම මතක් කරන කාරනයකි. මෙනයින් මේ Zoom සාකච්ඡා දෙපාර්ශවයටම අතිශයින්ම වැඩ දායක බව පැහැදිලි කරුණකි.

Zoom සාකච්ඡා දිනකට 8 ක් පැවැත්වීම ඇත්තෙන්ම ආශ්චර්යමත් කාරණාවක් බව නොකියාම බැරිය. අනෙක් සාකච්ඡා වට ගැන වෙන වෙනම සඳහන් වන බැවින් මෙහි සඳහන් කිරීම අවශ්‍ය නොවේ.

මේ සියල්ල පසු පස යෝධ බලකනුවක් සේ නැගී සිටින්නේ බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේයි.එමෙන්ම ඒ පසු පස මහා බල සේනාවක් ලෙසින් භික්ෂූන් වහන්සේලා ,මෙහෙනින් වහන්සේලා පෙරටු කොට ගෙන තාක්ෂණික හා අනෙකුත් පරිපාලන කටයුතු ජාලය මෙහෙයවන කල්‍යාණ මිත්‍රයන් අතිවිශාල සංඛ්‍යාවක් දිවා රෑ නොබලා කටයුතු කරති.වසරකට වැඩි කාලයක් මේ සාකච්ඡා වලට සක්‍රීයව සහාභාගී වූ වැඩි දෙනෙක් ඒ ධර්මයේ සත්‍යතාවය හා ඒ නිසා ඇති වන සැහැල්ලුව ඇස්පනාපිටම අත්විඳිමින් සිටිති.මේ නම් බුදුන් වහන්සේ දේශනා කල සත්‍ය පිරිසිදු ධර්මය නේදැයි ඔප්පු වීමට වෙනත් අටුවා ටීකා අවශ්‍ය නැත.

මේ ධර්මය තුලින් උන්වහන්සේ පෙන්වන්නේ ආත්මය යනු කුමක්ද,සිත සකස් වන්නේ කෙසේද ,ආයතන වලින් ලෝකයක් මැවෙන්නේ කෙසේද යන්නත්,මෙතන සිදු වන්නේ මමෙකුගෙන් තොර ක්‍රියාවලියක්ම පමණක්ම මිස වෙනත් ගත යුත්තක් නැති බවත්ය.නිවන් යනු ආත්ම ගනනාවක් පෙරුම් පුරා ලබාගත යුතු දෙයක් නොව එතැන එතැනම අත්විඳින දෙයක් බවය.පැහැදිලිවම නිවීම යනු අත් දැකිය හැකි සත්‍යක් බවය.ඒ කාරණාව මහත් ආශ්චර්යයක් නොවන්නේ දැයි ඔබම විමසා බලන්නැයි මම ආරාධනා කරමි.

මේ කෙරීගෙන යන මහගු කාර්යභාරය තව තවත් බලවත් ලෙසින් කරගෙන යාමට බුද්ධෝත්පාද ආර්යන් වහන්සේට ශක්තිය ධෛර්ය ලැබේවායි පතමින් මම උන්වහන්සේගේ පායුග වන්දනා කරමි.

# කිසිදා නොදුටු මම

1. බුදුහිමි නැති බවක් නැත මා හට දැනුනේ
මනසට මිගදාය මෙයවයි මට සිතු නේ
දම්සක් සුතුර ගෙනහැර දෙසමින් සොදිනේ
තුන් ලොව දිනාගන්නයි අප හැම එකතු උනේ

2. සම්දුන් දෙසන විට මනහර අන්ත දෙක
මුව පොව්වකුව සිටියම් මා මුව රැලක
සසරෙදි අසා ඇති ''ඇත නැත'' වචන ටික
හිමි අද දෙසුව නේ අවබෝධයෙන් දැක

3. විඤ්ඤාණය යනු රැවටෙන මායා ද?
හැම මොහොතක්ම ආරම්භයක් නේ ද?
ගැලවුණි සම්දුනේ අටලෝ දහමින් ද?
මේ දම් දෙසන්නේ සැරියුත් මා හිමි ද?

4. සුත මුත විඤ්ඤාත දකිනා ලෝකයට
මුලාවී සිටි බවක් දැනුනා සිතට
මනසින් නොදුන්නොත් ඔවදන් මේ කයට
මරණෙත් මරාගත හැකි යයි සිතුනි මට

5. මා අඳ, ගොලු, බිහිරි බව දහමින් දුටු වා
බුදු හිමි දෙසුව බණ තුල මේ බව කීවා
කිසියම් දිනක මම මා නම් දැක නැතුවා
මේ බව දැනෙනා විට තුන් ලොව දිටුවා

6. දෙව්ලොව සිටිය දෙවියකි හිමි මෙහි ආව
හිමි බුදුවන විටදි සිටියද බෝ මැඩ ගාව
දෙනතින් කරනා විටදි අනිමිස පුජාව
සසරේ අර සිදින හැටි දැක්කද බිද මායාව

7. කරනා විටදි මා සක්මන් භාවනාව
දැනුනා සිතට ඒ ලස්සන හුදෙකලාව
සිතිවිලි අතර වල්මත් වී ඇති මුලාව
කියලා දුන්නා මේ රුප්පන රටාව

අනිච්චං සංඛතං පටිච්චසමුප්පන්නං, ඛය ධම්මං, වයධම්මං, විරුග ධම්මං, නිරෝධ ධම්මං කමතු

තෙරුවන් සරණයි !

බුද්ධෝත්පාද ශ්‍රාවක
B.G.W. බානගල



## බුද්ධෝත්පාදෝ දෙමළ නාලිකාවBuddothpado Tamil

https://youtube.com/@buddothpadotamil මෙම නාලිකාව ඔස්සේ බුද්ධෝත්පාද දේශනාවල ඒ ධර්ම කරුණු දමිළ භාෂාවෙන් ඉදිරිපත් වේ.

**PEO TV (113)** - කර්ම TV නාලිකාව ඔස්සේ දිනපතාම රාත්‍රී අටට පමණ පැයක කාලයකට බුද්ධෝත්පාදෝ ධර්ම දේශනා විකාශනය වෙයි. මුලින්ම දේශනාවලට සවන් දෙන ආධුනික ශ්‍රාවක ශ්‍රාවිකාවන් සඳහා ඉතාමත් සුදුසුයි. මෙම දේශනා මාලාවෙන් බුද්ධ දර්ශනය, ප්‍රායෝගික ප්‍රතිපදාව, අභිඤ්ඤා දේශනා සහ සූත්‍ර දේශනා විකාශනය වෙයි. බුද්ධෝත්පාදෝ දේශනා කිසිම රේඩියෝ නාලිකාවක හෝ TV නාලිකාවක විකාශනය කිරීම සිදු නොවන අවස්ථාවේදී සහ විවිධ ස්වාමීන් වහන්සේලාගේ බලපෑම් මත මෙම දේශනා ප්‍රචාරය කිරීමට විරුද්ධතාවය තිබියදීත් ප්‍රඥා ටීවී නාලිකාවේ ස්වාමීන් වහන්ස එම විරුද්ධතාවයන් නොතකා බුද්ධෝත්පාදෝ දේශනා කර්ම TV නාලිකාවේ විකාශනය කිරීමට එකඟතාව පිළිබඳව පළමුවෙන්ම අතිශයින්ම ගෞරව පූවර්කව ස්තුතිවන්ත වෙනවා. එම දේශනාවලින් ඇත්තෙන්ම ප්‍රතිඵලයක් ලබා ගන්නේ දුක් පීඩා විඳින අහිංසක ජනතාවයි. දුරබැහැර පළාත්වල වෙසෙන YouTube පාවිච්චි කිරීමට නොදන්නා සහ ස්මාට් ෆෝන් නැති අයටද මෙම ටීවී නාලිකාව ඔස්සේ බුද්ධෝත්පාද දේශනා ශ්‍රවණය කිරීමට අවස්ථාව ලැබේ. මෙම දේශනා TV නාලිකාව ඔස්සේ විකාශනය කිරීමට ලංකාවේ මෙන්ම විදෙස්ගත ශ්‍රාවක ශ්‍රාවිකාවන්ද දායකත්වය දරා ඇත එම සියලුම දෙනාගේ සහයෝග අප ඉතා අගය කොට සලකනවා.




## බුද්ධෝත්පාදෝ රේඩියෝ නාලිකාව

https://global.citrus3.com:2020/public/buddothpadoබුද්ධෝත්පාදෝ රේඩියෝ නාලිකාව ඔස්සේද ඔබට බුද්ධෝත්පාදෝ ධර්ම දේශනාවලට සවන් දීමට පුළුවන. පැය 24 පුරාවටම මෙම නාලිකාව විකාශනය වේ. මෙහි ඔබට සරල ධර්ම දේශනා මාලාවකට සවන්දිය හැක.


ඔබට මෙම ආත්ම භවයේදී නිවන් දකින්න බැහැ කියා සිතුනාද?
ඔබට තවමත් බුද්ධෝත්පාද දේශනා කන වැකි නැතිද ?
එය ශ්‍රවණය කිරීමෙන් ඔබ දර්ශනාවබෝධයට පත්වේවි.
මෙත්මල් අරණක ප්‍රායෝගික වීමෙන් ඔබ නිවන අත්දකීවි....

මෙත් මල් අරණ ආරණ්‍ය සේනාසන

තබ්බෝව පල්ලෙගොඩ



**මෙත්මල් අරණ මෙහෙණි ආරාම**

- මාතර සූරිය වැව
- හොරණ කඹුරුපිටිය
- රාජාංගනය මහියංගණය
- මිහින්තලේ සූරිය වැව
- හොරණ ගම්පහ
- පොතුහැර මැදිරිගිරිය



# හස්ති ශෛලය පුරටත් මෙත්මල් විවේකාශ්‍රමයක් ..........

වසර 2500 පසු ගෞතම බුදුන්වහන්සේ දේශනා කල ඒ සත්‍ය ධර්මය නැවත ලොවට හෙලිකිරීමේ. මහගු කර්තව්‍ය සඳහා ආර්‍යභූමියට පරිසරය සැකසීමේ යුතුකම ඉෂ්ඨ කිරීම සඳහාම මේ ශ්‍රී ලංකා ධරණී තලයේ පහළ වූ ඒ බුද්ධ පුත්‍රයන් වහන්ස, විදර්ශණායාණියාණන් වහන්ස විසින් දේශනා කරන ඒ සත්‍ය දහම ශ්‍රවණය වූ බුද්ධ දියණියකගේ සිතේ පහළ වූ උතුම් සිතුවිල්ලක් ලෙස මේ පළමු වෙනි මෙත්මල් ආරණය භූමි පූජාව ඉතිහාසගත වී හමාරයි. කුරුණෑගල නගරයට ඉතා සමීපව එනම් කි මී 2 පමණ දුරින් පිහිටා ඇති නමුත් නිසංසල, හුදෙකලා බවකින් හා හස්තිශෛල්‍ය පුර නගරයට ආශිර්වාදයක් ලෙස දිස්වෙන බුදු පිළිම වයන්සේ මනාව දිස්වන මේ භූමි භාගය බුද්ධොත්පාද සත්‍ය බුද්ධ ධර්මයම ලොව පුරා විහිද පැතිර වීම පිණිසම සැකසි කාලය පැමිනෙණ තෙක් බලා සිටියා වැනිය. ධර්මලතා ඩැනියල්ස් මහත්මිය විසින් 2023 ජූලි මස 05 වැනි දින කරන ලද මේ අසදෘෂ පූජාව නිසා නිවන් මග පසක් කරගැනීමට මේ ස්ථානය හේතු උපනිශ්‍රය කරගනිමින් ඒ කරා ඇදී එන පිරිස එන්න එන්නම වැඩි වන බව මනාව විද්‍යාමාන වෙයි.

මෙම භූමි පූජාව ශ්‍රවණය වූ වහා ඒ සඳහා එක් වූ පිරිස අදටත් මහා කැපවීමකින් කටයුතු කරන ආකාරයට හේතුව නම් මේ නිර්මල සත්‍ය දහමේ ආශ්වර්යයක්මයි. බුද්ධොත්පාද ආර්යයන් වහන්සේගේ ආශිර්වාදය හා උපදෙස් පරිදි මේ භූමියෙහි 2023 සැප්තැම්බර් මස 17 වැනි දින රුක්රෝපණ වැඩ සටහනකින් භූමියේ කටයුතු ආරම්භ කිරීම එහි කටයුතු සඳහා මහා ආශිර්වාදයක් විය. සොහාදහමේ ආශිර්වාදය නොඅඩුව ලැබෙමින් සියලු කටයුතු ඉතාම පහසුවෙන් සිදුවෙමින් මේ දක්වා ආ ගමන ඉතාම සුන්දරයි.

මෙත් සිසිලස පැතිර යමින් සහ රුක්රෝපණයේ ආශිර්වාදය ද සමග භූමියේ සංවර්ධන කටයුතු සිදු කෙරිගෙන යන අතරතුරම අවම පහසුකම් මැද වුවද මාසික ධර්ම සාකච්ඡාවක් බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේගේ අනුශාසනා පරිදි පවත්වාගෙන යාමේ කටයුතු 2024 පෙබරවාරි මස ආරම්භ කර පවත්වාගෙන පැමිණි අතර 2025 වෙසක් පෙහෝ දින සිට පසළොස් වක පොහෝ දිනට සිල් සමාදම් වීමේ වැඩ සටහන ආරම්භ කරන ලදි. මේ උතුම් කටයුතු සඳහා බුද්ධොත්පාද ආර්යයන් වහන්සේගේ ආශිර්වාදය සහ සියලුම ගෞරවණීය පූජණීය ස්වාමීන් වහන්සේලාගේ සහ මෙහෙණින් වහන්සේලාගේ උපදෙස් උපකාර සහ ආශිර්වාද ඉතා ගෞරවයෙන් සහ නමස්කාර පර්වකව සඳහන් කරන්නෙමු.

බුද්ධෝත්පාද ධර්ම දේශනා ශ්‍රවණය කරමින් නිවන්මග කටයුතු කරන පිරිස සඳහා ධරම ශ්‍රවණය කිරීම, ධර්ම සාකච්ඡා, ප්‍රායෝගික පුහුණුවීම් සඳහා උපකාරයක් වශයෙන් බුද්ධොත්පාද ආර්යයන් වහන්සේගේ ආශිර්වාද සහ උපදෙස් මත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2024 වර්ෂයේ ජූනි 30 වැනි දින ගෞරවණීය ස්වාමීන් වහන්සේලාගේ මෙහෙණින් වහන්සේලාගේ පිරිත් සජ්ජායනය මධ්‍යයේ භූමිය පූජාකළ මහත්මිය ඇතුලු ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ සහභාගීත්වයේන මුල්ගල තැබීම සිදුවිය.

හස්ති ශෛල්‍ය පුර මෙත්මල් විවේකාශ්‍රම භූමියෙන් දසත හමායන මෙත් සිසිලසට බෝ සිසිලසක් එක් වෙමින් 2025 වර්ෂයේ මාර්තු මස 16 වැනි දින බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේගේ ආශිර්වාද අනුශාසනා මධ්‍යයේ බෝධි අංකුරයක් රෝපණය කිරීමේ උතුම් කටයුත්ත ගෞරවණීය ස්වාමීන් වහන්සේලාගේ සහ මෙහෙණින් වයන්සේලා වැඩම වීමෙන් පිරිත් සජ්ජායනය මධ්‍යයේ භූමිය පූජාකල මහත්මිය ඇතුලු පැමිණ සිටි පිරිසගේ සහභාගීත්වයෙන් සිදුවිය.

ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීම සනිටුහන් වන 2025 වර්ෂයේ ඒ සත්‍යයේ පණිවිඩය ලෝකය පුරා විහිදී පැතිර යාමට තෝතැන්නක් වූ කුරුණාගල මෙත්මල් විවේකාශ්‍රමයේ ඉදිකිරීම් කටයුතු මේ වන විට නිමා වෙමින් පවතින අතර තුන් වෙනි මහලේ ඉදිවන බුද්ධ මන්දිරය පොසොන් පොහෝ දින විවෘත කිරීමට කටයුතු කරමින් සිටි එතැන් සිට බුද්ධොත්පාද ආර්යයන් වහන්සේගේ උපදෙස් පරිදි මෙම ස්ථානයේ පූජ්‍ය පක්ෂය නේවසිකව වැඩ සිටිමින් ධර්ම සාකච්ඡා සහ ප්‍රායෝගික වැඩ සටහන් පවත්වාගෙන යාමට කටයුතු කිරීමටත් සෑම ඉරිදා දිනකම ධර්ම සාකච්ඡා පැවැත්වීමටත් ශ්‍රී සම්බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය උදෙසා බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ විසින් දේශනා කරනු ලබන සත්‍ය බුදු දහම ප්‍රචාරය කිරීම සඳහා මුද්‍රණය කරනු ලබන සියලුම ධර්ම ග්‍රන්ථ, සගරා, ධර්ම දේශනා ඇතුළත් "පෙන් ඩ්‍රයිව්", ඇතුලු සියලුම ශ්‍රී සද්ධර්මය ප්‍රචාරණය කිරීමට අදාල ද්‍රව්‍ය ශ්‍රවක පිරිසගේ පහසුව පිණිස මෙම ස්ථානයේ පවත්වාගෙන යාමටත් කටයුතු සිදුකෙරෙන බව සතුටින් දැණුම් දෙමු.

කුරුණෑගල මෙත්මල් විවේකාශ්‍රමයේ සියලු කටයුතු සඳහා ශ්‍රමයෙන් සහ මුදලින් දායකත්වය දැරූ සියලු දෙනාට තථාගත බුදුරජාණන් වහන්සේ දේශනා කල ඒ සත්‍ය ධර්මය එලෙසින්ම දේශනා වන බුද්ධොත්පාද සත්‍ය ධර්මය ශ්‍රවණයෙන් නිවන් මග පසක් කරගැනිමට ශක්තිය ධෛර්‍යය ලැබේවායි අධිෂ්ඨාන කරමු.

තෙරුවන් සරණයි !

# බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ

කාලයේ වැලිතලාවට සැඟව ගිය ඒ පරම සත්‍ය හෙළිකරන්නට සුදුසු මොහොත පැමිණෙමින් තිබේ. ප්‍රඥා හිරු කිරණ දසත හමනවා, දුකින් මිදෙන සිත් සැනසුම් සුසුමින් සැනසෙනවා, සත්‍යයේ මහා සිංහනාදය ඔබට ඇසෙනවද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා, විටෙක ඔබ සතුටින් - විටෙක ඔබ දුකින්, මේ දෝලනය වන ජීවිතය කුමක්ද? ඔබ සත්‍ය දන්නේ නෑ. සත්‍ය හෙළි කරන්නට අප සූදානම්. මේ ඔබේ කතාවයි. ඔබ සසර දුකින් මිදෙන කතාවයි. සිතෙන් මිදෙන මග, දුකින් මිදෙන මඟ, නිවන් දකින මග, එයයි නිස්සරණ මග.

බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු දෙදහස් පන්සීයක් ඉක්මවූ තැන ඔබ කොතෙකුත් අසා ඇති ඒ උතුම් නිවන් මඟ විවර වන බව. එය හුදෙක්ම කතාවක් නොවෙයි. මනුෂ්‍යත්වයක් විදිහට අප සියලු දෙනාම එකම තරංග ආයාමයක පිහිටා සිටින අතරයි ස්වභාවධර්මයට යටත්ව අපගේ මේ ජීවන කතාව දිගහැරෙන්නේ. අපි මනුෂ්‍යත්වයක් විදිහට විවිධ යුග පසු කලා, ගල් යුගය, එඬේර යුගය, කාර්මික යුගය, තොරතුරු යුගය පසුකරමින් අපි අද වෙනකොට කෘතිම බුද්ධි යුගයකට අවතීර්ණය වෙමින් පවතිනවා. මේ සෑම කාලයකම අප තනිව විඥ්ඤාණයක් ලෙස නොව ඒ සමකාලීන මානව සංහතිය තුළින්ම ආහාෂය ලැබූ විඥ්ඤාණ සමූහයක කොටසක් විදිහටයි විකාශනය ලැබුවේ. ඒ අනුව බලන කල, බුදුන් වැඩ සිටි කල ජීවත් වූ ජනතාව ඒ පරම සත්‍යයෙන් පෝෂණය වී අධ්‍යාත්මිකව දියුණු යුගයක් පසුකළා.

බුද්ධ පරිනිර්වාණයෙන් වසර පන්සීයක් වන තුරුම, පරම සත්‍ය හා රහතන් වහන්සේගේ යුගයෙන් පෝෂණය වූ මේ උතුම් දිවයින අධ්‍යාත්මිකව දියුණු ජන සමාජයකට නිවහන වුණා. එම රහතන් වහන්සේ පරම්පරාවෙන් පරම්පරාවට භාණක ක්‍රමය ඔස්සේ ධර්මය සංරක්ෂණය කළා. එම උතුම් යුග පුරුෂයන්ගේ සේවයේ ප්‍රතිඵලයක් විදිහට මේ ශ්‍රී ලංකාද්වීපය සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර පන්සීයක් යනතුරුම ධර්ම දීපයක් විදිහට බැබලුනා. ඒ යුගයයි ශ්‍රී ලංකාව "ලෝකයේ උතුම්ම රට" වීමට හේතු සපයන්නේ. අනාගතය පිළිබඳව ප්‍රඥාන්විතව දුටු මේ රහතන් වහන්සේ, රහතන් වහන්සේගේ යුගය අවසන් වන බව දැන, දැක, මෙම ධර්මය මතු පරපුරට රැකදීමේ අරමුණින් වළගම්බා රජ සමයේ, මාතලේ අලු විහාරයේදී අද ඔබ හඳුනන ත්‍රිපිටකය ලෙස ග්‍රන්ථාරූඪ කළා.

ඒ දියුණු අධ්‍යාත්මික යුගය එහි ස්වර්ණමය යුගය දැක අවසන, මනුෂ්‍ය විඥ්ඤාණය ද කෙමෙන් කෙමෙන් සියුම්ව කෙලෙස් සමග මුසුවී අධ්‍යාත්මිකත්වයෙන් බැහැරව ලෞකිකත්වය අගයන දිශාවට යොමු වුණා. ඒ සමග මනුෂ්‍ය සිත අධිගමය කළ දිශානතියෙන් බැහැරව බාහිරයේ ඇති වස්තූන් අගයන සමාජයක් ක්‍රමයෙන් බිහි වුණා. ඒ සමඟ පරම සත්‍යද, භික්ෂුවත් පන්සලත් තුළින් කෙමෙන් ගිලිහී ගොස් කාලයේ වැලිතලාවට සැඟවී ගියා. තණ්හාවට පත් මනුෂ්‍ය සිත, තව තවත් සොයමින්, අන්ධයන් ලෙස, තව තව බාහිර වස්තූන් තුළින් තම සිත සන්තර්පණය කරමින් විනෝදාස්වාදය සොයන, මම මාගේ යන තේමාවෙන් බරිත වුන ආකල්පමය රටාවක් අගය කරන, ජන විඥ්ඤාණමය එකතුවක් බවට පරිවර්තනය වුණා.

ඒ අතීතයේ සිට ජන විඥ්ඤාණය විකාශනය වූ ආකාරය ඔබ අධ්‍යනය කළහොත් එහි තියෙන සාමූහික ස්වභාවයන් පිළිබඳ හොඳ අවබෝධයක් ඔබට ලබාගත හැකි. එයයි ස්වභාව ධර්මය. මෑත ඉතිහාසය ගෙන හැර පෑවොත්, අප, ජන අරගල, කැරලි, යුද්ධ, සුනාමි, ගංවතුර, නාය යෑම්, පාස්කු ප්‍රහාර, ආර්ථිකමය කඩා වැටීම් පසුකර අද මේ භූමිය මත දෙපයින් නැගී සිටීමට එවැනිම මානසික යුද්ධයක් පසුකර තිබෙනවා. අද ඔබ පසු කරමින් සිටින්නේ ඉතාමත් වටිනා වැදගත් කාලපරිච්ඡේදයක්. මෙම ව්‍යසන සියල්ලටම මුහුණ දුන් ජනතාව, එම දුක් වලින් හෙම්බත්ව, මේ දුක නිමා කිරීමට මගක් හෝ මෙම ජීවිතයේ අරුත විමසන තරංග ආයාමයක ගමන් කරන කාලයකුයි අපි මේ පසු කරමින් ඉන්නේ.

සම්බුද්ධත්වයෙන් පසු බුදුරජාණන් වහන්සේ හමු වූ උපක ආජීවකයා බුදුන්ගෙන් ඇසුවේ, "ස්වාමීනි ඔබ මනුෂ්‍යයෙක්ද? ස්වාමීනි ඔබ දෙවියෙක්ද? ස්වාමීනී ඔබ කවරෙක්ද?" යන්නයි. එහිදී බුදුරජාණන් වහන්සේ පැවසුවේ මනුෂ්‍යයෙක් වත් දෙවියෙක් වත් සත්ත්වයෙක් වත් පුද්ගලයෙක්වත් නොව, මේ සියල්ල අධිගමය කළ "බුද්ධ" වන බවයි. ධර්මයට අනුව බුද්ධත්වය හෝ අරහත්වය තුළ අවබෝධ කරන්නේ සත්ත්වයෙක් හෝ පුද්ගලයෙක් කිසිදා නොසිටි බවත්, අදටත් නොසිටින බවත්ය. එහිදී මිනිස් මනස අභිබවා යාමක් තමයි සිද්ධ වෙන්නේ. මෙසේ මනුෂ්‍ය මනස අභිබවායාමක සිට සාමූහිකයක්, මිනිස් මනස පවතින්නක් යැයි විශ්වාස කරන තැනක් ඔස්සේ කෙලෙස් වල උපරිම ස්ථානයකට යාමට වසර දෙදහස් පන්සීයක් පමණ ගතවේ. ඊට සමගාමීව, මිනිස් මනස අභිබවා යෑමක සිට උපරිම කෙලෙස් මට්ටමකට ගොස් නැවත මිනිස් මනස අභිබවා යෑමක් දක්වා යෑමටද එබඳුම කාල පරිච්ඡේදයක් ගත වේ. සමාජය මෙම කර්තව්‍යයේදී දෙයාකාරයකට හැසිරේ. කොටසක්, මිනිස් මනසේ උපරිම දියුණුවකට ළඟා වී මිනිස් මනසේ හැසිරීම්වලට ඉතාමත් ආසන්න හැසිරීම් දක්වන, මිනිස් මනසේ ප්‍රතිමාවක්ම බඳු වූ කෘතිම බුද්ධිය නිර්මාණය කරයි. තව කොටසක් මේ අනවරත සංසාරය

නිමා කිරීමට, මිනිස් මනස අභිබවා යා හැකි ක්‍රම සොයමින් කාලය ගතකරයි. මේ දෙගොල්ලන්ම සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙදහස් පන්සීයක් ගිය තැන මංසන්ධියකදී මුණගැසේ. ඔබට මෙම කියැවීම අභිමුඛ වන්නේ ඒ ඉතාමත් වාසනාවන්ත මොහොතේදී.

පසුගිය දශක හතරක පමණ කාලයක සිට බුද්ධ දර්ශනයේ පිබිදීමක් අපි දකිමින් සිටින්නෙමු. බෞද්ධ සංස්කෘතියට සහ චතාවත්වලට පමණක් කොටුවූ පන්සල සහ භික්ෂුව නැවතත් මෙම ධර්මය ගැඹුරින් අධ්‍යයනයක සහ ගවේෂණයක සිටින බවත්, ජනතාවත් එම මධ්‍යස්ථානවල, තම කාලය ගත කරමින් දානයේ, ශීලයේ සහ භාවනාවේ යෙදෙමින් පරම සත්‍යයේ අත්‍යාවශ්‍යතාවය යුහුසුළුව පිළිබිඹු කිරීමට කටයුතු කළ බවත් අපි දැක්කෙමු. මෙම පසුගිය දශක කිහිපයක පමණ වන කාලයේදී ජනතාව මුහුණ දුන් ඉතාමත් සංවේග කර අවස්ථාවන්වලට මුහුණ දීමට ඔවුන්ට අවශ්‍ය වූ හවුහරණ ඔවුන්ට සත්‍ය ධර්මය විවර වී නොතිබුණු බැවින් නොලැබුණු බවද අපි දැක්කෙමු.

නමුත් සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙදහස් පන්සීයක් ගිය තැන, ජනතාවක් විදිහට අප විඳි එම වේදනාවන් අරුත් ගන්වමින් සහ මල් පල ගන්වමින්, වසර දෙදහස් පන්සීයක් තිස්සේ මෙම ධර්මදීපය තුළ දිවි පරදුවට තබා ධර්මය ආරක්ෂා කළ රහතන් වහන්සේත්, එදා සිට අද වෙනතුරු මේ ලක වැඩ සිටි සියලු භික්ෂූන් වහන්සේගේත් ධර්මය ආරක්ෂා කිරීමේ සියලු ප්‍රයත්නයන්ට ලැබිය යුතු නිසි වටිනාකම දෙමින්, රහතන් වහන්සේගේ යුගය උදා වූ බව ඔබට දන්වා සිටින්නේ මුදිතා ගුණය සනිටුහන් වූ සිතකිනි. ඒ සඳහා එදා මෙදා තුර ඉමහත් වෙහෙසකින් කැප වූ භික්ෂූන් සහ ගිහි දෙපාර්ශ්වයටම අපගේ නමස්කාරය වේවා!!!

සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර දෙදහස් පන්සීයක් ගතවූ තැන, කාලයේ වැලිතලාවට සැඟවී ගිය පරම ශ්‍රී සත්ධර්මය මේ දිවයිනේ අවදිවූ බව ඔබට කියන, එම සත්‍යයේ මල් වෙඩි ප්‍රහාරය, මෙතැන් සිට විඤ්ඤාණගත කරන " බුද්ධෝත්පාදෝ සඟරාව" ඔබ අතට පත් වන්නේ, බුද්ධෝත්පාදෝ ආර්යයන්වහන්සේ මේ සිරිලක වනගත ආරණ්‍ය සම්ප්‍රදාය තුළ, වසර තිහක් මුළුල්ලේ භාවනානුයෝගීව ඉමක් කොනක් නැර සැරිසරා, පසුව එම ව්‍රතය අතහැර, ඉහත කී උතුම් ආර්යයන්වහන්සේ විසින් ග්‍රන්ථාරූඪ කරන ලද ත්‍රිපිටකය මනාවවත් පරිපූර්ණ ලෙසත් පරිහරණය කොට, ඉන් නොනැවතී, ධර්මය ගවේෂණය කරන සියලු සමකාලීන ගුරුතුමන් ඇසුරේ එම ඉගැන්වීම් අධ්‍යයනය කොට, සත්‍ය ඥාණය මැනවින් දැන, දැක, කෘත්‍ය ඥාණය සහ කෘතඥානය යන තිපරිවට්ටය ඔස්සේ තම සිත තුළින් සාන්දිට්ඨික වූ බුද්ධ ධර්මය, ධර්ම අභිඥාව තුළින් හෙළිකිරීමේ ප්‍රතිඵලයක් ලෙසයි.

වසර තිහක් මුළුල්ලේ ධ්‍යාන මැනවින් ප්‍රගුණ කළ බුද්ධෝත්පාදෝ ආර්යයන් වහන්සේ අසඤ්ඤතලය දක්වාම තම සිත තුනී කිරීමෙහි ප්‍රයත්නයෙහි යෙදුනේය. මෙහිදී අසඤ්ඤ තලයේ එම සමාධිගත ස්වභාවයෙන් මිදීමට නොහැකිව, දින ගණන් නිරාහාරව තම ජීවිතය පවා අවධානයක පැවති දීර්ඝ කාල පරිච්ඡේදයේදී පවා තම ආත්ම සංඥාව සියුම් ලෙස පැවැති බව අවබෝධ කළ බුද්ධොත්පාදෝ ආර්යයන් වහන්සේ, මෙම සර්ව භාවනානුයෝගී ප්‍රතිපදාව නිවන් මගක් නොවන බව මැනවින් දැන හැඳින එය අත්හැර දමන ලදි.

කුඩා කල සිට දෙමව්පියන්ගෙන්, තමන් මිත්තණිය සහ මුත්තනුවන්ගෙන් ලැබුණු බෞද්ධ පසුබිම ඔස්සේ උතුම් ගුණයන්ගෙන් යුක්තව හැදී දැඩි වූ ඔහු, ස්වභාවධර්මයටත්, සතා සිවුපාවන්ටත්, මනුෂ්‍යයාටත් කුළුපග, මෛත්‍රී සහගත සහ කාරුණික අයෙක් වූයේය. නිතර භාවනාවටත්, ස්වභාව ධර්මය සමඟ කාලය ගත කිරීමටත්, කුඩා කල සිට යොමු වූ බුද්ධෝත්පාදෝ ආර්යයන් වහන්සේ, මෙම ලෝකයේ සත්‍ය පිළිබඳව, අවට පරිසරයේ දකින දෑ ඇසුරෙන් නිරතුරුවම අධ්‍යයනයක යෙදුණේය. එහි ප්‍රතිඵලයක් විදිහට, සිත කියලා දෙයක් නැති බවත්, සිත කියන්නේම මේ මොහොතේ මොහොතේ ඇතිවන නැතිවන සිතුවිල්ල බවත්, එම සිතුවිල්ල උත්පාදනය වන්නේ ආයතන පහෙන් එන රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශවල එකතුවක් ලෙස බවත්, ඒ ඇසුරෙන් මේ මොහොතේ ජීවය ලබන තනි සිත, අවිද්‍යාව නිසා, අර එළියේ තිබෙන්නේ ලෝකයත්, එය මේ අත්විඳින්නේ මම ලෙසත්, අජ්ජත්ත බහිද්ධා හෙවත් ඇතුලත පිට ගැටගැසීමකට යොමු කරන බවත්, එම නිසාවෙන් ලෝක සංඥා සකස් වෙන බවත්, එම මිථ්‍යාදෘෂ්ඨිය හැර මෙහි මම හෝ මාගේ හෝ ලෙස ගැනීමක් කළ නොහැකි බවත් තම සිත තුළින්ම මැනවිනුත් පූර්ණවත් අවබෝධ කළේය.

පූර්ණ අවබෝධයට පත් වූ බුද්ධෝත්පාදෝ ආර්යයන්වහන්සේ අනතුරුව මෙම ධර්මය Youtube ඔස්සේ බෙදා දීමට කටයුතු කළ අතර, ඊට ලැබුණු ප්‍රතිචාර අනුව තේරුම් ගත්තේ මෙම ගැඹුරු වූත් සියුම් වූත් ධර්මය අවබෝධ කිරීමට යෝග්‍යතාවයකින් යුක්ත මනසක් ලැබීම මෙකල්හි ඉතා දුර්ලභ කාරණයක් බවයි. එබැවින් ධර්මය බෙදා ගැනීමේ එම කාර්යය අත්හැර උන්වහන්සේ විවේක සුවයෙන් කාලය ගත කළේය. නමුත් 2020 කොවිඩ් වසංගතයෙන් මුළු ලංකාවම පීඩාවට පත් වූ අවස්ථාවේදී බුද්ධෝත්පාදෝ ආර්යයන්වහන්සේද, මරණාසන්න මොහොතකට අවතීර්ණ වූයේය. එහිදී මෙතරම් පරිශ්‍රමයක් යොදා අවබෝධ කරගත් දහම ලෝක සත්ත්වයා සමඟ බෙදාගත යුතු බවට සංඥාවක් ආර්යයන්වහන්සේ තුළ සකස් විය.

ඒ අනුව ලෝක සත්ත්වයා පිළිබඳ මෛත්‍රී සහගත චේතනාවෙන්, තමන් මහත් පරිශ්‍රමයක් යොදා මැනවින් සම්පූර්ණව අවබෝධ කරගත් පරම ශ්‍රී සද්ධර්මය නැවතත් බෙදා ගැනීමේ අරමුණින් බුද්ධෝත්පාදෝ Youtube නාලිකාව ආරම්භ කරන ලදී. 2021 දී ආරම්භ කළ බුද්ධෝත්පාදෝ Youtube නාලිකාව වසර පහක් වැනි ඉතා කුඩා කාලයකදී දේශනා 3300 ක් පමණක් බෙදා හැරීමට හේතුව වන්නේ බුද්ධෝත්පාදෝ ආර්යයන් වහන්සේගේ අප්‍රතිහත වීර්යය නිසාමය. අද වන විට එම නාලිකාවේ තිබෙන ප්‍රධාන දේශනා හැරුණු කොට, සෑම දිනකම පැය 24කට ආසන්න කාලයක් මුළුල්ලේ Zoom සාකච්ඡා අටක් ක්‍රියාත්මක වේ. එහිදී ධර්මය ශ්‍රවණය හැරුණු කොට, බුද්ධෝත්පාදෝ ආර්යයන් වහන්සේ සමඟ සම්මුඛව ධර්ම සාකච්ඡාව සහ ධර්ම විමර්ශනය සඳහා අවස්ථාව සියලු දෙනාට සැලසේ. ඊට අමතරව රෑ දිවා නොබලා උන්වහන්සේ සමඟ ඕනෑම වෙලාවක සාකච්ඡා කොට ඔබගේ ධර්ම ගැටලු නිරාකරණයටද අවස්ථාවේ සැලසී ඇත.

මේ වන විට මේ සත්කාරය සඳහා උන්වහන්සේට ධෛර්යය දීමට ධර්මය දැන දැක අවබෝධයට පත්ව මග පල ලැබූ විශාල පිරිසක් සම්බන්ධව කටයුතු කරයි. ඒ අතරින් බුද්ධෝත්පාදෝ ධර්ම ග්‍රන්ථ සංසදය විශේෂ තැනක් ගනියි. බුද්ධෝත්පාදෝ ආර්යයන් වහන්සේ විසින් දේශනා කරන ලද සම්මා සම්බුදු බුදුරජාණන් වහන්සේගේ පිවිතුරු වූත් නිර්මල වූත් පරම ශ්‍රී සද්ධර්මය පොත් වශයෙන් මුද්‍රණය කොට ලංකාව පුරා වෙසෙන, ධර්මය සොයන, ඉතා දුර බැහැර පිරිසටද, භික්ෂූන් වහන්සේලාට ද පරිත්‍යාග කිරීමේ මහගු කර්තව්‍යය මේ වන විටත් රාග ද්වේශ මෝහ ගින්නෙන් දැවෙන සිත් සතන් නිවාලීමට තරම් ශක්තිමත් වී ඇත.

"දුර්ලභං මනුස්සත්ව පටිලාබන්, දුර්ලභං සද්ධම්මස්සවනං, දුර්ලභං ක්ෂණ සම්පත්ති", වසර දෙදහස් පන්සියයකට පසු නැවතත් යළි පිබිදුණු ඒ පරම ශ්‍රී සද්ධර්මය, දුර්ලභ වූ මනුෂ්‍යත්වයක් ලබලා, ඔබ යම් වූ මිථ්‍යාදෘෂ්ටියක් දරන නිසා ප්‍රතික්ෂේප කරනවනම් මොනතරම් අභාග්‍යයක් ද? එම නිසා අපි ඔබට ආරාධනා කරනවා, මෛත්‍රී සහගත චේතනාවන් පෙරදැරි කොට ගෙන, ඔබගේ සියලු දෘෂ්ටීන්, සියලූම දෘෂ්ටින්, ඔබ මේ ලෝකය, ඔබ ගැන, ධර්මය ගැන, ආගම ගැන, බුදුන් ගැන, මිථ්‍යා දෘෂ්ටිය ගැන, දරන සියලු අදහස් සහ මත වාදයන් පසෙකටලා එන්න, බලන්න. කිසිම පක්ෂපාතීත්වයක් නැතුව මේ ධර්මය ශ්‍රවණය කරන්න, කියවන්න, ඔබගේ තුළින් විමසන්න. මෙහි සත්‍ය අසත්‍ය විමසන්න. පොතේ තිබෙන නිසාවත්, අපි කියන නිසාවත්, බුද්ධෝත්පාදෝ ආර්යයන්වහන්සේ කියන නිසාවත්, බුදුන් කියන නිසාවත්, කිසිම කෙනෙක් කියන නිසා නොවෙයි. ඔබම විමසන්න, මෙය නිවැරදි ධර්මයදැයි ඔබම විමසන්න. මෙහි අදහස ඔබ තුළින් ඔබටම සාන්දිට්ඨික වී නම් පමණක් මෙය සත්‍ය ධර්මයක් ලෙස දරාගන්න.

ප්‍රථමයෙන් ඔබ මෙම Youtube නාලිකාවෙන්, පොත් සහ සඟරාවන් හරහා ලබාගන්නා දැනුම, ඔබ දන්නා දැනුම ඇසුරෙන් බුද්ධිමය වශයෙන්, මෙම ධර්මය සත්‍යයක්දැයි විමසන්න. මෙය ඔබට වැටහේ නම්, ඔබට ඔබ තුළින් සත්‍යය යැයි දැක ගත හැකි ධර්මයක් නම් පමණක් බුද්ධෝත්පාදෝ ආර්යයන්වහන්සේ විසින් පෙන්වා දෙන ප්‍රතිපදාවෙහි පුහුණුවෙන්න. එම පුහුණුව ඔබ නිවන කරාම ගෙනයාවි. අපව එම පුහුණුව නිවන කරාගෙන ගියා මෙන් ඔබවද එම පුහුණුව නිවන කරාම ගෙනයාවි. බුද්ධ පරිනිර්වාණය අභියස, ආනන්ද තෙරුන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් විමසූ විට, "ඔබ වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු ගුරු තනතුරෙහි තබන්නේ කවුරුදැයි කියා", බුදුරජාණන් වහන්සේ පිළිතුරු දුන්නේ "සෝධම්මං පස්සති සෝ මං පස්සති" යනුවෙනි. ධර්මය දකින්නා, බුදුන් දකී. ඔබටත් ධර්මය ඔබ තුළින් දැකීම තුළින් බුදුන් දැකීමට හැකිවේවා. එවිට ඔබට වැටහේවි. ඔබ මේ දුර්ලභ මනුෂ්‍යත්වයක් දරාගෙන ඉපදී සිටින්නේ බුද්ධෝත්පාද යුගයක බව. ඒ උතුම් වූත්, සුන්දර වූත්, පරම ශ්‍රී සද්ධර්මය අවබෝධ කර ගැනීමට අවශ්‍ය ශක්තිය ධෛර්යය වාසනාව ඔබටත් ලැබේවා!!!.



# ශ්‍රාවක ලිපි
# How to Attain Nibbana – The Supreme Awareness

Is it truly possible to attain Nibbana in this very life? Have you fulfilled the ten perfections? Have you compensated for all your actions -Karma- performed throughout this long Sansaric journey – The cycle of birth and death? A myriad of questions arise in your mind the moment you, contemplate attaining Nibbana.

According to the revolutionary revelations of Buddha Dhamma through Buddhothpado sermons, would you believe if we said that every moment in which you experience, liberation from thought or the mind is, infact, a true experience of Nibbana?

The correct path to Nibbana is a process of realization – not a journey of merely compensating for past actions until they are nullified , granting access to a state called Nibbana. Another common belief is that this journey can be accelerated through acts of charity. As a result , the Buddhist community often does not hesitate to give generously even their last penny- with the fervent wish of accumulating merit to hasten their path to Nibbana, which they firmly believe will be attained after death.

The correct and precise path to Nibbana , as prescribed by the Buddha ; gradually disappeared from the world over the long passage of time. Fortunately, it has now been rediscovered and is being taught to us by a true practitioner of Vidarshana ( Insight Meditation) through the Buddhothpado sermons. These sermons offer step-by- step guidance and the experience of Nibbana – The Supreme Awareness – has now become self evident to the followers of Buddhothpado.

As mentioned above Nibbana is nothing but the liberation from the mind or thought. In other words , one must refrain from becoming entangled with stimuli ( Aramunu) which are merely projections of six sensory faculties. This deep realization arises naturally when one listens to the true Dhamma- The authentic Buddhist philosophy. A wide range of sermons catering to diverse age groups, educational backgrounds , levels of understanding are freely available on the Buddhothpado websites.

By listening to these sermons one develops the wisdom gained through listening (Srutamaya Gnana), which leads to true Wisdom Sathya Gnana). The path to Nibbana consists of three milestones as Sathya Gnana ( Understanding of true Buddhist Philosophy) ,Kruthya Gnana (Following the practical path- Prathipadawa- prescribed by the Buddha) and Kruthak Gnana ( Awareness of diminishing of defilements until they are nullified). At the very first stage, as a result of thorough listening of Buddhist philosophy , the illusory nature of the six sensory faculties. – especially the mind consciousness ( Mano Vingnana) – becomes self evident to the practitioner.

Once a proper understanding of Buddhist philosophy is established , the second stage, which is the practical path ( Prathipadawa) is introduced. This marks the beginning of Vidarshana ( Insight Meditation); through which the practitioner realizes that everything experienced in life happens entirely within the mind. In this stage , one gains a clear understanding of how the six sensory faculties function and how the mind is created in each moment. The next step reveals a deeper understanding of how thought arises, here , the actual root cause – the combination of Nama and Rupa ( name and form)- is recognized by the practitioner. This realization of the thought process liberates the individual from the illusion of the mind.. From that point onward, the practitioner realizes that the mistaken sense of self is nothing more than the activity of the sensory organs. The unique experience of the functional mind ( Kriya Sitha) also becomes established. Gradually , the practitioner comes to see that all phenomena arise autonomously , and as a result , the sense of a fixed self begins to dissolve.

A key indicator that the practitioner is on the the right path is the noticeable reduction in defilements and this is the stage mentioned above as the Kruthak Gnana. They experience the gradual diminishing of burning sensation arises within due to the self perception or the self existence feeling. This process unfolds naturally and culminates in the state of Nibbana- the Supreme Awareness.

On this journey , the role of the spiritual teacher ( Kalyana Mitra) is immensely important. Buddhothpado Aryanwahanse has devoted himself selflessly and tirelessly to relieving the suffering of the mankind. Because of this noble effort, the gateway to Nibbana is open to all of humankind. Attaining Nibbana is no longer just a dream , but a living reality with Buddhothpado.

Sudarma Gamage

# මා ආ ගමන

අපි පලමුවෙන් නිවන් මගට පවිසෙන්න නම් පළමුව වැඩ කටයුතු ටිකක් තිබෙනවා. අපි සංසාරේ යනවද නැතිනම් දිව්‍ය ලෝකේ යනවද නැතිනම් නිවන් දකිනවද යන වග.

මම නම් කළයුතු මාර්ගය වන්නේ මම පොඩි කාලේ සිට බුදුන් වහන්සේ කියන විට බුදු පිළිම වහන්සේ දකින විට ඇහෙන විට උපරිම ශ්‍රද්ධාවක් තිබුනා, තිබෙනවා ඒ වගේම උපරිම විශ්වාසයක් හා ශ්‍රද්ධාවක් තිබුන දෙවියෝ කියන විට බයක් ද තිබුනා. දේව ඇදහිලි උපරිම තිබුනා. බුදුන් වහන්සේටත් එසේමයි.

බුදුරජාණන් වහන්සේට දානේ ගිලන් පස තියෙන විට මා පොඩිකාලේ ඉඳන් බලනවා ඒවා අඩුවෙන වද මේ පූජා කරන ඒවට මොනවද වෙන්නේ කියන විමර්ෂනයක් මා හිත තුලම තිබුනා.

පාසල් ගිහින් අවසන් වු පසු විවාහයකට පත් වී දරු දෙදෙනාගේ මවක් වූ විට පසුව ස්වාමියා මාව අතරහැ ගියා. ඉන්පසු ධර්මයට මම ගොඩාක් ලං වුනා. දරු දෙදෙනාම ලොකු වී විවාහ ජිවිතයට පත්වුනා. දරු දෙදෙනාටත් එම විවාහ ජිවිතය අහිමි වුනා. නමුත් මම නොසැලි සිටියා. දැන් දරුවෝ යම් ධර්ම මාර්ගයකට වැටී තිබෙනවා. එයාලත් එදා දවස ධර්මයෙන්මයි ජිවත් වෙන්නේ. එසේ ඉන්නා විට පුද පූජා පවත්වමින් ඉන්නා විට ගමේ අක්කා කෙනෙක් මට ආර්‍යයන් වහන්සේගේ දුරකතන අංකය දුන්නා. 2021 දී ඔක්තෝම්බර්වල මන් බුද්ධෝතපාද ආර්‍යයන් වහන්සේට කථා කලා. එදිනම මට නැති වී ගියා වගේ ගල් ගැහිලා වගේ කඳුළු සලමින් දුන් අවවාද අහගෙන හිටියා. පිළිපැද්දා. එදා සිට අද වන තුරු දිනකට දෙතුන් වතාවක් ධර්මය අහනවා. දැනගන්නවා, ප්‍රායෝගික වෙනවා.

ඉන්පසු 2023-8-10 හෝ 9 වෙනිදා උදේ Zoom සාකච්ඡාවකදි ආර්‍යයන්වහන්සේට කතා කලා. එදින පැය 1 1/2, 2ක්ම. ඒ අනුව සියලුම දෙනාට ධර්මය පහදා දුන්නා. ආය 19 කථා කරා වගේ මතකයක් තියෙනවා. ආයනම් මට කථා කරේ නෑ. මම ප්‍රශ්ණයක් අහන්නම් කියලා ඉන්න සෑම විටම උන්වහන්සේ මම අහන්න කලින් උත්තරය දේශනා කරනවා. එහෙම එකක් තියෙනවා. මගේ ප්‍රශ්ණ සියල්ලටම ඊළග දේශනාව අහන කොට උත්තරය ලැබෙනවා. එසේ වන්නේ කොහොමද කියා මම නම් දන්නේ නෑ.

හැමදාම රෑ දවල් දෙකේ බණ ඇහුවත් ප්‍රායෝගික නැතිනම් අපිට නිවන් මග මගහැරෙනවා. අපි අතරමං වෙනවා. ප්‍රායෝගික නොවන අය කරන්නේ කටු අකුල් තියෙන කැලෑ පාර වල පාර පේන්නේ නැතිව අනුමානයෙන් මෙහේ වෙන්න ඇති කියා දැනුමේන් කැලෑවේ කටු උගුල් ඇන ඇන වැල් වල පැටලි පැටලි යනවා. එයට අතර මං වී පාර සොයාගන්න බැරිව කැලෑවෙම මැරී යනවා.

නමුත් අපිට බුද්ධෝත්පාද ආර්‍යයන්වහන්සේ නියම පාර පෙන්නලා කියලා මෙන්න මේ පාරෙන් යන්න කියලා නියම පාර කියලා දුන්නාම අපි දැන ගන්න ඕනේ ප්‍රඥාවෙන් සිහියෙන් ප්‍රායෝගිකව යන්න එවිට නිතරම මට මම නැති වන හැටි දැනෙනවා. මේ පාරේ යන්නේද ප්‍රඥාවන්තයින් පමණයි.

බාහිර ඇති කරගෙන ඇස, කන, නාසය, දිව ශරීරය මන යන 6 ට ගැටෙන්නෙත් නැතිව ඇලෙන්නෙත් නැතිව සියලුම අවශ්‍ය කටයුතු සිදු කරමින් ප්‍රායෝගික වෙමින් යන විට නිවන සමුවේ. අපි කියන්නේ නිකමට ඔහේ පලයන් කියලා. ඒ වගේ මේ 6 ටම (හයටම) එන දේ ප්‍රඥාවෙන් සිහියෙන් ඔහේ පලයන් කියා සිටීමෙන් අපට නිවන් මාර්ගය දැන ගැනීමට පුළුවන්.

අපිට වචන වලින් අකුරු ලියලා මේ දහම මට නම් කියන්න අපහසුයි. දැනෙන දේ තමාට එය දැනේවි. පසුව එය ඉබේම සිද්ධ වේවි. එතකම් ඔහේ පලයන් කියා යන්න ප්‍රඥාවෙන්.

අපි උඩුගම් බලා යන්න ඕන ගඟ පහලට ගලා යන අතර යනවා කියන්නේ. පුද පූජා පවත්වමින් බාර හාර, චාරිත්‍ර වාරිත්‍ර ඒව පහලට බසින ඒවා. උඩුගම් බලා කියන්නේ ඒ පහලට යන ඒවා දැනගෙන හොඳ නරක ඒවා ප්‍රඥාවෙන් දැක ගෙන දැන ගෙන ඒවා සියල්ලක්ම සිතුවිලි බව ද දැනගෙන අතහැරමින් යන එකයි. උඩුගම් බලා යන්නේ එවිට අර අනවශ්‍යය දේ හාම්පුතාට එය නොදැන යන බව තමාට වැටහෙනවා. පහතට යන්න පහසු උවත් උඩුගම් බලා යන්න පටන් ගැනීමේදී අපහසු උනත් යන විට ඔටෝ යනවා. එම නිසා වීර්‍ය අරගෙන උඩට පීනන්න. උඩුගම් බලා යන්න උත්සහවන්ත වෙන්න. මැදදී ඔටෝ යාවි.

තව එක් උදාහරණයක් නම් අපි ගිහිල්ලා නැති ගඟකට බහින්න තිබෙනවා. එතනින් එගොඩ නිවන තිබෙන්නේ නම් අපි දන්නේ නැතිව එකපාරට බැස්සොත් යටතැන් සොයන්න බැරිවෙනවා. සුළි තිබෙන තැන් දන්නේත් නෑ. එක පාරට පැන්නොත් මැරෙන්න තමා වෙන්නේ. එම නිසා එක කකුලක් හිමිහිට වතුරට තබා බොහොම හිමීට හිමිහිට සිහියෙන් ප්‍රඥාවෙන් අනෙක් කකුලත් හෙමින් තබමින් ගඟ යට ද බැලිය හැකියි. ප්‍රඥාවෙන් යනවා නම් ගඟ එච්චර යට නෑ. ගඟ මැදට ගිහාම තේරෙනවා. ප්‍රඥාවන්තයාට පේනවා ගඟ යට නෑ එගොඩ වෙන්න පුළුවන් කියා. එවිට ප්‍රඥාවෙන් සිහියෙන් එගොඩ වෙනවා. (ඔටෝ වගේ).

අපිට එගොඩ නිවන කරා යන්න ගඟේ මේ විදියට යන්න එවිට නියම ස්ථානයට යන්න පුළුවන් කියා දුන්නේ ගෞතම බුදුරජාණන් වහන්සේගෙන් පසුව ඒ ධර්මයම අපට පහදා දෙන්නේ බුද්ධෝත්පාදෝ ආර්‍යයන්වහන්සේමයි.

අපිට අම්මා තාත්තා දුවා දරුවෝ සමාජ කටයුතු සියල්ලක්ම කරමින් අතරහැරමින් ප්‍රායෝගික වෙමින් මේ ගමන අපට යා හැකිවේ. අප්‍රමාදව කටයුතු කරන්න. අපිට රෑ දවල් නොතකා නොසැලි ගැටෙන්නේ නැතිව ඇලෙන්නේ නැතිව යන්න පුළුවන් බුද්ධොත්පාදෝ ආර්‍යයන්වහන්සේගේ ධර්මය ප්‍රායෝගිකව අසා දැනග න්නවා නම් මට රිදෙනවා මට හරි වෙහෙසයි, මට දුකයි, යම් කෙනෙක් කියනවානම්, අසනවානම් ඒ අය යන්නේ කැලෑ පාර වල ගිහින් මැරී වැටෙන්ඩ. එම නිසා නිවන අවබෝධ කර ගන්න ඕනේ නම් යම් කෙනෙකුට බුද්ධොත්පාදෝ ආර්‍යයන්වහන්සේ ගේ දේශනා වලට සවන් දෙන්න ප්‍රායෝගික වෙන්න.

තෙරුවන් සරණයි
D.N.M.P.K. නානායක්කාර

**බුද්ධෝත්පාද දේශනා ඔබත් අසන්න**

**කාලය වැලිතලාවට සැඟව ගිය සත්‍ය ධර්මය නැවත අවදි විය**

# දස පාරමිතා

**සත්‍ය ලෙස දසපාරමිතා දැනගමු**

**01 දාන පාරමිතා - අරමුණු උපාදාන නොකරයි ගැනීම**
**02 සීල පාරමිතා - අරමුණේ නොගැටී නොඇලී වාසය කිරීම (රාග ,ද්වේශ ,මෝහ)**
**03 නෛෂ්කර්ම පාරමිතා - ආයතන පිනවීමෙන් වැළකීම**
**04 ප්‍රඥා පාරමිතා - විඤ්ඤාණ මායාවට නොරවටීම (අරමුණේ නොරැවටීම)**
**05 වීර්ය පාරමිතා - අරමුණේ නොරැවටීමට වීර්ය කිරීම**
**06 ශාන්ති පාරමිතා - අරමුණේ මිදීම තුළ උපදින ශාන්තිය**
**07 සත්‍ය පාරමිතා - අරමුණේ (නොරැවටීම) සත්‍ය දැකීම**
**08 අධිෂ්ඨාන පාරමිතා - අරමුණේ සත්‍ය දැකීමට ඇති අධිෂ්ඨානය**
**09 මෛත්‍රී පාරමිතා - අරමුණේ මිදීම තුළ සියල්ලම එකම බව දැකීම මහා මෛත්‍රිය**
**10 උපේක්ෂා පාරමිතා - අරමුණ දෙයක් නොකරගෙන වාසය කිරීම**

**දැස් අරින්නට කාලයයි**
**නිවන් දකින්නට කාලයයි**

බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ

# දුකට හේතුව තේරුනා...

ජාති ධම්ම සූත්‍රයේ බුදුන් වහන්සේ දේශනා කරන්නේ, අපේ ඉපදීම, ඇසේ ඉපදීම, ලෙසයි. අපට අවශ්‍ය වන්නේ දුකින් මිදෙන්නයි, නිවන් දකින්නයි. එහෙම නම් අපි මේ දුක හට ගත්තේ කොහොමද කියල විමර්ශනය කල යුතුයි. දුක තියෙන්නේ බාහිර ද? අපේම සිත තුලද, සිත පිළිබඳව විමර්ශනය කරනවිට සිත කියා දෙයක් නැති බවත් එතන එතන හට ගන්නා ධර්මතාවයක් බවත් අවබෝධ වේ.

උදාහරණයක් ලෙස අපි දරුවා කියන සංඥාව ගමු. දරුවා ඉපදෙන්න කලින් අපට දරුවෙක් හිටියේ නෑ නේද? දැන් ඔබට දරුවෙක් ඉන්නවා. ඒ දරුවා ඔබට දුරකථන ඇමතුමක් දෙනවා කියා සිතමු. දැන් ඔබට දරුවා කතා කරනවා කියන අරමුණ සකස් උනේ කොහොමද? දරුවා කියන ශබ්ද සංඥාව සකස් වන විටම පෙර පසු නොමැතිව දරුවා කියන හැඩතලයත්, දරුවාගේ සුවඳත්, දරුවාගේ පහසත් දරුවා කතා කරනවා කියන සිතුවිල්ලත් පහල වෙනවා. ආයතනවල ක්‍රියාවලියක් විදියට චිත්ත රූපයක් පහල වෙනවා, එය කෙනෙක් කරනවා නොවේ. ඒ, චිත්ත රූපය අරභයා විවිධ සිතුවිලි ඇති වෙනවා. දුක, සතුට, තරහ, වෛරය වගේ. මේ සියල්ල තියෙන්නේ සිතේ.

දැන් මේ දරුවා නැති උනා කියල හිතමු. ඒ දුක, ගින්න තියෙන්නේත් හිතේ. බාහිර නොවේ. දුක හිතේ තියෙනකම්, වසර ගණනක් ගියත් දෙමව්පියන් අඬනවා දුක් වෙනවා නේද? ඒ දුක තියෙන්නේ හිතේ. දරුවා පිළිබඳව දුකක් හෝ සතුටක් හට ගත්තා නම් ඒ දුක වේවා, සතුට වේවා දෙකම දුකක්මයි "සුඛ දුක්ඛං, දුක දුක්ඛං" බුදුන්වහන්සේ වදාලේ එහෙමයි. එහෙම නම් ඒ දුක තියෙන්නේ හිතේ බව පැහැදිලියි, හිතේ තියෙන කම් ඔබ දුක් විඳිනවා. බුදුන්වහන්සේ දේශනා කලේ සිත අවබෝධ කර ගෙන සිතින් මිදෙන මඟයි. නිවන් දකින මඟයි.

බුද්ධෝත්පාද දේශනා ලොවට විවර කරන්නේ බුදුන්වහන්සේ දේශනා කල ඒ පිරිසිදු නිවන් මඟයි. ඒ විදර්ශනා ධූරයයි. සමථය වැඩීම තුලින් කිසි දිනක නිවන් දැකිය නොහැකියි. සිතින් මිදෙන මඟ, නිවන් මඟයි. ඒ සඳහා සිත හැදෙන හැටි අවබෝධ කල යුතුමයි. දරුවා බාහිර ඉන්නවා කියන දුක රූප අන්තයෙනුත්, දරුවා හිතේ ඉන්න දුක නාමය අන්තයෙනුත් ඔබ දුක් විඳිනවා. අන්ත දෙකක ඔබ දුක් විඳිනවා. නමුත්, ධර්මය ගැඹුරින්ම විදර්ශනා කරන විට දුක් විඳින, විඳවන "කෙනෙක්" නැති බව වැටහේවි. එතන එතන සකස් වන ධර්මතාවයක් මිස දුක් වීමට "දෙයක්" හමු නොවේවි.
මේ ධර්මයේ ආශ්චර්යයි !

තෙරුවන් සරණයි!

චාන්දනී විජේසේකර

# බුද්ධෝත්පාද ආර්ය හිමි දෙසනා බුදු බණ

බුද්ධෝත්පාද ආර්යහිමි දෙසනා බුදු බණ
වැටහුණි නිවනට හෙලිකල මග යන මාවත මට
මං මාවත්වල පැටලී මම හෙව්වෙ නිවන් මග
මං පා යුග වඳිනෙමි බුදු මග පෙන් වූ හිමිහට

කුඩා කල සිටම පිනට බරවූ ගෙවූ කාලයක් මටත් තිබුන. දන් දීම අභයදානය වැනි දේ කුඩා කල පටන්ම තිබුණු පුරුද්දත් උනා.

තරුණ වියට එළඹෙනකොට දහම සොයා යාමේ කැමැත්තක් හට ගත්තා. නොයෙක් පන්සල්, ආරාම, අසපු තුළ දහම සොයා ගියා. අවු 31 දී පටන් නිවන් දකින මාර්ගය සොයා ගිය මම සිතා සිටියේ භාවනාවෙන්මයි නිවන් අවබෝධ වන්නේ කියලාමයි. ඒ හැම තැනකම පුරුදු කර වූ සමත සමාධිය වැඩුවා. එයින් මිදුන පසු නැවතත් තිබූ කෙලෙස් එලෙසම හට ගත්තා. තරහව දුරු කරන්න. ඒ පුද්ගලයා අරමුණු කරගෙන මෛත්‍රිය වැඩුවා. රාගයට අසුබය වැඩුවා. නමුත් ඒ කෙලෙස් ඒ විදිහටම නැවත හට ගත්තා. ඒ තුළින් ස්ථිරවම කෙලෙස් දුරු වීමක් උනේ නැහැ. නමුත් මා ඊට වඩා දෙයක් කොතනකවත් ඇසුවේ නැහැ.

පටිච්ච සමුප්පාදය ගිරව් වගේ කටපාඩම් කළා. දහම් සාකච්ඡාවල අහන දේට පිළිතුරු දෙන්න ලොකු දහම් දැනුමක් තිබුණා. ඒවට පිළිතුරු දුන්නාම හරි ආඩම්බරයක් දැනුණා. මම දන්නව කියල.

අවු 31 සිට අවු 54 වන තුරුම පුරා අවු 23 වන තුරුම මේ විදිහටයි පුරුදු කලේ. දන්දීම්, සිල්රැකීම්, වන්දනා ගමන් යාම, වෙහෙර විහාර සඳහා ශ්‍රම දායකත්වය, මුදල් ආධාර, කංචුක පූජාවන් ආදී නොයෙක් පිංකම් සිදුකළා. ඒවායින් බොහෝ පින් රැස් කර ගත්තා. සුගතියට, යන්න පින්කම් කළා. මේ ජීවිතයේ බැරිවෙයි. මෛත්‍රී බුද්ධ සාසනේ හරි නිවන් දකිවී කියලා හිතුව. නිවන කියල දෙයක් තියනවා කියලා එදා හිතුවා.

Youtube නාලිකාවල නොයෙක් ධර්ම දේශනා අසන අතරේ අවු 23කට පසු අහම්බෙන් වගේ මේ බුද්ධෝත්පාදෝ නම් වූ මිල කල නොහැකි අගනා මිණි කැටය නෙත ගැටුණා. සසරේ කළ මහා පිනකට.

මුලින්ම මේ දේශනා අසනකොට මොනම දෙයක්වත් තේරුනේ නැහැ. මොකක් ද මේ කියන්නේ කියල. ඒත් මේ දේශනාවල මොකක්දෝ වටිනාකමක් දැනුණා. වෙන කිසිම දේශනාවක් අහන්න සිතුනේම නැහැ. එදා පටන් මේ දක්වාම අවු 2 ක් පුරාවටම මේ දේශනා තුලම රැඳෙන කොට යමක් තේරුම් ගියා.

සිත අවබෝධ කිරීම තමයි කල යුත්තේ කියලා. සිත කියන්නේ අරමුණමයි. ඇහැට කනට නාසයට දිවට කයට සිතට මැවෙන දේ ඇත්තක් නෙමෙයි. ඇසට පෙනෙනවා විතරයි. වර්ණ හැඩතලයක්. ඇසට පුටුව පේන්නේ නැහැ. ඒක සිතුවිල්ලක්. සිතුවිල්ලෙත් දෙයක් නැහැ. ශබ්ද වර්ණ, ගන්ධ, රස, උණුසම සීතල තද ගතිය මේ සියල්ලෙන් පුටුව කියල දෙයක් මොන්ටිසෝරි වයසේ දරුවා හිතේ හදාගත්ත. මේ වෙලාවේ පුටුව හැදුනේ. පෙර සංඥා නව සංඥා වෙලයි මේ සියල්ල කෙනෙක් දෙයක් නැතිව සිදුවන ආයතන ක්‍රියාවලියක් විතරමයි බව මේ දේශනා තුලින්මයි අසා දැනගත්තේ. මම කියලාකෙනෙක් නැති අනාත්ම ස්වභාවය. කිසිදිනෙක අසා නැති දහමක්. බාහිර අපි සිතන දේ නැති බවත් සිතෙත් දෙයක් නැති බවත්. ආයතන ක්‍රියාවලියක් විතරම බවත්, මෙතන මම කියල කෙනෙක් නැති බව ඇසෙන කොට ටික ටික අවබෝධ වෙන කොට දැනෙන සැනසිල්ල කොතරම් ද ....... එදිනෙදා දවස ගතකරපු විදිහ සැහෙන්න වෙනස් වෙලා.කනට ඇහෙන ශබ්ද මගෙ කරගෙන එදා විඳපු දුක් ගින්න අඩු වෙමින් යන බව දැනෙනවා කවදාවත්ම මීට කලින් දැනිල නැහැ. හැමදේම මගේ කරගත සිතින් විඳපු දුක් ගින්න ...... මොන තරම් මුලාවක ද අපි හිටියෙ කියල දැන් ටික ටික තේරුම් යනවා මොහොතකට ගින්නක් එනකොට ඒක දැනෙනවා. ඒ ගින්න නිවන විදර්ශනාව නම් වූ මාණික්‍ය රත්නයත් දැන් දකිනවා. කෙලෙස් ගිනි ටික ටික දියවෙවී යන බව දැනෙනවා. එදා දැනුමට පමණක්ම තිබූ ආසවඛ්‍ය ඥානය අද අත් විඳිනවා. අනේ. මේ වටිනා බුද්ධෝත්පාද දේශනා ලෝක සත්වයාටම ඇසෙත්වා ! ඒ දේ ඇසීමට සිත් පහල වේවා. ... !

බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේට නමස්කාර කරමි.
සාදු .... සාදු .... සාදු .....

අලව්වේ ඩී. එම්. එස්. දමයන්ති



# මම යන ගමන් මග

බෞද්ධ පරිසරයක හැදුනු වැඩුණු දැනට අවුරුදු (64) විශ්‍රාමික ගුරුවරියක් වශයෙන් මා හඳුන්වා දිය හැක. මම එසේ මා හඳුන්වා දුන්නත් මේ එක තැනකවත් මම නැති බව බුද්ධෝත්පාදෝ ආර්යයන්වහන්සේගේ ධර්ම දේශනා තුළනි මා දකමින් යන්නෙමි.

මේ මැතක් වන තුරුම 'මම' යන වචනය මහා බරක් විදියට එසේ නොමැති නම් එය සාපයක් විදියට දැක්කෙමි. එසේ වවුත් ඒ උතුම් ආර්යයන්වහන්සේගේ ධර්ම දේශනා තුළින් මම යනු කවුදැයි අවබෝධ කරගනිමින් සිටිනා විට එම බර නැතහොත් ඒ සාපය දියවෙමින් එය හුදෙක් අපේ ආයතන පහේ සහ මනස නැමති ආයතනයේ ක්‍රියාවක ප්‍රතිඵලයකට 'මම' කියා මම ඇදා ගත් දෙයක් බව ඉතා සෙමින් දකින විට ක්‍රමයෙන් සැහැල්ලු ස්වභාවයකට පත්වන බව දකිමින් මේ ගමන යන්නෙමි. එය ඉතා මන්දගාමීව තිබෙන අවස්ථාවක මා මේ මොහොතේ සිටින්නේමි.

අද මේ ගමන යෑමට ඒ උතුම් බුද්ධෝත්පාදෝ ආර්යයන්වහන්සේගේ ධර්ම දේශනාවලට මීට මාස දහතුනකට පමණ පෙර මග පෙන්වූ ඒ මගේ මිතුරිය මම අදත් ඉතා කෘතඥ පූර්වකව සිහිකරමි. විවිධ වූ ස්වාමීන් වහන්සේලාගේ ධර්ම දේශනාවලට සවන් දෙමින් ඒ සෑම දේකටම සාධුකාර දෙමින් ගිය මට ආර්යයන් වහන්සේගේ පළමු දේශනාවෙන්ම යම්කිසි දෙයක් දැනුණි එය කුමක්දැයි වැටහුනේ නැතත් මෙතන මම නැවතිය යුතු බව නම් මට පැහැදිලි විය. ටික කාලයක ධර්ම දේශනා හා සාකච්ඡා ශ්‍රවණයකිරීමට පටන් ගතමි. ඉන්පසු ඇති වූ ප්‍රශ්න ඇසීමට ධෛර්යයක් උපදවා ගතිමි. එහෙත් මා ආර්යයන්වහන්සේ සමඟ කතා කරන විට මාගේ හෘද ස්පන්දනය ඉතා වේගවත් වූ සැටි දැනුනත් මා ඉතා සංයමයෙන් කතා කලෙමි. ඒ සෑම අවස්ථාවකම උන්වහන්සේ මා සිතුවිලි වලින් එසේ නැත්නම් විඤ්ඤාණ මායාවට හසුවෙමින් සියල්ල දකනි බව පෙන්නුම් කළේය. උන්වහන්සේ මට මේ බුද්ධ දර්ශනය පැහැදිලිව ධර්ම දේශනාවලට සවන් දෙමින් අවබෝධ කරගන්නා ලෙස උපදෙස් දුන්නේය.

උන්වහන්සේගේ ධර්ම දේශනා වලට සවන් දෙන විට මම ඒ තේරුම් ගත්තා සේ හැඟුණත් එය මොහොතට පමණක් බවත් එය මට මාගේ එදිනෙදා ජීවිතය තුළින් දැකීමට නොහැකි බව මා නොදුටුවෙමි. දවසේ සෑම ධර්ම දේශනාවකටම සවන් දීමට උත්සාහ කලෙමි. එය ශ්‍රවණය කිරීමට නොහැකි වූ විට මා මහත් කැළඹිල්ලකට පත්වුණ ෙණමි. මා හුදෙකලා ස්ථානවලට ගොස් එය ශ්‍රවණය කළේය හුදකලා පරිසරයකව තිබූ නිවසට තවත් සාමාජිකයන් එකතු වී එය ඝෝෂාකාරී වන විට මට මහත් අකමැත්තක් ඇතිවිය එළිපිට නොපෙන්නුවාට මා ඇතුළතින් ගැටුණි. එක් දිනක් මාගේ අසල්වැසියෙක් ඔහුගේ දරුවාට බැණ වදින විට මා කෝපයට පත්වූ ආකාරය සාකච්ඡාවකදී මා ආර්යයන්වහන්සේට ප්‍රකාශ කළෙය් මා බාහිර ලෝකයේ ඇත්තක් කරගෙන මහා මාන්නයකන් ඒවා දෙස බලන ආකාරය දකිනා ලෙසත් එය මේ ආයතනවල ක්‍රියාව තුළින් අත්දකින ලෙසත් උන්වහන්සේ පෙන්වා දුන්නේය. එසේ නැතහොත් මේ ධර්මය කිසි දිනක අවබෝධ කරගත නොහැකි බව මා කම්පනය වන ආකාරයෙන් ඉතා ඍජු ලෙස උන්වහන්සේ පෙන්වා දුන්නේ. එය මා තුළට කාවැදුණි. එම සාකච්ඡාවෙන් පසු මට එය දරාගත නොහැකිවිය. මා සසල වුණි. ඒ රාත්‍රිය මා නිදිවර්ජිතව ගත කලෙමි. මම වැළපුණි මා කම්පනයට පත්වුණි මා මෙතෙක් දැනුමෙන් ලබා ගත් දේ මෙනෙහි කරමින් යන්තමින් දවස් කීපයක් ගත කළෙමි. එහෙත් කෙසේ හෝ මේ ආර්යයන්වහන්සේගේ පණිවිඩය තේරුම් ගත යුතු බව පසුව මම තරයේ සිතාගත්තෙමි. ක්‍රමයෙන් ධෛර්යමත් වූ මා නැවත නැවතත් ඒ සාකච්ඡාවලට සහභාගී වී තව තවත් ධෛර්යමත් වූවෙමි. ආයතන හයේ ක්‍රියාවලිය බලමින්. ඒ ක්‍රියාවලියට භාරකාරත්වයක් දැරූ මම ක්‍රමයෙන් දිය වන බව දකින්නෙමි. ඉතාමත්ම සුළුවෙන් මාගේ තිබෙන ඒ බර ස්වාභාවය දියවෙන බවත් එය ඉතාමත්ම සෙමින් සිදුවන බවත් දකමි . එය කීමටවත් නොහැකි සෙමින් සිදුවන දෙයක් වුවත් තවත් මා වැනි කෙනෙකුට ප්‍රයෝජනයක් වේවායි සිතමින් මෙය ලිවීමට අදහස් කළෙමි. ඒ ගමන් මග අපට පෙන්නු උතුම් ආර්යයන්වහන්සේගේ පාද නමස්කාර කරමි.

තෙරුවන් සරණයි !

කල්‍යාණි



# නිවන් මගට උපනිශ්‍රය වන බුද්ධෝත්පාදෝ ප්‍රායෝගික පුහුණුව

බුද්ධෝත්පාදෝ ධර්ම දේශනා ශ්‍රවණය කරන සෑම දෙනාම ඉන්නේ ඉතාමත් සතුටින් බව අපට පැහැදිලි වෙනවා. දුක හැදෙන්නේ සිත නිසා බවත්, මැවෙන ලෝකයට රැවටෙන බවත්, ඒ නිසාම ගින්න හැදෙන බවත් බුද්ධෝත්පාද ආරයන්වහන්සේ දේශනා තුළින් පැහැදිලි කරන නිසා හැමෝටම වැටහෙනවා. ඒ නිසාම ඔවුන් සතුටින් ජීවත් වෙනවා.

ඒ සඳහා උදව්වක් හැටියට ප්‍රායෝගික පුහුණුවීමේ වැඩසටහන් ආර්යයන් වහන්සේ විසින් සකස් කරදී තිබෙනවා. විශේෂයෙන් බුද්ධෝත්පාදෝ ධර්ම දේශනා ශ්‍රවණය කරමින් තම නිවෙස් වල සිටම ප්‍රතිපදාවේ යෙදෙන ශ්‍රාවක ශ්‍රාවිකාවන් උදෙසා 'ඌම් තාක්ෂණය ඔස්සේ සෑම දිනකම අලුයම පහටත් (5.00) සවස හතරටත් (4.00) වැඩසටහන් දෙකක් විසුරුවා හරිනවා. මේ දේශනා යූටියුබ් නාලිකා තුළින් ද ශ්‍රවණය කිරීමේ පහසුකම සකසා තිබෙනවා.

මෙත්මල් ආරාම වල නේවාසික පුහුණු වීම් කර ගැනීමට කැමතියි අය සඳහා සති පුහුණුවක් සූදානම් කර තියෙනවා. මෙහිදී බුදුරජාණන් වහන්සේ විසින් දම්සක් පැවතුම් සූත්‍රය තුළින් ලෝක සත්ත්වයාට අවබෝධ කර දුන් බුද්ධ දර්ශනය පැහැදිලි කරලා දෙනවා.

පූර්ව භාග ප්‍රතිපදාව - සත්‍ය ඥාණය අවබෝධය
අපර භාග ප්‍රතිපදාව - ප්‍රායෝගිකව පුහුණුවන ආකාරය

පූර්ව භාග ප්‍රතිපදාවේදී සත්‍ය ඥාණය අවබෝධය, කල්‍යාණ මිත්‍රයාගේ මග පෙන්වීම සහ ශ්‍රාවකයාගේ උත්සාහය මත පවතිනවා. ඒ අනුව සිත හැදෙන හැටි අවබෝධ කරගන්නවා. සිත මායාවක් බව අවබෝධ කරගන්නවා සිත යනු අරමුණම බව දැනග න්නවා. අරමුණෙහි සත්‍ය දැනගත්තහම අරමුණෙහි රැ වටෙන්නේ නැහැ ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධ කරගත්තට පසු ආත්මය අරමුණම බව දැනග න්නවා. ඒ අනුව ත්‍රිවිද්‍යාව අවබෝධ කරගන්නවා. පුබ්බේනිවාසානුස්සති ඥානය, චුතූප්පාද ඥාණය, ආසවක්ඛයා ඥානය.

අපරභාග ප්‍රතිපදාව - කෘත්‍ය ඥානය. අසා දැනගත් ධර්මය තමා තුළින් දැකීම මෙහිදී සතර සතිපට්ඨානය වැඩෙනවා. අරමුණෙහි සත්‍ය දකිනවා. දර්ශනය තුළ සිත හැදෙන හැටි ප්‍රායෝගිකව අත්විඳිනවා. අරමුණෙහි සත්‍ය දැක මිදෙනවා. අරමුණ සත්‍යයක් නොවන බව ප්‍රායෝගිකව අත්විඳිනවා. ඒ අනුව ආත්මයක් නැති බව දැනගන්නවා. මේ අවස්ථාවේදී (විදර්ශනා) සමාධිය අත්විඳිනවා. ත්‍රිවිද්‍යාව ප්‍රායෝගික අත්විඳිනවා.

තමාගේ කෙලෙස් ක්ෂය වෙන දියවෙන ආකාරය නුවණින් අවබෝධ කරගන්නවා. නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ සත්වයෙක්, පුද්ගලයෙක්, දෙයක් නැති බව අවබෝධ කරගන්නවා. ශාන්ත සුවයට පත්වෙනවා.

තෙරුවන් සරණයි!

පූජ්‍ය තඹුත්තේගම සීලරතන ස්වාමීන් වහන්සේ




# බුද්ධෝත්පාද ආර්යන් වහන්සේ ප්‍රත්‍යක්ෂ ඥාණයෙන් ලොවට හෙළි කළ පරම සත්‍ය

(දෙදහස් පන්සිය වසරකට පසු කාලයේ වැළිතලාවට සැඟව ගිය පරම සත්‍ය ධර්මය නැවත අවදි විය.)

පළමුවන කොටස -
එකම අරමුණක ඇති ධර්මතාවයන්.

1. පටිච්ච සමුප්පාද ධර්මය එකම අරමුණෙහි දැකීම.
2. චතුරාර්ය සත්‍ය ධර්මය එකම අරමුණෙහි දැකීම.
3. ත්‍රිලක්ෂණය එකම අරමුණෙහි දැකීම.
4. තුන් භූමිය- ( කාම, රූප, අරූප ) එකම අරමුණෙහි දැකීම.
5. තිස්එක් ලෝක ධාතුව එකම අරමුණෙහි දැකීම.
6. ත්‍රිවිද්‍යාව - (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූඋප්පාද ඥාණය, ආසවක්ඛ්‍ය ඥාණය,) එකම අරමුණෙහි දැකීම.
7. භවය සකස්වීම එකම අරමුණෙහි දැකීම.
8. භව නිරෝධය - ඇතිවීම/ නැතිවීම එකම අරමුණෙහි දැකීම.
9. සත්තිස් බෝධිපාක්ෂික ධර්ම එකම අරමුණෙහි දැකීම.
10. නිවන - එක් ක්ෂණික සිතක ( අරමුණෙහි දැකීම ).
11. දස ඥාන එකම අරමුණෙහි දැකීම.

අරමුණෙහි සත්‍ය දැකීම යනු එක් සිතක සත්‍ය දැකීමයි.